කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

கைத்தொழில் மற்றும் தொழில் முயற்சியாண்மை அபிவிருத்தி அமைச்சு

**Ministry of Industry and Entrepreneurship Development**

# 2025

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

## வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

**කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය**

**වැය ශීර්ෂ අංකය : 149**

**මෙම වාර්තාව දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන්ට ද පරිවර්තනය කර ඇත.**

# පටුන


| | පිටුව |
|---|---|
| හැඳින්වීම | V |
| පරිච්ඡේදය 01 : ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය | 1 - 6 |
| පරිච්ඡේදය 02 : ප්‍රගතිය හා ඉදිරි දැක්ම | 7 - 66 |
| පරිච්ඡේදය 03 : වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය | 67 - 86 |
| පරිච්ඡේදය 04 : කාර්ය සාධන දර්ශකය | 87 - 90 |
| පරිච්ඡේදය 05 : තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය | 91 -94 |
| පරිච්ඡේදය 06 : මානව සම්පත් පැතිකඩ | 95 - 132 |
| පරිච්ඡේදය 07 : අනුකූලතා වාර්තාව | 133 - 142 |
| ඇමුණුම් | i |

# හැඳින්වීම

කර්මාන්ත අමාත්‍යාංශයේ **2025** වර්ෂය සඳහා වන වාර්ෂික කාර්ය සාධන වාර්තාව 2020.08.28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 මගින් දෙන ලද උපදෙස් අනුව පිළියෙල කර ඇත.

මෙම වාර්තාවේ පළමු පරිච්ඡේදය තුළින් අමාත්‍යාංශයේ ආයතනික පැතිකඩ සහ ක්‍රියාවට නැංවීමේ සාරාංශය දක්වා ඇත. ඒ අනුව අමාත්‍යාංශයේ දැක්ම, මෙහෙවර, අරමුණු, සංවිධාන ව්‍යුහය, අමාත්‍යාංශය යටතේ පවතින අංශයන් සහ අමාත්‍යාංශය යටතට අයත් වන සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, දෙපාර්තුමේන්තු සහ ව්‍යාපෘතිවලට අදාළ තොරතුරු සංක්ෂිප්තව ඇතුළත් කර ඇත.

අමාත්‍යාංශය යටතේ පවතින අංශ, සංස්ථා, ව්‍යවස්ථාපිත ආයතන, දෙපාර්තුමේන්තු සහ ව්‍යාපෘති මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන්වල ප්‍රගතිය සහ ඉදිරි සැලසුම් දෙවන පරිච්ඡේදය මගින් සවිස්තරාත්මකව දක්වා ඇත .

තුන්වන පරිච්ඡේදය මගින් අමාත්‍යාංශයේ **2025** වර්ෂයේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ද අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම මත පදනම් වූ කාර්ය සාධන දර්ශකයක් අනුව ළඟා කරගෙන ඇති ප්‍රගතිය හතර වන පරිච්ඡේදය තුළින් ද සංක්ෂිප්තව දක්වා ඇත.

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා අමාත්‍යාංශය දක්වන ලද දායකත්වය පිළිබඳ සංක්ෂිප්ත වාර්තාව පස්වන පරිච්ඡේදය මගින් දක්වා ඇත.

හයවන පරිච්ඡේදය මගින් අමාත්‍යාංශයේ මානව සම්පත් පැතිකඩ දක්වා ඇති අතර ඒ තුළින් අමාත්‍යාංශයේ සේවක සංඛ්‍යාව, ක්‍රියාත්මක කරන ලද මානව සම්පත් සංවර්ධන වැඩසටහන් පිළිබඳ තොරතුරු සංක්ෂිප්තව දක්වා ඇත.

ඉහත චක්‍රලේඛයේ දක්වා ඇති ආකෘති පත්‍රය පරිදි ලබා ගැනීමට අපේක්ෂිත වූ කාර්ය සාධනය පිළිබඳ වූ අනුකූලතා වාර්තාව හත්වන පරිච්ඡේදය මගින් දක්වා ඇත.

# පරිච්ඡේදය 01

## ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

## 1.1 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

### දැක්ම

"තිරසර සහ සැමට ප්‍රතිලාභ සැලසෙන වර්ධනයක් උදෙසා වන ගෝලීය තරඟකාරී ජාතික කර්මාන්ත පදනමක් ශ්‍රී ලංකාවේ ස්ථාපිත කිරීම"

### මෙහෙවර

"තාක්ෂණය, දැනුම සහ නවෝත්පාදන චින්තනය මත පදනම් වූ හිතකර පරිසරයක් නිර්මාණය තුලින් විවිධාංගීකරණය වූ, ඉහළ අගය එකතු කළ, නව්‍ය කාර්මික නිෂ්පාදන, පරිසර හිතකාමී ක්‍රමවේදයන් භාවිතය, ඉහළ වෙළෙඳපල ප්‍රවේශ අවස්ථා සහ සැමට ප්‍රතිලාභ ලැබෙන කර්මාන්ත සංවර්ධනයක් සඳහා දිරිගැන්වීම"

### අරමුණු

1. **2024** වසරේ **26.7%** ක් වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා කර්මාන්ත අංශයේ දායකත්වය **2030** වසර වන විට **28%** දක්වා වැඩි කිරීම.
2. **2024** වසරේ **16.4%** ක්වූ දළ දේශීය නිෂ්පාදිතය සඳහා නිෂ්පාදන කර්මාන්ත අංශයේ දායකත්වය **2030** වසර වන විට **20%** දක්වා වැඩි කිරීම.
3. **2023** වසරේ **3.2%** ක්වූ ජාතික ආර්ථිකයට ව්‍යවසායකත්ව දායකත්වය **2030** වසර වන විට **10%** දක්වා ඉහළ නැංවීම.
4. **2024** වසරේ ඇමරිකානු ඩොලර් බිලියන **12.7** ක් වූ කාර්මික (වෙළඳ භාණ්ඩ) අපනයන **2030** වසර වන විට ඇමරිකානු ඩොලර් බිලියන **28** දක්වා වැඩි කිරීම.
5. **2023** වසරේ **0.01%** ක්වූ කර්මාන්ත කටයුතු සඳහා වෙන් කල ඉඩම් ප්‍රමාණය **2030** වසර වන විට **1%** දක්වා වැඩි කිරීම. (ජාත්‍යන්තර සම්මතය **3%**).

## 1.2 ආයතනික ව්‍යුහය



## 1.2 ආයතනික ව්‍යුහය



## 1.3 අමාත්‍යාංශය යටතේ පවතින අංශ සහ ආයතන

### අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අංශ

1. ප්‍රතිපත්ති සංවර්ධන අංශය
2. කර්මාන්ත සංවර්ධන අංශය
3. ආංශික සංවර්ධන අංශය
   - 3.1 සංවර්ධන අංශ 1
   - 3.2 සංවර්ධන අංශ 2
   - 3.3 සංවර්ධන අංශ 3
4. කර්මාන්ත ලියාපදිංචි අංශය
5. ව්‍යාපෘති කළමනාකරණ ඒකකය
6. පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය
7. සාම්ප්‍රදායික කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ අංශය
8. ව්‍යවසායකත්ව සංවර්ධන අංශය
9. සැලසුම් අංශය
10. පාලන අංශය
11. ගිණුම් හා ප්‍රසම්පාදන අංශය
12. ඉංජිනේරු අංශය
13. අභ්‍යන්තර විගණන අංශය

### අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථා

1. පේෂකර්ම දෙපාර්තමේන්තුව (DTI)
2. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)
3. ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)
4. කහටගහ ග්‍රැෆයිට් ලංකා ලිමිටඩ් (KGLL)
5. ලංකා පිඟන් සංස්ථාව (ගඩොල් සහ උළු අංශය) (CCC)
6. ලංකා ඛනිජ වැලි සමාගම (LMSL)
7. සී/ස ජාතික කඩදාසි සමාගම (NPCL)
8. ලංකා ලේලන්ඩ් සමාගම (LLL)
9. සී/ ස ලංකා ෆොස්පේට් සමාගම (LPL)
10. ජාතික ලුණු සමාගම (NSL)
11. සී/ස ලංකා සිමෙන්ති සංස්ථාව (SLCC)
12. පරන්තන් කෙමිකල්ස් ලිමිටඩ් (PCCL)
13. සීමාසහිත බී.සී.සී ලංකා සමාගම (BCC)
14. ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)
15. ශ්‍රී ලංකා පේෂකර්ම සහ ඇඟළුම් ආයතනය (SLITA)
16. ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) (SLHB)
17. ජාතික ශිල්ප සභාව (NCC)
18. සීමාසහිත ලංකා සළුසල (LSL)
19. ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය (NGJA)
20. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)
21. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය
22. උක් පර්යේෂණ ආයතනය (SRI)
23. ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS)
24. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB)
25. කන්තලේ සීනි සමාගම (KSCL)
26. සීමාසහිත ලංකා සීනි (පුද්ගලික) සමාගම
27. ගල්ඔය වැවිලි (පුද්ගලික) සමාගම
28. භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය (GSMB)

# පරිච්ඡේදය 02

# ප්‍රගතිය හා ඉදිරි දැක්ම

## 2.1 ප්‍රතිපත්ති සංවර්ධන අංශය

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- ශ්‍රී ලංකාවේ කර්මාන්ත සංවර්ධනය සඳහා හිතකර පරිසරයක් සකස් කිරීම හා කර්මාන්ත ක්ෂේත්‍රය, කර්මාන්ත සංවර්ධනය 4.0 වන මට්ටම දක්වා ඔසවා තැබීමට අවශ්‍ය පහසුකම් සැලසීම යන පරමාර්ථ පෙරදැරි කරගනිමින් කර්මාන්ත සංවර්ධනය සඳහා වන ජාතික ප්‍රතිපත්තිය සකස්කර ඇත.

- මෙම කෙටුම්පත් ප්‍රතිපත්තිය ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔවුන්ගෙන් ලද නිරීක්ෂණ අනුව, ඉඩම් කළමනාකරණය කර්මාන්ත සංවර්ධනය සඳහා බලපාන ප්‍රධාන කාරණයක් බව අණාවරණය වූ අතර එය මෙම කෙටුම්පත් ප්‍රතිපත්තිය තුල ඇතුලත්ව නොතිබූ බැවින් එම කාරණය ඇතුලත් කල අතර මෙම ප්‍රතිපත්ති ලේඛනය වත්මන් රජයේ ප්‍රතිපත්ති සමඟ ඒකාත්මික කරමින් ඊට අදාළ සංශෝධනද සිදු කර ඇත.

- මෙම ජාතික ප්‍රතිපත්තියෙහි ක්‍රමෝපායික සැලැස්ම මේවන විටත් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ කාලය ඉකුත්වී ඇති බැවින් අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන හා අනෙකුත් සියලුම පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්වයෙන් නැවත සකස් කරමින් සිටින අතර එහි සංශෝධන කටයුතු අවසන් වූ විගස අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නියමිතය.

**ඉදිරි සැලසුම්**

**කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම**

- කාර්මික සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තියේ පස් අවුරුදු උපායමාර්ගික සැලැස්ම වත්මන් රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව අවශ්‍ය වෙනස්කම් සිදු කිරීමට අපේක්ෂා කෙරේ.

- කර්මාන්ත සංවර්ධනය සඳහා වූ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන සහ අනෙකුත් සියලුම කොටස්කරුවන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට අමාත්‍යාංශය බලාපොරොත්තු වේ.

## 2.2 කර්මාන්ත සංවර්ධන අංශය (IDD)

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- අමාත්‍යාංශය විසින් දිවයින පුරා දිස්ත්‍රික්ක 20ක විදුලිය, ජලය සහ මාර්ග වැනි යටිතල පහසුකම් සහිත අක්කර 1,093.82 ක ඉඩම් ප්‍රමාණයක් සංවර්ධනය කර කර්මාන්තපුර 35ක් ස්ථාපිත කර ඇත.

- නව කර්මාන්තපුර 06ක් ආරම්භ කිරීමට අදාළ සංවර්ධන කටයුතු ආරම්භ කිරීම.

- එම කර්මාන්තපුර 35හි යටිතල පහසුකම් සංවර්ධනය සඳහා රජය විසින් රු. මිලියන 5,666.56 පමණ වැය කර ඇති අතර ඊට අමතරව ඉහත සඳහන් කර්මාන්තපුරවල කර්මාන්තශාලා පිහිටුවීම සඳහා පෞද්ගලික අංශය විසින් රු. මිලියන 76,300.81 ආයෝජනය කර ඇත.

- කර්මාන්ත සංවර්ධන වැඩසටහන යටතේ 2025 වර්ෂය තුළ වාණිජ කටයුතු සිදු කරනු ලබන සක්‍රිය කර්මාන්ත සංඛ්‍යාව 432ක් වන අතර රැකියා අවස්ථා 24,451 ක් මේ මගින් බිහි කොට ඇත.

- මේ වසරේ දී කර්මාන්තපුරවල හිස් ඉඩම් සඳහා නව ආයෝජකයන්ගේ ව්‍යාපෘති 23ක් සඳහා ඉඩම් වෙන් කිරීම් සිදුකර ඇත.

- රෙදිපිළි නිෂ්පාදනය සඳහා විශේෂිත වූ එරාවූර් කර්මාන්ත කලාපයේ -
  අප ජලය මුහුදට බැහැර කිරීමේ ව්‍යාපෘතියේ කටයුතු 100% ක් නිම කර ඇත.
  විදුලි බලය ලබා දීමේ කටයුතු 100% ක් අවසන් කර ඇත.
  පිවිසුම් මාර්ග සංවර්ධන කටයුතු අදියර -1 = 100% හා අදියර-2 = 100% ක් නිම කර ඇත.
  ජල සැපයුම සඳහා ජලනල සවි කිරීම 100% අවසන් කර ඇත.
  භූගත ජල ටැංකිය ඉදිකිරීම 45% අවසන් කර ඇත.

- පවතින කර්මාන්තපුරයන් වන නාලන්ද, මාකඳුර (බටහිර), වැලිඔය, කළුතර, උලපනේ, උඩුකාව, කරන්දෙනිය සහ කොලොන්නාව යන කර්මාන්තපුරයන්හි ජලය, විදුලිය, මාර්ග සංවර්ධනය ආදී යටිතල පහසුකම් තවදුරටත් සංවර්ධනය කිරීම.

- නව කර්මාන්තපුර පිහිටු වීම සඳහා ඉඩම් වෙන් කරගෙන ඇති ඉංගිරිය, වාලච්චේනයි, පරන්තන්, රයිගම (අදියර II), අළුතැපොල, දඹුල්ල, රයිගම (අදියර I), කටුනායක යන කර්මාන්තපුරයන්හි ජලය, විදුලිය, මාර්ග සංවර්ධනය ආදී යටිතල පහසුකම් සංවර්ධනය කිරීම.

**අභියෝග**

- කර්මාන්තපුරවල යටිතල සහසුකම් සංවර්ධන කටයුතු සඳහා සම්බන්ධ වන රාජ්‍ය ආයතනවල ප්‍රමාද වීම්.
- කර්මාන්ත සඳහා සුදුසු ඉඩම් ලබාගැනීමට ඉතා අසීරු වීම.
- බොහෝ ආයෝජකයන් බස්නාහිර පළාතේ ඉඩම් ලබාගැනීමට වැඩි කැමැත්තක් දක්වන නමුත් බස්නාහිර පළාතේ කර්මාන්තපුර සඳහා සුදුසු ඉඩම් සොයාගැනීමට අපහසු වීම.
- අමුද්‍රව්‍ය සහ නිමි භාණ්ඩ කොළඹ සිට වෙනත් ප්‍රදේශවලට ප්‍රවාහනය කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදුවන නිසා වෙනත් ප්‍රදේශවලින් ඉඩම් ලබාගැනීමට ආයෝජකයන් කැමැත්තක් නොදැක්වීම

**ඉදිරි සැලසුම්**

- නව ආයෝජන අවස්ථා හඳුනා ගැනීම.
- හරිත කර්මාන්තකරණය සඳහා කර්මාන්තකරුවන් මෙහෙය වීම.
- පවතින කර්මාන්තපුරවල යටිතල පහසුකම් සංවර්ධනය කිරිම.
- සංවර්ධන කටයුතු ආරම්භ කර ඇති ඉංගිරිය, වාලච්චේනයි, පරන්තන්, රයිගම (අදියර II), කටුනායක, අළුතැපොල, දඹුල්ල, සඳමල්ගම යන නව කර්මාන්තපුර වල යටිතල පහසුකම් සංවර්ධනය කර අවසන් කිරීමට කටයුතු කිරීම.
- කර්මාන්තපුරවල කර්මාන්ත ස්ථාපිත කිරීම සඳහා අවම වශයෙන් නව ව්‍යාපෘති 30 සඳහා සුදුසු ඉඩම් ලබා දීම සඳහා කටයුතු සිදු කිරීම.
- අවම වශයෙන් ආයෝජකයන් 20ක් සඳහා නව කර්මාන්ත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දීම.
- 2027 වර්ෂයේදී පුලියන්කුලම සහ කඹුරුපිටිය ප්‍රදේශයන්හි නව කර්මාන්තපුර 02 ක් ස්ථාපනය කිරීමට කටයුතු ආරම්භ කිරීම.

## 2.3 ආංශික සංවර්ධන අංශ

### සංවර්ධන අංශ I

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- Profood / Propack ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනය-2025 විදේශීය කර්මාන්ත ප්‍රදර්ශකයින් 50 දෙනෙකු ඇතුළුව දේශීය හා විදේශීය කර්මාන්ත ප්‍රදර්ශකයින් සහභාගීත්වයෙන් ප්‍රදර්ශන කුටි 350කින් පමණ සමන්විත වන පරිදි ප්‍රදර්ශනය පවත්වන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කරුවන් 12 දෙනෙකු සඳහා සහන ගාස්තු යටතේ ප්‍රදර්ශන කුටි 10 කින් සමන්විත වූ විශේෂ ප්‍රදර්ශන මණ්ඩපයකින් ද අන්තර් ගත විය. නරඹන්නන් 25000 ක් පමණ සහභාගී විය. මෙම ප්‍රදර්ශනය මගින් විශ්වවිද්‍යාල වල නව නිෂ්පාදනය වාණිජකරණයට ද අවස්ථාව උදා විය.
- ලංකා ඇසුරුම් ප්‍රදර්ශනය (Lanka Pack Exhibition )-2025 දේශීය හා විදේශීය ප්‍රදර්ශන කුටි 160 කින් සමන්විතව හා නරඹන්නන් 6000 කගේ පමණ සහභාගීත්වයෙන් සාර්ථකව පවත්වන ලදී. ඇසුරුම්කරණයට අදාල යන්ත්‍ර සූත්‍ර ප්‍රදර්ශනය කිරීම ද සිදුවිය.
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර තත්ත්ව සහතිකකරණ වැඩසටහන ISO -9001, ISO-14001,ISO-22000,ISO-50001 ලබා ගනීම වෙනුවෙන් කර්මාන්තවලට පහසුකම් සැපයීම සිදුකරන ලදී. තෝරාගත් කර්මාන්ත 33 ක් සහතිකකරණ ක්‍රියාවලිය සාර්ථකව සම්පූර්ණ කරන ලදී.
- සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත සඳහා යහපත් නිෂ්පාදන පුරුදු (GMP) වැඩසටහන සඳහා කර්මාන්ත 27 ක් තෝරා ගන්නා ලද අතර ඉන් සහතිකකරණ ක්‍රියාවලිය සාර්ථකව නිම කල කර්මාන්ත සංඛ්‍යාව 09 ක් වේ.
- සැකසූ ආහාර නිෂ්පාදන, ඇසුරුම් නිෂ්පාදන, කිරි ආශ්‍රිත නිෂ්පාදන, කුළු බඩු ආශ්‍රිත නිෂ්පාදන සහ කොහු නිෂ්පාදන ආශ්‍රිත කර්මාන්ත වලට අදාලව බදු වල ව්‍යුහාත්මක ගැලපීම් කිරීමට අවශ්‍ය නිරීක්ෂණ ලබාදීම සිදුකර ඇත.
- දිට්වා සුළි කුණාටුව මගින් හානියට පත් කර්මාන්ත නැවත ආරම්භ කිරීමට අවශ්‍යය මූලික පසුබිම සකස් කිරීමට සහය වීම.

**අභියෝග**

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තරඟකාරීත්වයට මුහුණ දිය හැකි ගුණාත්මක භාවයෙන් යුතු සෞඛ්‍යාරක්ෂිත ආහාර නිෂ්පාදනයන් සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.
- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා ආහාර නිෂ්පාදනවල ගුණාත්මකභාවය උසස් කිරීම, රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීම තුළින් ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම.
- උසස් ගුණත්වයෙන් යුතු අගය එකතු කරන ලද දේශීය ඇසුරුම් නිෂ්පාදිත වලින් අනෙකුත් කර්මාන්ත නිෂ්පාදන සඳහා අවශ්‍ය ඇසුරුම් සහ අපනයන භාණ්ඩ සඳහා අවශ්‍ය ඇසුරුම් සපුරා ගැනීම.

- නිෂ්පාදනවල පිරිවැය අඩුකරගැනීමට පහසුකම් සැපයීම සහ අවශ්‍ය අමුද්‍රව්‍ය ලබාගැනීමේදී පවතින ගැටළු නිරාකරණය කිරීම.

**ඉදිරි සැලසුම්**

- සැකසූ ආහාර කර්මාන්තවල නිෂ්පාදන වල ගුණාත්මක තත්ත්වය ඉහළ නැංවීම.
- දේශීය අගය එකතු කළ ආහාර නිෂ්පාදන වල අපනයන වර්ධනය කිරීම.
- ඉහළ ගුණාත්මක තත්වයෙන් යුතු නිෂ්පාදන දේශීය හා විදේශීය වෙළඳපොළ සඳහා ඉදිරිපත් කිරීම.
- ඉහළ ගුණත්වයකින් සහ ධාරිතාවයකින් ඇසුරුම් නිෂ්පාදනය කිරීම සඳහා ඇසුරුම් කර්මාන්ත පෙළඹවීම.
- නිෂ්පාදන කර්මාන්ත අංශයන්ගේ ඵලදායිතාවය වැඩි කිරීම සහ සේවා නියුක්ත ශ්‍රමිකයන්ගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා දේශීය හා විදේශීය පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- වෙළඳපොළ තරඟකාරීත්වය සහ තිරසාරත්වය ඉහළ නැංවීම තුළින් ආදායම් හා රැකියා උත්පාදන හැකියාව ඉහළ යාම හා එම කර්මාන්තවල ඵලදායීතාව වැඩිදියුණු කිරීම සඳහා සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.
- දේශිය වශයෙන් ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම තුළින් දේශීය කර්මාන්ත සඳහා අවශ්‍ය නව තාක්ෂණය හඳුන්වාදීම සහ එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශිය වෙළඳපොළ සකස් කර ගැනීමට සහය විම.
- කර්මාන්තකරුවන් මුහුණ දෙන ගැටළු පිළිබඳ සාකච්ඡා කර එම ගැටළු විසඳා ගැනීම සඳහා උපදේශක කමිටු හා අදාල ආයතනවල උපදේශකත්වය ලබා ගැනීම.
- රේඛීය අමාත්‍යාංශ, මහා භාණ්ඩාගාරය, වෙළඳ මණ්ඩල, අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන අතර සම්බන්ධීකරණය සිදුකිරීම හා එමඟින් කර්මාන්ත සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම.
- දේශිය හා ජාත්‍යන්තර ප්‍රදර්ශන සංවිධානය කිරීම සඳහා අපනයන සංවර්ධන මණ්ඩලය හා එක්ව කටයුතු කර එම කර්මාන්ත සඳහා දේශීය හා විදේශීය වෙළඳපොළ සකස්කර ගැනීමට සහය වීම.
- කර්මාන්තකරුවන් තම සේවකයින්ගෙන් අපේක්ෂා කරන කුසලතා සහ සේවකයින් සතුව ඇති සැබෑ කුසලතා අතර විෂමතාවය (Skill Gap) අවම කිරීම සඳහා වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

## සංවර්ධන අංශ II

### ප්‍රගතිය/ ජයග්‍රහණ

- අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගෙහි ඉදිකිරීම් කටයුතු බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි මේ වන විට ආරම්භ කර ඇති අතර, එය 2026 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට අවසන් කිරීමට නියමිතය. මෙම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ වශයෙන්, බෝට්ටු නිෂ්පාදන අංශයේ අපනයන ආදායම ඉහල යාම, රැකියා අවස්ථා ඉහල යාම හා සංචාරක කර්මාන්තයේ වර්ධනයට මෙය ඉවහල් වීම දැක්විය හැකිය.

- මොරටුව ප්‍රදේශයේ සිටින දැව ආශ්‍රිත නිෂ්පාදන ශිල්පීන්ගේ, දැව සැකසුම් සම්බන්ධ අත්‍යවශ්‍ය තාක්ෂණික දැනුම වැඩි දියුණු කිරීම හා දැව සැකසුම් යන්ත්‍ර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රායෝගික කුසලතා වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින් මොරටුව ප්‍රදේශයේ සිටින දැව ආශ්‍රිත නිෂ්පාදන ශිල්පීන් 08 දෙනෙක් සඳහා NVQ 4 මට්ටමේ පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

- ජාත්‍යන්තර වෙළෙඳපොළට ප්‍රවේශ වන නව කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම, නව තාක්ෂණය ලබා ගන්නා කර්මාන්ත සංඛ්‍යාව ඉහල නැංවීම හා අපනයන සහ නාවික සංචාරක ව්‍යාපාරයෙන් විදේශ විනිමය ඉපැයීම් වැඩිදියුණු කිරීම අරමුණු කරගනිමින් බෝට්ටු නිෂ්පාදන කර්මාන්ත අංශය සඳහා වූ ජාත්‍යන්තර වෙළෙඳ ප්‍රදර්ශනයක් පැවැත්වීම සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීම (2025 වර්ෂයේ පැවැත්වීමට යෝජිතව තිබූ මෙය විවිධ හේතු මත 2026 වර්ෂයේ ජනවාරි මස පවත්වන ලදී).

### අභියෝග

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ තරඟකාරීත්වයට මුහුණ දියහැකි ගුණාත්මක භාවයෙන් යුතු නිෂ්පාදනයන් සඳහා දේශීය කර්මාන්ත ප්‍රවර්ධනය කිරීම.

- අඩු මිල සහිත බාල තත්වයේ භාණ්ඩ දේශීය වෙළෙඳපොලට පැමිනීම පාලනය කිරීම හා එමගින් කර්මාන්ත ආයතන වලට මුහුණ දීමට සිදු වී ඇති බලපෑම අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

- දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළ සඳහා දේශීය නිෂ්පාදනවල ගුණාත්මකභාවය උසස් කිරීම, රසායනාගාර පරීක්ෂණ පහසුකම් සැපයීම තුළින් ව්‍යවසායකයන් ප්‍රවර්ධනය කිරීම.

- රට තුළ වර්තමානයේ පවතින අයහපත් ආර්ථික තත්ත්වය, නව බදු ප්‍රතිපත්තීන් හා බලශක්ති පිරිවැය ඉහළ යාම නිසා කර්මාන්ත ආයතනවලට මුහුණ දීමට සිදු වී ඇති බලපෑම අවම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

**ඉදිරි සැලසුම්**

- කර්මාන්තයන්හි ද්‍රව්‍ය අපතේ යාම්, බලශක්ති අපතේ යාම් හා ජලය අපතේ යාම් අවම කරගනිමින් සම්පත් උපරිම කාර්යක්ෂමතාවකින් යුතුව ව්‍යාපාර කටයුතු සඳහා යොදා ගැනීමට අවශ්‍ය සහාය ලබා දීම සඳහා වූ වැඩසටහන් ජාතික පිවිතුරු නිෂ්පාදන මධ්‍යස්ථානය (NCPC) හා එක්ව ඉදිරි වසරවල දී ද ක්‍රියාත්මක කිරීම.

- විදේශීය වෙළෙඳපොලවල් කරා පිවිසීමට අවශ්‍ය ජාත්‍යන්තරව පිළිගත් ප්‍රමිති සහතික/තත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා දේශීය කර්මාන්තකරුවන් උනන්දු කිරීම පිණිස එම ප්‍රමිති සහතික/ තත්ව පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

- බේරුවල ධීවර වරාය ආශ්‍රිත භූමියෙහි මේ වන විට ඉදිකරමින් පවතින, අළුතින් නිෂ්පාදනය කරනු ලබන බෝට්ටු දියත් කිරීමට අවශ්‍ය පහසුකම් සහිත බෝට්ටු දියත් මගෙහි ඉදිකිරීම් කටයුතු 2026 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට අවසන් කිරීම.

- ශ්‍රී ලංකාව තුළ අපනයනය සඳහා මෝටර් රථ ඉලෙක්ට්‍රොනික උපකරණ සහ චිප් නිෂ්පාදනයේ විභවයන් හඳුනා ගනිමින් රටතුල එම කර්මාන්තය දියුණු කිරීමට අවශ්‍ය ප්‍රතිපත්ති තීරණ සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

## සංවර්ධන අංශ III

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- 2007 වර්ෂයේ සිට පවත්වන සම් හා පාවහන් ප්‍රදර්ශනය 2025 වර්ෂයේ පෙබරවාරි මස 6 සිට 9 දක්වා බණ්ඩාරණායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ දී පවත්වන ලදී. මේ සඳහා දේශීය හා විදේශීය පාවහන් හා පාවහන් ආශ්‍රිත නිෂ්පාදකයින්ගේ වෙළඳකුටි 262 ක් සංවිධානය කෙරිණි.

- රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා Human Repeat Insult Patch පරීක්ෂණ පැවැත්වීමට පරීක්ෂණාගාරයක් කොළඹ විශ්වවිද්‍යාලයේ ජෛව රසායන, අණුක ජෛව රසායන හා ජීව විද්‍යා තාක්ෂණ ආයතනයේ ස්ථාපිත කිරීමට රු.මි. 10.28 ක ප්‍රතිපාදන වෙන් කර ඇති අතර 2025 වර්ෂය තුළදී එම අවබෝධතා ගිවිසුම අත්සන් කිරීම සහ රසායනාගාරය ඉදි කිරීම ආරම්භ කිරීම සිදු කරන ලදී.

- කර්මාන්තකරුවන්ගේ කාර්ය සාධන විශිෂ්ඨත්වය ඇගයීම වෙනුවෙන් අමාත්‍යාංශයේ සහයෝගීතාවය සහිතව CNCI Achievers Awards 2025,2025.10.23 දින පවත්වන ලදී.

- නිෂ්පාදන කර්මාන්ත සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්ම (ආපදා කලමනාකරණ වැඩසටහන) ආපදා කලමනාකරණ මධ්‍යස්ථානයේ සම්පත්දායකත්වය සහිතව 2025.07.25 දින කර්මාන්තකරුවන් 40 පමණ සහභාගීත්වයෙන් පශ්චාත් උපාධි කලමණාකරණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලදී.

**ඉදිරි සැලසුම්**

- 2007 සිට වාර්ෂිකව පවත්වනු ලබන පාවහන් සහ සම්භාණ්ඩ අලෙවි ප්‍රදර්ශනය 2026 වර්ෂයේ දී පැවැත්වීම සඳහා කර්මාන්ත අමාත්‍යාංශයේ ඒකාබද්ධ සහයෝගීතාවය දැක්වීමට නියමිතය.

- වාර්ෂිකව පවත්වනු ලබන CNCI Achievers Award සඳහා 2026 වර්ෂයේ ඒකාබද්ධ සහයෝගීතාවය දැක්වීමට නියමිතය.

- ව්‍යාපාර අඛණ්ඩ කළමණාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන (ආපදා කලමණාකරණ වැඩසටහන) කර්මාන්තකරුවන් වෙනුවෙන් පැවැත්වීමට නියමිතය.

- කොළඹ විශ්වවිද්‍යාලයේ රූපලාවන්‍ය නිෂ්පාදන සඳහා human repeat insult patch පරීක්ෂණ පැවැත්වීමේ රසායනාගාර පහසුකම ස්ථාපිත කිරීම වර්ෂ 3කින් අවසන් කිරීමට නියමිත බැවින් එහි ඉදිරි කටයුතු 2026 වර්ෂයේ දීත් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

## 2.4 කර්මාන්ත ලියාපදිංචි අංශය

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- කර්මාන්ත අමාත්‍යාංශය යටතේ 2025 දෙසැම්බර් 31 දක්වා නිෂ්පාදන කර්මාන්ත 4107ක් ලියාපදිංචි කර ඇත.

- මැනුවල් ක්‍රමය ඔන්ලයින් පද්ධතියක් බවට පත් කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන ඇත. එහි ප්‍රසම්පාදන ක්‍රියාවලිය අවසන් කර ඇති අතර Science Land Information Technology (Pvt) Ltd සඳහා කොන්ත්‍රාත්තුව ලබා දී ඇත. පද්ධතිය සංවර්ධනය වෙමින් පවතී.

- 1990 අංක 46 දරණ කර්මාන්ත ප්‍රවර්ධන පනත සංශෝධනය කර කර්මාන්ත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂමව හා කඩිනමින් ක්‍රියාත්මක කිරීමට අවශය පියවර ගැනීමට සැළසුම් කොට ඇත.

**අභියෝග**

- නියාමන පද්ධතියක් නොමැතිකම හේතුවෙන් රට තුළ ක්‍රියාත්මක වන බොහෝ කර්මාන්ත මෙම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි වී නොමැත. ප්‍රධාන ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සඳහා මෙය ගැටළුවක් විය හැකිය.

- අමාත්‍යාංශය තුළ කර්මාන්ත ලියාපදිංචිය ලබා ගැනීම සඳහා කර්මාන්තකරුවන්ට පහසුකම් සැලසීම හෝ ඔවුන් දැනුවත් කිරීම අවශ්‍ය වේ.නැතහොත් ශක්තිමත් දත්ත ගබඩාවක් පවත්වාගෙන යාම ගැටලුවක් විය හැකිය.

- කර්මාන්තකරුවන්ට පහසුකම් සපයන රාජ්‍ය හා රාජ්‍ය නොවන සියලු ආයතන හා සම්බන්ධීකරණය කරමින් කර්මාන්ත ව්‍යවසායකයන් ලියාපදිංචි කිරීමේ සහතිකය හෙවත් බලපත්‍රය සියලු ආයතනයන්ට අත්‍යාවශ්‍ය නොකිරීම හේතුවෙන් ලියාපදිංචි වීම අවම අගයක් ගෙන ඇත.

**ඉදිරි සැලසුම්**

- අමාත්‍යාංශයේ සමස්ත කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා මාර්ගගත ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහ සමාජ මාධ්‍ය හරහා කර්මාන්ත ලියාපදිංචිය ප්‍රවර්ධනය කිරීම.
- මාර්ගගත කර්මාන්ත ලියාපදිංචි කිරීමේ පද්ධතියේ කාර්යක්ෂමතාව සහ පරිශීලක අත්දැකීම් වැඩි දියුණු කිරීම.
- ප්‍රාදේශීය සහ මධ්‍යම කාර්යාල අතර වඩා හොඳ සම්බන්ධීකරණයක් හරහා සැකසීමේ සහ අනුමත කිරීමේ ප්‍රමාදයන් අවම කිරීම.
- වැඩිදියුණු කළ තීරණ ගැනීම සඳහා දත්ත කළමනාකරණය සහ අධීක්ෂණය ශක්තිමත් කිරීම.
- ලියාපදිංචි අවශ්‍යතා සමඟ අනුකූල වීම වැඩි දියුණු කිරීම සඳහා පාර්ශවකරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

## 2.5 ව්‍යාපෘති කළමනාකරණ ඒකකය

කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ඇති ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ණය යෝජනා ක්‍රම දෙකක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි.

1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III (චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය)
2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II

**1. කුඩා හා සුළු පරිමාණ කර්මාන්තයන්හි නායකත්ව සහ ව්‍යවසායකයින් වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය III - චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය (SMILE III-Revolving Funds)**

SMILE III චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මගින් නව ව්‍යාපාර ආරම්භ කිරීම හෝ පවතින ව්‍යාපාරවල ඵලදායීතාවය වර්ධනය කිරීම හෝ එකී ආයතනවල ක්‍රියාකාරිත්වය සහ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වර්ධනය කිරීම සඳහා අඩු පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් සපයනු ලැබේ. එසේම සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල ආයතන ධාරිතාවය සහ නිෂ්පාදනවල වර්ධනයක් ඇති කිරීමටත් මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාදෙනු ලැබේ.

මුදල් අමාත්‍යාංශයේ එකඟතාවය මත 2012 මැයි මස 01 වන දින සිට කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ණය යෝජනා ක්‍රමය පහත සඳහන් අරමුණු යටතේ ක්‍රියාත්මක කිරීම ආරම්භ කර ඇත.

- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල මූල්‍ය කටයුතුවලට සහයෝගය දක්වමින් නව ව්‍යාපාර ආරම්භ කිරීමට හෝ පවතින ව්‍යාපාර ව්‍යාප්ත කිරීමෙන් එකී ව්‍යාපාර ආර්ථිකමය හා මූල්‍යමය වශයෙන් ශක්තිමත් ව්‍යාපෘතීන් බවට පත් කිරීම.
- කුඩා හා සුළු පරිමාණ ව්‍යාපාරවල කළමනාකරණ හැකියාවන්, ගිණුම්කරණ සහ තාක්ෂණික හැකියාවන් වර්ධනය කිරීම.
- අන්තර් මූල්‍ය ආයතනවල මූල්‍ය හැකියාවන් ශක්තිමත් කිරීම.

මෙම ව්‍යාපෘතිය යටතේ සහභාගිත්ව ණය දෙන ආයතන 10ක් හරහා ණය ලබා දෙනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, සණස සංවර්ධන බැංකුව සහ ඩී එෆ් සි සී බැංකුව වේ.

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතීන් 298ක් සඳහා රුපියල් මිලියන 2,045ක් මුදා හරින ලදී.

- 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රුපියල් මිලියන 4000
- වියදම - රුපියල් මිලියන 2,045

**2. පරිසර හිතකාමී චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය II (E-Friend II)**

කාර්මික නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් සිදුවන පරිසර දූෂණය සහ අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය සහ සුරැකීම, පරිසර දූෂණය පාලනය සහ අවම කිරීම වැනි කටයුතු සඳහා මෙම ණය යෝජනා ක්‍රමය යටතේ ව්‍යවසායකයින්ට සහන පොළී අනුපාතයක් යටතේ ණය මුදල් නිකුත් කරනු ලැබේ, එමෙන්ම ජාතික පරිසර පනතේ දැක්වෙන ප්‍රමිතීන්ට අනුකූලවීම සඳහා අවශ්‍ය මූලික ක්‍රමෝපායන් ආරම්භ කිරීම සඳහා ද මෙම ණය යෝජනා ක්‍රමය මූල්‍ය සහාය ලබා දෙනු ලැබේ.

මෙම ව්‍යාපෘතිය සහභාගිත්ව ණය දෙන ආයතන 11ක් හරහා ක්‍රියාත්මක කරනු ලැබේ. එනම් ලංකා බැංකුව, මහජන බැංකුව, ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව, සෙලාන් බැංකුව, ජාතික සංවර්ධන බැංකුව, සම්පත් බැංකුව, ඩී එෆ් සි සී බැංකුව, ලංකා ඔරික්ස් ලීසිං සමාගම සහ පීපල්ස් ලීසිං සමාගම වේ.

මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ එකඟතාවය මත 2018 වර්ෂයේ සිට මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ.

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

සමාලෝචනයට භාජනය වන කාලසීමාවේ දී උප ව්‍යාපෘතින් 51ක් සඳහා රුපියල් මිලියන 498ක් මුදා හරින ලදී.

- 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන - රුපියල් මිලියන 1,500
- වියදම - රුපියල් මිලියන 498

**අභියෝග**

- මෙම ණය යෝජනා ක්‍රම දෙකට සමගාමීව **කුඩා හා සුළු පරිමාණ කර්මාන්තකරුවන්ට සහන සැලසීම අරමුණ ඇතිව** රජය මගින් විවිධ සහනදායි ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක වීම.
- නවීන තාක්ෂණය සමඟ යාවත්කාලීන නොවීම.

**ඉදිරි සැලසුම්**

- අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙන් නිකුත් කරණ ලද අංක : අමප/25/2335/804/285 හා 2025.12.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ණය වැඩසටහන් එක් රාමුවක් යටතට ඒකාබද්ධ කිරීම සහ ආපදා තත්ත්වයෙන් පීඩාවට පත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය නැවත නගා සිටුවීම යටතේ ඉහත සඳහන් ණය යෝජනා ක්‍රමයන් දෙකම 2026 වර්ෂයේ ජනවාරි මස සිට මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කටයුතු යොදා ඇත.

## 2.6 පොදු ව්‍යාපාර හා ප්‍රතිව්‍යුහගතකරණ අංශය

**පොදු ව්‍යාපාර අංශය**

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- **තරුණ ව්‍යවසායකයින් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන (4 i - ව්‍යාපෘතිය )**
  - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය හා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය ඒකාබද්ධව ක්‍රියාත්මක කරණු ලබන තරුණ ව්‍යවසායකයින් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනෙහි 2025 වර්ෂයේ දිස්ත්‍රික්ක 17 (**කොළඹ/ ගම්පහ/ කළුතර/ ගාල්ල / මාතර / කුරුණෑගල / මහනුවර/ මාතලේ / කෑගල්ල/ රත්නපුර/ බදුල්ල/ මොණරාගල/ අනුරාධපුරය/ පොළොන්නරුව/ වවුනියාව /යාපනය / මඩකලපුව)** ආවරණය කරමින් ව්‍යවසායකයින් 504 ක් තෝරා ගන්නා ලදී.

- මෙම තෝරා ගන්නා ලද ව්‍යවසායකයින් සඳහා සමාරම්භක උත්සවය 2025.10.22 දින කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ ගරු. අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සහ අමාත්‍යාංශයේ නිලධාරීන්ගේ හා මෙම ව්‍යාපෘතියේ අදියර 1 සඳහා තෝරා ගන්නා ලද ව්‍යවසකයින්ගේ ද සහභාගීත්වයෙන් පවත්වන ලද අතර මෙම තරුණ ව්‍යවසායකයින් සංවර්ධනය කර අපනයන වෙළඳපොළ දක්වා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය කටයුතු මෙම අමාත්‍යාංශය හා ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය හා එක්ව සිදු කරමින් පවතී.

- ලංකා පිඟන් සංස්ථාවේ එරගම, මහියංගනය, උස්වැව සහ ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ පවත්වාගෙන යාම.

- 2025 මැයි මස 26 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ තීරණයට අනුව ලංකා පිඟන් සංස්ථාවේ එරගම, මහියංගනය, උස්වැව සහ ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ පවත්වාගෙන යාම සඳහා ප්‍රතිපත්තිමය අනුමැතිය ලැබී ඇති අතර සුදුසු රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්ව මාදිලිය හඳුනා ගැනිම සඳහා කමිටුවක් පත් කර ගැනීම සිදු කර ඇත.

- එක් එක් කර්මාන්තශාලා පිහිටි ප්‍රදේශයන්හි මැටි නිධි පිළිබඳ සමීක්ෂණයක් සිදු කිරීමට භූ විද්‍යා හා පතල් කාර්යාංශය සමඟ අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී.

- මෙම කර්මාන්තශාලාවල වත්කම් වටිනාකම් තක්සේරු කිරීමකින් අනතුරුව විධිමත් පරිදි අදාල පාර්ශවයන් වෙත පවරා දීමට සහ දැනට සේවයේ නියුතු සේවකයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ අරමුණින් සහ එම සේවකයින්ට අගතියක් නොවන පරිදි මහා භාණ්ඩාගාරයේ ද එකඟතාව ඇතිව නව හවුල්කාරීත්ව සමාගමට ඔවුන්ගේ කැමැත්ත මත අනුයුක්ත කිරීම හෝ සුදුසු විශ්‍රාම ගැන්වීමේ ක්‍රමයක් යෝජනා කිරීම සඳහා අදාළ කැබිනට් මණ්ඩල සංදේශයක් යොමු කර ඇත.

- ලංකා පිඟන් සංස්ථාවට අයත් බංගදෙනිය, යටියන , වැඋඩ සහ ඇලයාපත්තුව කර්මාන්තශාලා පිහිටි ඉඩම් මෙම අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ කර්මාන්තපුර ස්ථාපිත කිරීම සහ බිංගිරිය කර්මාන්තශාලාව රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් 2025.12.31 දින යොමු කර ඇත.

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් 2026 ජූනි මස කොළඹ දී පැවැත්වීමට නියමිත “ලංකා EXPO 2026" ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයට අදාළව මෙහෙයුම් කමිටුවක් පත් කර මාසිකව කමිටු රැස්වීම් පැවැත්වීම හා ප්‍රගතිය විමසා බැලීම.

**අභියෝග**

- ඛනිජ සම්පත් සංචිත පිළිබඳ එක්රැස් කරන ලද දත්ත නොමැති කම.
- රජයේ ඉඩම් වල ඇති අනවසර ඉදිකිරීම් හා පදිංචිකරුවන් නිසා සංවර්ධන කටයුතු වලට බාධා පැමිණීම.
- රජයේ කර්මාන්ශාලා තාක්ෂණයේ දියුණුව සමඟ යාවත්කාලීන නොවීම.

**ඉදිරි සැලසුම්**

- ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය විසින් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ මඟ පෙන්වීම අනුව අනෙකුත් රාජ්‍ය අමාත්‍යාංශ හා ඒ යටතේ වන ආයතනවල පූර්ණ අනුග්‍රහය සහ සහයෝගීතාව මත " ශ්‍රී ලංකා EXPO 2026" නමින් ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයක් 2026 ජුනි මස 18,19, 20, සහ 21 යන දිනයන්හි දී සිරිමාවෝ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ' (BMICH) දී පැවැත්වීමට සැලසුම් කර ඇත.

- තරුණ ව්‍යවසායකයින් 1000 ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන (4 i - ව්‍යාපෘතිය) සියලුම දිස්ත්‍රික්ක ආවරණය කරමින් 2026 වර්ෂයේ දී සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී.

- ලංකා පිඟන් සංස්ථාවේ එරගම, මහියංගනය, උස්වැව, බිංගිරිය සහ ඔඩ්ඩුසුඩාන් කර්මාන්තශාලා රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය යටතේ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කිරීම.

- ලංකා පිඟන් සංස්ථාවට අයත් බංගදෙනිය, යටියන , වැඋඩ සහ ඇලයාපත්තුව කර්මාන්තශාලා පිහිටි ඉඩම් මෙම අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ කර්මාන්තපුර ස්ථාපිත කිරීම සඳහා අදාළ අංශ වෙත ලබා දීම.

## ප්‍රතිව්‍යුහගතකරණ අංශය

### ප්‍රගතිය/ ජයග්‍රහණ

- **ලංකා පොස්පේට් සමාගම විසින් කැනීම් කරනු ලබන රොක් පොස්පේට් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතියක් රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීම**

i. ව්‍යාපෘතියට අදාලව ඉදිරිපත් කරන ලද 2024.12.06 දිනැති ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අංක අමප/24/2160/810/004 හා 2024.12.18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණය ලැබී ඇත.

ii. එම ව්‍යාපෘතියට අදාලව ඉදිරිපත් කරන ලද 2025.03.19 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අංක අමප/25/0476/810/013 හා 2025.04.07 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් ගරු නීතිපතිතුමාගේ උපදෙස් ලබා ගන්නා ලෙසට නියම කර ඇත. ඒ අනුව නිතිපති අවසරය ලබාගෙන ඇත.

iii. ව්‍යාපෘතියට අදාලව ඉදිරිපත් කරන ලද 2025.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අංක අමප/ 25/1305/810/013 – I හා 2025.08.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙන් අභිලාෂ කැඳවා ඉදිරි කටයුතු සිදු කිරීමට අනුමැතිය ලැබී ඇත.

iv. ඒ අනුව 2025.08.17 දින ව්‍යාපෘතිය සඳහා අභිලාෂ කැඳවීමට (EOI) කටයුතු කරන ලදි.

v. ඒ අනුව නියමිත කාලය තුළ දෙස් විදෙස් ආයතන 14ක් මඟින් අභිලාෂ ඉදිරිපත් කර තිබුණු අතර එම අභිලාෂ ඇගයීම් කිරීම් කටයුතු මේ වන විට අවසන් කර ඇත.

vi. ව්‍යාපෘති යෝජනා කැඳවීම (RFP) සඳහා ලියකියවිලි සකස් කිරීම ආරම්භ කර ඇත.

- **රජයට අයත් වාණිජමය නොවන ආයතන සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම**

  රජයට අයත් වාණිජමය නොවන ආයතන සමාලෝචනය පිළිබඳ අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීමට අදාලව මෙම අමාත්‍යාංශය යටතේ පවතින පහත සඳහන් ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා නිලධාරි කමිටු පත්කර ක්‍රියාකාරී සැලසුම් සකස් කර, ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරමින් පවතින අතර එහි ප්‍රගතිය නියමිත කාලය තුළ අග්‍රාමාත්‍ය කාර්යාලයට වාර්තා කර ඇත.

1. ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය උපාධි පිරිනමන ආයතනයක් මට්ටමට ගෙන ඒම සහ භාණ්ඩාගාරයේ යැපීමකින් තොරව ස්වාධීනව පවත්වාගෙන යාම සඳහා උපායමාර්ගික සැලැස්මක් ක්‍රියාත්මක කිරීම
   - උපාය මාර්ගික සැලැස්ම සකස් කිරීම සඳහා ප්‍රධාන කමිටුව ඇතුලත්ව කමිටු 6ක් පත්කර ඇත.
   - ඉහත සඳහන් කමිටු රැස්වීම් වෙන වෙනම පවත්වන අතර එම කමිටු විසින් ලබා දෙන කමිටු වාර්තා මගින් අවසාන වාර්තාව සකස් කර උපායමාර්ගික සැලැස්ම කෙටුම්පත් කරමින් පවතී.

2. ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය, අමාත්‍යාංශයේ කුඩා ව්‍යවසාය සංවර්ධන අංශයෙහි විෂය පථය සහ ඉටු කෙරෙන කාර්යයන් සම්බන්ධයෙන් සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කර ඒවා ඒකාබද්ධ කර වඩාත් බලාත්මක තනි ආයතනයක් වශයෙන් ස්ථාපනය කිරීම.
   - ආයතන ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය හා ආයතනික ව්‍යුහය සම්බන්ධයෙන් වන සංකල්ප පත්‍රිකාව සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත.
   - ආසියානු සංවර්ධන බැංකුව වෙතින් තාක්ෂණික සහය ලබා ගනිමින් පවතින අතර, මානව සම්පත්, ඩිජිටල් පරිවර්තන, නීති හා මූල්‍ය යන ක්ෂේත්‍ර සඳහා උපදේශකවරුන් සිව් දෙනෙකු බඳවා ගැනීම සඳහා මූල්‍ය සහය ලබා දීම හා අදාල බඳවා ගැනීම් සිදු කිරීම සඳහා එම ආයතනය කටයුතු සිදු කරමින් පවතී.

3. ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) මඟින් සිදු කරනු ලබන කාර්යය එකම අරමුණක් කෙරෙහි ඉලක්කගතව ඇති බැවින් එම සියලුම කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටු කල හැකි එක් ආයතනයක් බවට පත් කිරීම.
   - කෙටුම්පත් කරන ලද නව පනත් කෙටුම්පත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.
   - ඒකාබද්ධ කිරීමේ වාර්තාවේ දළ කෙටුම්පත ප්‍රධාන කමිටුවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ලද අදහස් හා යෝජනා අනුව කමිටු වාර්තාව සංශෝධනය කිරීමට කටයුතු කරමින් පවතී.

4. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය, ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ පර්යේෂණ අංශය වශයෙන් ස්ථාපනය කිරීමට අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණය සිදු කිරීම.
   - ඒකාබද්ධ කිරීමේ වාර්තාව සකස් කරමින් පවතින අතර 2026/01/31 වන දින වන විට එය අවසන් කිරීමට නියමිතය.

5. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 2030 වන විට මෙරට අපනයන ආදායම ඇ.ඩො. බිලියන 45 ක මට්ටමට ගෙන ඒමට සැලසුම් කර ඇති අතර, එම ඉලක්කයන් ඇ.ඩො. බිලියන 28ක් වෙළෙඳ භාණ්ඩ අපනයනය තුළින් සපුරා ගැනීමට අවශ්‍ය උපායමාර්ගික සැලසුම් සකස් කර ඇති බැවින් ඒ සඳහා අවශ්‍ය ආයතනික ප්‍රතිසංවිධානය සිදු කිරීම.
    - ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සම්පූර්ණ කර අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව සංශෝධිත ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම සකස් කිරීමට නියමිතය.

6. කහටගහ පතලෙහි පවතින මිනිරන් සංචිතය සමීක්ෂණ කටයුතු, මිනිරන් කැනීම් හා සැකසුම් කටයුතු ද ඇතුළුව මිනිරන් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අභිලාෂය පළ කිරීමේ යෝජනා (Expression of Interests – EOI) කැඳවීම සඳහා පුවත්පත් දැන්වීම පළ කර ඇත.

7. පරන්තන්හි කෝස්ටික් සෝඩා/ක්ලෝරීන් (Caustic soda/Chlorine) ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවාව ලබා ගැනීමට Expression of Interest (EOI) කැඳවා අවසන් කර ඇති අතර RFP ගෙන්වා ගැනීමේ ක්‍රියාවලිය ක්‍රියාත්මකව ඇත.

8. කුරුන්වතිවු (අලිමංකඩ - උතුර) ලුණු ලේවාය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ නැවත ආරම්භ කිරීමට EOI කැඳවා ක්ෂේත්‍ර චාරිකාව හා ආයෝජකයින් සමග හමුව පවත්වා ඇත. විමසීම් සඳහා පිළිතුරු සපයමින් පවතී.

9. ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් මඟින් කැණීම් කරනු ලබන ඛනිජ වැලි සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා ව්‍යාපෘති කමිටුව පත් කිරීමේ කටයුතු ඉටු කරමින් පවතී.

- **දේශීය සීනි කර්මාන්තය නඟා සිටුවීම**

i. දේශීය සීනි කර්මාන්තය නඟා සිටු වීමට අදාලව අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද නිලධාරි කමිටුව සකස් කරන ලද නිර්දේශ සහිත වාර්තාව 2025.06.04 දිනැතිව අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

ii. දේශීය සීනි කර්මාන්තයේ පවතින ගැටළු පිලිබඳව ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුව වෙත නිරීක්ෂණ හා නිර්දේශ ඇතුලත් වාර්තා යොමු කිරීමට කටයුතු කර ඇත.

**අභියෝග**

- ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය තාක්ෂණ කුසලතාවන් සලසා ගැනීම
- ආනයනික සීනි හා දේශියව නිෂ්පාදනය කරනු ලබන සීනි සඳහා පනවා ඇති බදු විෂමතාවය.

**ඉදිරි සැලසුම්**

- ලංකා පොස්පේට් සමාගම විසින් කැණීම් කරනු ලබන රොක් පොස්පේට් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය- පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ ක්‍රියාත්මක කිරීමට අදාලව යෝජනා කැඳවීමට (RFP) කටයුතු කර, සුදුසු ආයෝජකයෙකු තෝරා ගැනීම

- අමාත්‍යාංශය යටතේ ඇති හඳුනාගත් ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ කටයුතු සිදු කිරීම.

- සී/ස ලංකා සීනි සමාගමේ පැල්වත්ත පරිශ්‍රයේ තෝරාගත් ස්ථාන සංචාරක ආකර්ශනයක් සහිත ස්ථාන බවට සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය, රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ සිදු කිරීමට අදාලව අභිලාෂ කැඳවීම.

- පහත සඳහන් ව්‍යාපෘති සඳහා 2026 වර්ෂය තුල දී ආයෝජකයින් තෝරා ගැනීමට නියමිතය.

  1. කුරුන්වතිවු (අලිමංකඩ - උතුර) ලුණු ලේවාය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්ව ක්‍රමය යටතේ නැවත ආරම්භ කිරීම.
  2. කහටගහ පතලෙහි පවතින මිනිරන් සංචිතය සමීක්ෂණ කටයුතු, මිනිරන් කැනීම් හා සැකසුම් කටයුතු ද ඇතුළුව මිනිරන් සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය සඳහා අභිලාෂය පළ කිරීමේ යෝජනා (Expression of Interests – EOI) කැඳවීම.
  3. ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ් මඟින් කැණීම් කරනු ලබන ඛනිජ වැලි සඳහා අගය එකතු කිරීමේ ව්‍යාපෘතිය රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරීත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට EOI කැඳවීම.

- එසේම පරන්තන්හි කෝස්ටික් සෝඩා/ ක්ලෝරීන් (Caustic soda/Chlorine) ව්‍යාපෘතිය සඳහා 2027 වර්ෂයේ දී සුදුසු ආයෝජකයකු තෝරා ගැනීමට සැලසුම් කර ඇත.

- ජාතික ඛනිජ ප්‍රතිපත්තිය සකසා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන එම ප්‍රතිපත්තිය පාර්ලිමේන්තුවේ සභාගත කිරීමටත් ඊට සමගාමීව ඛනිජ ද්‍රව්‍ය සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී භාවිතා කළ යුතු සම්මත මෙහෙයුම් පටිපාටි (Standard Operating Procedure – SOP) සකස් කර ඊට අදාල අනුමැතීන් ලබා ගැනීමටත් නියමිතය.

- 2009 අංක 66 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධිත) පනතින් සංශෝධනය කරන ලද 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත සංශෝධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන එම පනතට අවශ්‍ය කාලීන සංශෝධන සිදුකිරීමට සැලසුම් කර ඇත.

## 2.7 සාම්ප්‍රදායික කර්මාන්ත, මැණික් හා ස්වර්ණාභරණ අංශය

**සාම්ප්‍රදායික කර්මාන්ත අංශය**

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

අත්යන්ත්‍ර හා රෙදිපිළි කර්මාන්ත ප්‍රවර්ධනය - රු.මි. 20 - 2025

**01. බතික් සහ අත්යන්ත්‍ර රෙදිපිළි කර්මාන්ත සඳහා පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන**

- ❖ බතික් සහ පේෂකර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් ශාකසාර අවශේෂ මඟින් ස්වාභාවික වර්ණක හඳුන්වා දීම සඳහා අමාත්‍යාංශය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා නැනෝ තාක්ෂණ ආයතනය (SLINTEC) හා ඒකාබද්ධව පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කර නොවැම්බර් මස 21 සිට 23 දක්වා දිනවලදී ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් මහනුවර KCC (Kandy City Centre) හිදී පවත්වන ලද ප්‍රදර්ශනයේදී එම පර්යේෂණ ප්‍රතිඵල ප්‍රදර්ශනය කිරීම. (සත්‍ය වියදම - රු.මි.1.3264)

**02. අපනයන-නැඹුරු නිෂ්පාදන දිරිමත් කිරීම සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම - අදියර I සහ අදියර II**

- ❖ ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟළුම් ආයතනය (SLITA) සමඟ ඒකාබද්ධව "ශ්‍රී ලංකාවේ ටේලර්වරුන්ගේ පාරම්පරික කුසලතා ගෝලීය වෙළඳපලට හඳුන්වා දීමට" අවශ්‍ය තාක්ෂණික,ධාරිතා සංවර්ධනය සහ වෘත්තීය කුසලතා ඇගයීමට ලක් කර ප්‍රතිලාභීන් 430 දෙනෙකු සඳහා NVQ 3 / 4 මට්ටමේ සහතික පිරිනැමීමට කටයුතු කර ඇත. (සත්‍ය වියදම - රු.මි.8.048)

**03. බතික්, අත්යන්ත්‍ර සහ ඇඟලුම් කර්මාන්ත ප්‍රවර්ධනය**

**i. නවෝත්පාදනය, නිෂ්පාදන විවිධාංගීකරණය සහ සැපයුම් දාමය ශක්තිමත් කිරීම පිළිබඳ පළාත් වැඩමුළු 03 ක් පැවැත්වීම**

දේශීය පේෂකර්මාන්තයේ බතික් සහ අත්යන්ත්‍ර ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කර අපනයන අභිමුඛ නිෂ්පාදන ආර්ථිකයක් බවට පත් කිරීමේ අරමුණින් අමාත්‍යාංශය, පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව,පළාත් කර්මාන්ත/පේෂකර්ම සංවර්ධන දෙපාර්තමේන්තු, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය සහ අපනයන සංවර්ධන මණ්ඩලය යන රාජ්‍ය ආයතන ඒකාබද්ධව නවෝත්පාදනය, නිෂ්පාදන විවිධාංගීකරණය, අපනයන වෙළඳපොල යනාදී කරුණු ආවරණය කරමින් **දකුණ, බස්නාහිර සහ මධ්‍යම** පළාත් මට්ටමින් වැඩමුළු 03 ක් පවත්වන ලදී.මේ සඳහා මොරටුව විශ්ව විද්‍යාලය විසින් සම්පත් දායකත්වය ලබාදීම. ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 280 කි. (සත්‍ය වියදම - රු.මි.1.827)

**ii. ග්‍රාමීය පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා වැඩමුළුව පැවැත්වීම.**

ග්‍රාමීය පේෂ ගම්මාන අතුරින් ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ආශ්‍රිතව ග්‍රාමීය පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන් මුහුණ දෙන ගැටළු අධ්‍යයනය කරමින් නවෝත්පාදනය, නව මොස්තර සහ විද්‍යුත් අලෙවිකරණය සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා මොරටුව විශ්ව විද්‍යාලයේ සම්පත් දායකත්වයෙන් වැඩමුළුවක් පැවැත්වීම. ප්‍රතිලාභීන් සංඛ්‍යාව 80 කි. (සත්‍ය වියදම -රු.මි. 0.163)

**iii. ජාතික මට්ටමේ අලෙවි ප්‍රවර්ධන අවස්ථා සඳහා සම්බන්ධ වීම**

- සාම්ප්‍රදායික අත්යන්ත්‍ර ක්ෂේත්‍රය ආරක්ෂා කරමින් එය ඉදිරියට පවත්වා ගෙන යාම සඳහා අත්යන්ත්‍ර සහ පේෂකර්ම ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන්ගේ දක්ෂතා පළාත් මට්ටමින් අගයමින් ජාතික තලය කරා යොමු කිරීම සඳහා පේෂකර්ම දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලද “රන්සළු - ජාතික අත්යන්ත්‍ර රෙදිපිළි ප්‍රදර්ශනය අලෙවි සල්පිල හා සම්මාන ප්‍රදානෝත්සවය සඳහා දායකත්වය සැපයීම. (සත්‍ය වියදම රු.මි.4.85)

**iv. අත්යන්ත්‍ර පේෂකර්මාන්ත මෝස්තර නිර්මාණ ආශ්‍රිත ඇල්බමයක් හා මෝස්තර පොත් මුද්‍රණය කිරීම**

- ශ්‍රී ලාංකික අනන්‍යතාවයකින් යුත් සාම්ප්‍රදායික අත්යන්ත්‍ර හා පේෂකර්ම ක්ෂේත්‍රයේ මෝස්තර සංරක්ෂණය කරමින් අනාගත පරපුරට උරුම කිරීමේ අරමුණින් පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධව අත්යන්ත්‍ර පේෂකර්මාන්ත මෝස්තර නිර්මාණ ආශ්‍රිත ඇල්බමයක් හා මෝස්තර පොත් මුද්‍රණය කිරීම සඳහා දායකත්වය දැක්වීම. (සත්‍ය වියදම - රු.මි.1.1725)

**v. “ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මෝස්තර වල උරුමය නැවත ප්‍රතිපෝෂණය කිරීම” ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවට ආවේණික ඓතිහාසික මෝස්තර සහ සාම්ප්‍රදායික කලාවන් මතු පරපුරට උරුම කරදෙමින් එම මෝස්තර ගෝලීය ප්‍රජාවගේ පරිශීලනය සඳහා තාක්ෂණික ක්‍රමෝපායන් භාවිතා කරමින් සංරක්ෂණය කිරීම අරමුණු කර ගනිමින් ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් මෙම ව්‍යාපෘතියෙහි මුල් අදියර ලෙස සාම්ප්‍රදායික මෝස්තර සංරක්ෂණය සඳහා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ බස්නාහිර පළාත කේන්ද්‍ර කරගනිමින් ඓතිහාසික ස්ථාන වල ඡායාරූප ලබාගැනීම සිදු කර ඇත. මෙය වර්ෂ 02 ඒකාබද්ධ ව්‍යාපෘතියකි. (සත්‍ය වියදම - රු.මි. 1.58)

**විදේශීය ධාරිතා සංවර්ධන වැඩසටහන් (විශේෂ)**

ගරු අමාත්‍යතුමාගේ මැදිහත්වීමෙන් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ පූර්ණ අනුග්‍රහයෙන් 2025 නොවැම්බර් මස 09 සිට 15 දින දක්වා ඉන්දියාවේ කොයිම්බතූර් සර්දාර් වල්ලභ්බායි පටෙල් රෙදිපිළි කළමනාකරණ විද්‍යාලයේදී පවත්වන ලද විශේෂ ධාරිතා සංවර්ධන වැඩසටහනට දේශීය අත්යන්ත්‍ර සහ බලවේග යන්ත්‍ර ක්ෂේත්‍රයේ නිරත ශිල්පීන් 30 දෙනෙකු සහභාගී කරවීම.

**සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන රු.මි.100**

ක්‍රියාත්මක ආයතනය ජාතික ශිල්ප සභාව

**01. කටුබැද්ද දැව නිර්මාණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු**

දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සහ ශිල්පීන් බිහි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම අරමුණු කරගනිමින් ජාතික ශිල්ප සභාවට අයත් කටුබැද්ද දැව නිර්මාණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු සිදු කර ඇත. (සත්‍ය වියදම - රු.මි.6.172)

**02. දේශීය හා විදේශිය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන**

සාම්ප්‍රදායික හා ග්‍රාමීය හස්ත කර්මාන්ත ශිල්පීන්ට සිය නිෂ්පාදන හා අලෙවි කටයුතු සිදු කරගෙන යාම සඳහා පහසුකම් සැලසීම සහ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ශිල්ප ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් අමාත්‍යාංශය, ජාතික ශිල්ප සභාව හා ඒකාබද්ධව දේශීය හා විදේශිය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් පවත්වන ලදී.

පළාත් සහ දිස්ත්‍රික් ආවරණය වන පරිදි අලෙවි වැඩසටහන් 15ක් පවත්වා ඇත. (මධ්‍යම,කොළඹ-02,බදුල්ල,රත්නපුර, කුලියාපිටිය, යාපනය, අනුරාධපුර, මහනුවර, පොලොන්නරුව, මඩකලපුව, ගාල්ල, කෑගල්ල, වවුනියාව, ත්‍රිකුණාමලය) (සත්‍ය වියදම - රු.මි.3.52)

**විදේශීය අලෙවි වැඩසටහන්**

ශ්‍රී ලාංකීය සංස්කෘතිය විදහා දක්වන සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ප්‍රවර්ධනය හා එම ශිල්පීන්ට අලෙවි අවස්ථාවන් නිර්මාණය කිරීම, ශ්‍රී ලාංකික හා ඉන්දීය සංස්කෘතික අංගයන් ප්‍රවර්ධනය කිරීම සහ ඉන්දීය සහ ශ්‍රී ලංකික හස්ත කර්මාන්ත ශිල්පීන් අතර අන්‍යෝන්‍ය වශයෙන් ද්විපාර්ශවික සම්බන්ධතා ශක්තිමත් කර ගැනීමට වේදිකාවක් නිර්මාණය කර දීමේ අරමුණින් ජාතික ශිල්ප සභාව, ස්වාමි විවේකානන්ද සංස්කෘතික මධ්‍යස්ථානය සහ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය ඒකාබද්ධව ඉන්දු -ශ්‍රී ලංකා අන්තර්ජාතික හස්ත කර්මාන්ත ප්‍රදර්ශනය නොවැම්බර් 13 සිට 14 දක්වා Havelock city Mall පරිශ්‍රයේදී පවත්වන ලදී. (සත්‍ය වියදම - රු.මි.8.3)

- ❖ දේශීය සහ විදේශීය අලෙවි වැඩසටහන් වල සමස්ත මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 517 කි.

- ❖ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ශිල්පීන්ට සිය අලෙවි පහසුකම් සපයමින් ඔවුන්ගේ නිර්මාණ සාධාරණ මිලකට මිලදී ගනිමින් අලෙවි ප්‍රදර්ශනාගාර හරහා දේශීය සහ විදේශීය සංචාරකයින් හට සාම්ප්‍රදායික හස්ත නිර්මාණ මිලදීගැනීමේ අවස්ථාවන් නිර්මාණය කරදීමේ අරමුණින් පල්ලෙකැලේ සහ ගාල්ල සිප්නාරා යන අලෙවි ප්‍රදර්ශනාගාර 02 හි සංවර්ධන කටයුතු සිදු කර ඇත. (සත්‍ය වියදම - රු.මි.3.114)

- ❖ දේශිය සාම්ප්‍රදායික හා සංස්කෘතික වටිනාකමින් යුත් හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සංරක්ෂණය කිරීම සහ සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ශිල්ප ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගනිමින් ආකර්ෂණීය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම සඳහා බත්තරමුල්ල අපේ ගම පරිශ්‍රයේ හස්ත කර්මාන්ත කෞතුකාගාරයේ සංවර්ධන කටයුතු සිදු කර ඇත. (සත්‍ය වියදම - රු.මි.2.655)

- ❖ **ශිල්පීය හුවමාරු වැඩසටහන**

  ජාතික ශිල්ප සභාව, බංග්ලාදේශ බෙංගාල පදනම බංග්ලාදේශ ශිල්ප සභාව සහ බංග්ලාදේශ ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය ඒකාබද්ධව බංග්ලාදේශ පුහුණු සම්පත්දායකයින් විසින් දේශීය හණ නිර්මාණ ශිල්පීන් 20ක් සඳහා ශිල්පීය දැනුම, නව මෝස්තර, වර්ණ රටා සම්බන්ධයෙන් දැනුම ලබාදීමට නේවාසික පුහුණු වැඩසටහනක් පැවැත්වීම. (සත්‍ය වියදම - රු.මි.0.776)

- ❖ අත්දැකීම් පාදක සංචාරක ප්‍රවේශය යටතේ ආකර්ශණීය සංචාරක ගමනාන්තයක් බවට පත් කිරීම අරමුණින් සීගිරිය ශිල්ප හා සංස්කෘතික ගම්මානයේ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කිරීම.
  (සත්‍ය වියදම - රු.මි.30.023)

- ❖ දිවයින පුරා විසිරී සිටින විශිෂ්ට හස්ත කර්මාන්ත ශිල්පීන්ගේ දෑතින් නිමවෙන අත්කම් නිර්මාණ ජාතික මට්ටමින් සහ පළාත් මට්ටමින් ඇගයීමට ලක් කිරීමට වාර්ෂිකව ශිල්ප අභිමානි සම්මාන උළෙල පවත්වනු ලබයි. 2024 වර්ෂයේදී පවත්වන ලද ශිල්ප අභිමානි සම්මාන උළෙල සඳහා උපචිත වියදම් මේ වසරේදී ගෙවා අවසන් කිරීම. (සත්‍ය වියදම - රු.මි.1.378)

**අභියෝග**

I. බතික් සහ පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා දේශීය අමුද්‍රව්‍ය උපයෝගී කරගනිමින් ශාකසාර අවශේෂ මඟින් නිපදවන ලද ස්වාභාවික වර්ණක වාණිජකරණය කිරීම.

II. නූතන පරම්පරාව සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත සහ පේෂකර්ම ක්ෂේත්‍රයට ආකර්ෂණය කරගැනීම.

III. සාම්ප්‍රදායික කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිතව දළ දේශීය නිෂ්පාදිතයට/අපනයන ආදායමට දක්වන දායකත්වය වැඩි කිරීම.

**ඉදිරි සැලසුම්**

i. බතික් සහ අත්යන්ත්‍ර කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනයට අත්‍යවශ්‍ය ගුණාත්මක අමුද්‍රව්‍ය සාධාරණ මිලට සපයා ගැනීමට පවතින දුෂ්කරතා අවම කිරීම සඳහා අමාත්‍යාංශය, සී/ස ලංකා සළුසල සහ පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යන ආයතන හා ඒකාබද්ධව පේෂ කර්මාන්තයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

ii. 2025 වර්ෂයේදී ජාතික මෝස්තර මධ්‍යස්ථානය විසින් ක්‍රියාත්මක කරන ලද "ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මෝස්තර වල උරුමය නැවත ප්‍රතිපෝෂණය කිරීම"ව්‍යාපෘතියෙහි දෙවන අදියර ක්‍රියාත්මක කිරීම.

iii. සාම්ප්‍රදායික හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා අමුද්‍රව්‍ය හා කර්මාන්ත ව්‍යාප්තිය හඳුනාගැනීම සහ ශිල්පීන්ට පවතින ගැටළු අනාවරණය කරගැනීම සඳහා පවතින ආයතන සමඟ ඒකාබද්ධව අවශ්‍ය කටයුතු සිදු කිරීම.

iv. ගම්පහ දිස්ත්‍රික්කයේ දිවුලපිටිය ප්‍රදේශය ආශ්‍රිතව ග්‍රාමීය පේෂ කර්මාන්ත ක්ෂේත්‍රය සංවර්ධනය සඳහා ප්‍රාදේශීය මට්ටමින් Cluster Development වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

v. ජාතික ශිල්ප සභාව, ජාතික මෝස්තර මධ්‍යස්ථානය සහ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය යන ආයතන ත්‍රිත්වය ඒකාබද්ධ කර හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා එකම අධ්‍යක්ෂ මණ්ඩලයක් ඒකීය විධානයක් යටතේ එක ආයතනයක් වශයෙන් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

vi. පේෂකර්මාන්ත ක්ෂේත්‍රයේ සංවර්ධනය සහ ඒවාට වඩාත් ඵලදායී පහසුකම් සැලසීමේ අරමුණින් පළාත් කර්මාන්ත දෙපාර්තමේන්තු සහ අනෙකුත් පාර්ශවයන් සමඟ ඒකාබද්ධව ඉදිරියට කටයුතු කිරීම සඳහා පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.

**මැණික් හා ස්වර්ණාභරණ අංශය**

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

1993 අංක 50 දරන ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනය කිරීමට අදාළව මූලික කටයුතු සිදු කර ඇත.

- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පර්යේෂණ අංශය වශයෙන් ස්ථාපිත කිරීමට අදාල ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ හඳුනා ගැනීමේ වාර්තාවේ මූලික කෙටුම්පත සකස් කර ඇත.
- මැණික් කැනීමේ බලපත්‍ර නිකුත් කිරීමට හා ඒ සම්බන්ධයෙන් නැගෙන පැමිණිලි විමර්ශනය කිරීමට අදාළව නව ක්‍රමවේදයක් හඳුන්වා දී ඇත.
- 2025 වර්ෂයේ මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති අපනයනය තුලින් ඇමරිකානු ඩොලර් මිලියන 374 ක ආදායමක් උපයා ඇත.
- මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් කිරීමට එරෙහිව ලැබී ඇති මහජන පැමිණිලි 54 ක් හා මැණික් ගැරීමේ බලපත්‍ර නිකුත් නොකිරීම එරෙහිව ලැබී ඇති අභියාචනා 14 ක් සම්බන්ධව පර්යේෂණ කර අදාල කටයුතු අවසන් කර ඇත.
- දේශීය හා විදේශීය මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන 10 ක් සඳහා ශ්‍රී ලාංකික කර්මාන්තකරුවන් 154 දෙනෙකු සහභාගි කරවා ඇත.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියුතු ශ්‍රම බලකායට සිසුන් 1338 දෙනෙකු පුහුණු කර ඇත.
- නව මැණික් නිධි ගවේෂණය යටතේ ප්‍රදේශ තුනක නිධි හඳුනාගෙන සිතියම් ගත කර ඇත.

**අභියෝග**

- රජය විසින් පනවා ඇති නව බදු නිසා කර්මාන්තකරුවන් අධෛර්යයට පත් වී සිටීම.
- මැණික් සඳහා ශ්‍රී ලංකාව ජාත්‍යන්තර වෙළඳ කේන්ද්‍රස්ථානයක් බවට පත් වී නොතිබීම
- මැණික් සම්පත පරිපූර්ණ ලෙස තිරසර ලෙස භාවිතය සඳහා ගැනීමට නොහැකිවීම.
- විදේශ විනිමය නීත්‍යානුකූල ක්‍රමවේදයකට රට තුළට ගලා නොඒම.
- මැණික් සම්පත තිරසර භාවිතය සඳහා ජාතික ප්‍රතිපත්තියක් නොමැති වීම.
- මැණික් කැපීම හා ඔපදැමීමේ නිපුණතාවයෙන් යුත් ශ්‍රම බලකායක් නොමැති වීම.
- පුහුණුලාභීන්ගේ දැනුම හා ශිල්පීය නිපුණතාවයට ගැළපෙන පරිදි වැටුප් හා අනෙකුත් දීමනා ගෙවීමේ ක්‍රමවේදයක් කර්මාන්තය තුළ නොමැති වීම හේතුවෙන් කර්මාන්තය සඳහා යොමු වන පුහුණුලාභීන්ට එය සෘණ බලපෑමක් එල්ල කිරීම.

**ඉදිරි ඉලක්ක**

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය පනත සංශෝධනය කිරීමට අදාළ කටයුතු අවසන් කිරීම.

- මැණික්මය ස්වභාවයේ ක්වාට්ස් අපනයනය කිරීමට අදාළ රෙගුලාසි ඇතුළත් ගැසට් පත්‍රය නිකුත් කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ විවිධ ගාස්තු සම්බන්ධයෙන් වන ගැසට් පත්‍රය සංශෝධනය කිරීමට පියවර ගැනීම.
- මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පර්යේෂණ අංශය වශයෙන් ස්ථාපිත කිරීමට අදාළ වාර්තාව සකස් කර අවසන් කිරීම.
- මැණික්, ස්වර්ණාභරණ හා දියමන්ති ක්ෂේත්‍රයේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් මිලියන 500 දක්වා ඉහළ නැංවීම.
- මැණික් ගැරීමේ බලපත්‍ර සම්බන්ධයෙන් ලැබෙන මහජන පැමිණිලි හා අභියාචනා විමර්ශනය කිරීම.
- දේශීය හා විදේශීය මැණික් හා ස්වර්ණාභරණ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලාංකික කර්මාන්තකරුවන් යොමු කිරීමට පියවර ගැනිම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ පාඨමාලා සඳහා සිසුන් 1500 ක් පමණ පුහුණු කිරීම.
- මල්වතු ඔය හා මහ ඔය ප්‍රදේශ වල මැණික් නිධි සම්බන්ධ පර්යේෂණ සිදු කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ මුදල් විශුද්ධිකරණය හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම සඳහා වන සැලැස්ම ක්‍රියාත්මක කිරිමේ කටයුතු මෙහෙය වීම.

## 2.8 ව්‍යවසායකත්ව සංවර්ධන අංශය

**ප්‍රගතිය/ජයග්‍රහණ**

- ආයතන ඒකාබද්ධ කිරීම සහ ශ්‍රී ලංකා කර්මාන්ත පරිවර්තන හා නවෝත්පාදන අධිකාරිය (ITIA-SL) පිහිටුවීම:

ඒකාබද්ධ සහ අනාගතය කේන්ද්‍ර කරගත් ආයතනික රාමුවක් නිර්මාණය කිරීමේ අරමුණින්, කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB), ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) සහ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය (SEDD) ඒකාබද්ධ කරමින් කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ජාතික ආයතනයක් පිහිටුවීමට 2025.03.17 දින පැවති රැස්වීමේදී අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදී. තවද, ශ්‍රී ලංකා කර්මාන්ත පරිවර්තන සහ නවෝත්පාදන අධිකාරිය පිහිටුවීම සඳහා වූ සංකල්ප පත්‍රිකාවට 2025.12.29 දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය හිමි විය.ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) සහාය ඇතිව මෙම ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර, පාර්ශ්වකරුවන් සම්බන්ධ කර ගැනීමේ කටයුතු දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. ඒකාබද්ධ වන ආයතන තුනෙහි නිලධාරීන්, ප්‍රධාන රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය සහ ශාස්ත්‍රීය අංශයේ නියෝජිතයන්ගෙන් සමන්විත ඩිජිටල් පරිවර්තන, මානව සම්පත් සහ පාර්ශ්වකරුවන් සහභාගිත්වය මෙන්ම මූල්‍ය සහ වත්කම් කළමනාකරණය, නීති, ඩිජිටල් පරිවර්තන, මානව සම්පත් හා පාර්ශවකරුවන්ගේ සහභාගිත්වය හා මූල්‍ය සහ වත්කම් කළමණාකරණය යන අංශයන් සඳහා වන තේමාත්මක ක්‍රියාකාරී කමිටු හතරක් මගින් ඉහත ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සහයෝගය ලබා ගන්නා අතර මෙම කමිටු ඒකාබද්ධ වන ආයතන තුනෙහි නිලධාරීන්, ප්‍රධාන රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය හා අධ්‍යන ආයතන වල නියෝජිතයින්ගෙන් සමින්විත වේ. ඒ අනුව මේ වන විට ITIA-SL පනත කෙටුම්පත් කිරීම සිදුවෙමින් පවතී.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය (SME) ප්‍රතිපත්තිය සකස් කිරීම:

ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සහ ඕස්ට්‍රේලියානු රජයේ තාක්ෂණික සහ මූල්‍ය සහාය ඇතිව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධනය සඳහා ඒකාබද්ධ රාමුවක් සැපයීම වෙනුවෙන් ජාතික SME ප්‍රතිපත්තිය සකස් කිරීම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී.

- SME උපායමාර්ගික රාමුව සංවර්ධනය කිරීම:

SME සංවර්ධන මැදිහත්වීම් සඳහා උපායමාර්ගික මඟපෙන්වීමක් සැපයීම සඳහා කුළුණු එකොළහකින් සමන්විත පුළුල් 'SME සංවර්ධන උපායමාර්ගික රාමුවක්' සකස් කරන ලදී. මෙම රාමුව මගින් පද්ධතිමය අභියෝග ආමන්ත්‍රණය කරන අතර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන්ට තරඟකාරී, වර්ධනය අරමුණු කරගත් සහ අපනයනයට සූදානම් වීමට හැකියාව ලබා දෙන ජාතික වශයෙන් පෙළගැසුණු පරිසර පද්ධතියක් පෝෂණය කරයි.

- SME උපදේශක කමිටුව පිහිටුවීම:

SME සංවර්ධනය පිළිබඳ ප්‍රතිපත්ති උපදේශන යාන්ත්‍රණයක් ලෙස සහ පාර්ශ්වකරුවන්ගේ සම්බන්ධය ශක්තිමත් කිරීම සඳහා SME උපදේශක කමිටුවක් පිහිටුවන ලදී. මෙම වසර තුළ රැස්වීම් පහක් කැඳවා ඇත.

- ජාතික නියාමන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම (NRAP):

නියාමන පරිසරය විධිමත් කිරීම, ව්‍යාපාර සඳහා ඇති බාධක ඉවත් කිරීම සහ වඩාත් සංගත හා සුදුසු නියාමන රාමුවක් හරහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ තරඟකාරිත්වය ශක්තිමත් කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුවේ සහයෝගය ඇතිව ජාතික නියාමන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම අමාත්‍යාංශය විසින් ආරම්භ කරන ලදී.

පුළුල් පාර්ශ්වකරුවන්ගේ උපදේශන හරහා නියාමන අභියෝග හඳුනා ගත් අතර ජාතික නියාමන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම ආරම්භ කරන ලදී.

- ව්‍යාපාර නාම ලියාපදිංචිය සරල කිරීම:

ව්‍යාපාර ලියාපදිංචි කිරීම විධිමත් කිරීම, පරිපාලනමය බාධක ඉවත් කිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය වර්ධනයට වඩාත් හිතකර පරිසරයක් නිර්මාණය කිරීම සඳහා ක්‍රිසැලිස් (Chrysalis) හි තාක්ෂණික සහාය ඇතිව සරල කළ සහ ඒකාබද්ධ මාර්ගෝපදේශයක් සකස් කරන ලදී.

- ජාතික ඉන්කියුබේටර් (ව්‍යාපාර පුහුණු) ආකෘතියක් සංවර්ධනය කිරීම:

ජාතික ව්‍යවසාය පරිසර පද්ධතිය ශක්තිමත් කිරීම සහ නවෝත්පාදන ප්‍රමුඛ ව්‍යවසායකත්වය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් නව සහ මුල් අදියරේ ව්‍යවසායන් සඳහා සහාය වීමට ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය ආයතනය සමඟ එක්ව ජාතික ඉන්කියුබේටර් ආකෘතියක් සංවර්ධනය කිරීමේ කටයුතු ප්‍රගතියේ පවතී.

- SME උපදේශන සේවා වෘත්තීයකරණය කිරීම:

සහතිකලත් සබඳතා නිලධාරී වැඩසටහනේ පළමු කණ්ඩායම අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙහි නිලධාරීන් 53 දෙනෙකු විසින් සාර්ථකව නිම කරන ලද අතර, ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනය (SLIM) සමඟ එක්ව පවත්වනු ලබන පුහුණුවීම් යටතේ ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය නිලධාරීන් 70 දෙනෙකු සඳහා සන්නාම කළමනාකරණ වැඩසටහන ආරම්භ කර ඇත. මෙම මුලපිරීම් සැලසුම් කර ඇත්තේ සංවර්ධන නිලධාරීන් ව්‍යාපාර උපදේශකයින් බවට පත් කිරීම මෙන්ම, SME උපදේශන සහ සහාය සේවාවන්හි ගුණාත්මකභාවය සහ බලපෑම ශක්තිමත් කිරීම සඳහා ය.

**අභියෝග**

- ඒකාබද්ධ සේවා සැපයීමට බාධා පමුණුවන ඛණ්ඩනය වූ ආයතනික පැරණි පද්ධති සහ ක්‍රියා පටිපාටි.
- වෙනස්කම් සඳහා දක්වන ප්‍රතිරෝධය සහ ආයතන ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය තුළ ඵලදායී වෙනස්කම් කළමනාකරණයක අවශ්‍යතාවය.
- තත්‍ය කාලීන තොරතුරු ලබාගැනීම, කාර්යසාධනය සහ සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්ති සම්පාදනය සක්‍රීය කිරීම සඳහා ඒකාබද්ධ ජාතික SME තොරතුරු පද්ධතියක් නොමැතිකම.
- මූල්‍ය ප්‍රතිපාදන සහ කුසලතා සහිත මානව සම්පත් ආදී වූ සම්පත්වල හිඟකම.

**අනාගත ඉලක්ක**

- කර්මාන්ත පරිවර්තනය සහ රටේ ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ඒකාබද්ධ ජාතික වේදිකාවක් නිර්මාණය කරමින් 2027 ජනවාරි වන විට ශ්‍රී ලංකා කාර්මික පරිවර්තන සහ නවෝත්පාදන අධිකාරිය පිහිටුවීමට නායකත්වය දීම.
- ඒකාබද්ධ ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීම සහ වේගවත්, පාරදෘශ්‍ය සහ ජාතික වශයෙන් ප්‍රමිතිගත ලියාපදිංචි කිරීමේ පද්ධතියක් ස්ථාපිත කිරීම සඳහා eBNR වේදිකාව දියුණු කිරීම හරහා MSME විධිමත් කිරීම වේගවත් කිරීම සහ ව්‍යාපාර කිරීමේ පහසුව වැඩිදියුණු කිරීම.
- නියාමන බාධාවන් ඉවත් කර තරඟකාරී, ව්‍යාපාරික හිතකාමී පරිසර පද්ධතියක් ඇති කිරීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව සමඟ ජාතික නියාමන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරී සැලැස්ම (NRAP) ක්‍රියාත්මක කිරීම අවසන් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ වර්ධනය, අගය දාම ඒකාබද්ධ කිරීම සහ අපනයනයට සූදානම් කිරීම වේගවත් කිරීම සඳහා මූල්‍ය ප්‍රවේශය, ව්‍යාපාර පුහුණුව (incubation) සහ වෙළඳපල සම්බන්ධතා ඇතුළු සම්බන්ධීකරණ සහාය ලබා දීමෙන් ඒකාබද්ධ SME සංවර්ධන සේවා සැපයීමට පහසුකම් සැලසීම.
- SLIM සමඟ එක්ව සකස් කරන ලද පාඨමාලා හරහා සබඳතා කළමනාකරණ වැඩසටහන සහ සන්නාම කළමනාකරණ වැඩසටහන මඟින් නිලධාරීන් ව්‍යාපාර උපදේශකයින් බවට පත් කිරීම තුළින් උපදේශන ධාරිතාව වෘත්තීයකරණය සහ ශක්තිමත් කිරීම.
- අපනයන, රැකියා සහ තිරසාර ජාතික වර්ධනය ඉහළ නැංවීම සඳහා නවෝත්පාදන, නියාමන කාර්යක්ෂමතාව සහ පරිසර පද්ධති හවුල්කාරිත්වයන් හරහා ඉහළ වර්ධනයක් සහිත, අපනයන-විභව ව්‍යවසායයන්ට සහාය වීම මඟින් ගෝලීය වශයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ තරඟකාරිත්වයට පහසුකම් සැලසීම.

# 2.9 රාජ්‍ය ව්‍යවසායයන් සහ අනෙකුත් ආයතන

## 2.9.1 කාර්මික සංවර්ධන මණ්ඩලය (IDB)

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

**භෞතික ප්‍රගතිය**

- කාර්මික සංවර්ධනය සඳහා හිතකර ව්‍යාපාරික පරිසරයක් ශක්තිමත් කිරීමේ අරමුණින් ආයතනික මැදිහත්වීම් 338ක් ක්‍රියාත්මක කරන ලදී.
- වෙළඳ ප්‍රදර්ශන, වැඩසටහන්, ගැනුම්කරුවන්–විකුණුම්කරුවන් අතර හමුවීම් සහ ඉදිරි විකුණුම් ගිවිසුම් ඇතුළත් කරගෙන වෙළඳපොළ මූලික සහය සේවා 1,629ක් ලබා දෙන ලදී.
- බලශක්ති-කාර්යක්ෂම පරිභෝජනය ප්‍රවර්ධනය, බලශක්ති භාවිතය වඩාත් සුදුසු ලෙස කළමනාකරණය කිරීම සහ නිෂ්පාදන හා පද්ධති ප්‍රමිතීන් හා සහතික ලබාගැනීම සඳහා සහය වීමේ අරමුණින් තාක්ෂණික මැදිහත්වීම් 15,540ක් ක්‍රියාත්මක කරන ලදී.
- පිරිවැය කළමනාකරණය, ගිණුම් තැබීම, ගබඩා කළමනාකරණය, සැලසුම් කිරීම, ඵලදායිත්ව සංවර්ධනය, කම්කරු නීති, බදු උපදේශන සහ කළමනාකරණ උපදේශන ඇතුළු ක්ෂේත්‍රවල කළමනාකරණ උපදේශන සේවා 4,287ක් ඉටු කරන ලදී.
- ණය සහ ප්‍රදාන ලබාගැනීම සඳහා සහය වීමත්, වටිනාකම් ඇගයීම්, ශක්‍යතා වාර්තා, වෙළඳපොළ විශ්ලේෂණ, ව්‍යාපාර සැලසුම් ඇතුළු ව්‍යාපෘති වාර්තා සකස් කිරීමත් සමඟ මූල්‍ය පහසුකම් සම්බන්ධ සේවා 471ක් ලබා දෙන ලදී.
- කර්මාන්ත සඳහා ඉඩම් ලබාගැනීමට සහය දීමෙන් අක්කර 34ක භූමි ප්‍රමාණයක් කාර්මික ජනපද ලෙස සංවර්ධනය කරන ලදී.
- කාර්මික ක්‍රියාකාරකම් සඳහා සහය වීමේ අරමුණින් විශේෂිත ඉංජිනේරු සේවා 582ක් ඉටු කරන ලදී.
- අපේක්ෂකයින් 30 දෙනෙකු සඳහා මෝටර් රථ, යන්ත්‍රෝපකරණ සහ කම්හල් තක්සේරු කිරීම් සහ තක්සේරු කිරීම් පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමා පාඨමාලාවන් පවත්වන ලදී.

**මූල්‍ය ප්‍රගතිය**

- 2025 සඳහා පුනරාවර්තන වියදම් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා මුළු වෙන් කිරීම පිළිවෙලින් රුපියල් මිලියන 450 ක් සහ රුපියල් මිලියන 50 ක් විය. 2025 දෙසැම්බර් 31 වන විට, අදාල වෙන් කිරීම් තුලින් 100% ක් වැය කර ඇත.
- ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම සඳහා රුපියල් මිලියන 24.48 ක් වෙන් කර ඇති අතර, මෙම මුදලින් 100% ක් ප්‍රාග්ධන අයවැය හරහා වියදම් කර ඇත.
- ප්‍රාග්ධන වත්කම් ප්‍රතිස්ථාපනය හා වැඩිදියුණු කිරීම සඳහා රුපියල් මිලියන 38.16 ක මුදලක් වෙන් කරන ලද අතර, වසර අවසන් වන විට මෙම මුදලින් 100% ක් වියදම් කර ඇත.
- ප්‍රධාන හා කුඩා කාර්මික ජනපද වැඩිදියුණු කිරීම සහ නවීකරණය කිරීම සඳහා වෙන් කිරීම් රුපියල් මිලියන 100 ක් වූ අතර මෙම මුදලින් 100% ක් වසර අවසානයේ වියදම් කර ඇත.

**අභියෝග**

- **දුර්වල අපනයන සම්බන්ධතා පැවතීම**

  දේශීය කර්මාන්තකරුවන් ගෝලීය ව්‍යාපාරික ක්ෂේත්‍රය සමග පවතින හවුල්කාරීත්වය හා සම්බන්ධීකරණය දුර්වල වීම හේතුවෙන් දේශීය කර්මාන්ත, විශේෂයෙන් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්, ජාත්‍යන්තර වෙළඳපොළට ප්‍රවේශ වීමේදී සැලකිය යුතු සීමාවන්ට මුහුණ දෙයි. දේශීය කර්මාන්තකරුවන් විදේශීය වෙළෙඳපොළ වෙත යොමුකිරීමේදී ව්‍යුහගත අපනයන ඉලක්ක සහ කාර්ය සාධන අධීක්ෂණ යාන්ත්‍රණ නොමැති වීම හේතුවෙන් දේශීය ව්‍යවසායකයන් හට ඵලදායීව වෙළඳපල විනිවිදභාවයකින් කටයුතු කිරිම සීමා කරයි.

- **නවීන තාක්‍ෂණය වෙත අනුගත වීම සහ නවෝත්පාදන ධාරිතාවය ප්‍රමාණවත් නොවීම.**

  මෙරට කර්මාන්ත ක්ෂේත්‍රය තුල පවතින තාක්ෂණික හිඩැස්, දේශීය කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර, ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට සහ ගෝලීය වශයෙන් තරඟ කිරීමට බාධාවක් ලෙස පවතී.

- **අපනයන වෙළඳපොළ පුළුල් කිරීම සඳහා ආයතනික සහයෝගය ප්‍රමාණවත් නොවීම.**

  හිතකර නිදහස් වෙළඳ ගිවිසුම් (FTAs) ඇතුළුව නව සහ උපායමාර්ගිකව පෙළගැස්වූ ආර්ථික හවුල්කාරිත්වයන් නොමැතිකම අපනයන විවිධාංගීකරණය සඳහා ඇති අවස්ථා අඩු කර ඇත. ඊට අමතරව, සංකීර්ණ පරිපාලන සහ නියාමන ක්‍රියා පටිපාටි අපනයන-නැඹුරු ක්‍රියාකාරකම්වල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහභාගීත්වය අධෛර්යමත් කරයි.

- **සංවර්ධන කටයුතු සඳහා අරමුදල් ප්‍රමාණවත් නොවීම**

  කාර්මික සංවර්ධන මණ්ඩලයට පුනරාවර්තන වියදම් සඳහා රු. මි. 450 ක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් සඳහා රු. මි. 50 ක් වෙන් කරන ලද නමුත් වර්ෂය අවසානයේදී සත්‍ය පුනරාවර්තන වියදම් රු. මි. 677.103 ක් සහ අනෙකුත් පුනරාවර්තන වියදම් රු. මි. 117.927 ක් විය. එමගින් අනුමත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා ඇති අතර එහි ප්‍රතිඵලයක් ලෙස, සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලද අරමුදල් අතිරික්ත පුනරාවර්තන වියදම් සපුරාලීම සඳහා වෙන් කිරීමට සිදු විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ පවතින මූල්‍ය සම්පත් ප්‍රමාණවත් නොවීම.

- **මානව සම්පත් හිඟය**

  තාක්ෂණික, වෘත්තීය සහ ක්ෂේත්‍ර මට්ටමේ කාර්ය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් කාර්මික සංවර්ධන මණ්ඩලය වර්තමානයේ මානව සම්පත් පරතරයකට මුහුණ දී සිටී. මෙම හිඟය කාර්මික සංවර්ධන වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා කාලෝචිත උපදේශන සේවා සැපයීමට සහ අධීක්ෂණ සහ නියාමන කාර්යයන් සිදු කිරීමට මණ්ඩලයේ ධාරිතාව සීමා කරයි. එය ආයතනයේ මෙහෙයුම් කාර්යක්ෂමතාව සහ සේවා සැපයීම සඳහා අහිතකර ලෙස බලපායි.

- **කාර්මික සංවර්ධනය සඳහා ප්‍රමාණවත් මූල්‍ය සම්පත් නොමැති වීම.**
  තාක්ෂණය වැඩිදියුණු කිරීම, යටිතල පහසුකම් සංවර්ධනය සහ කර්මාන්ත නවීකරණයට අදාළ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය අඛණ්ඩ අරමුදල් සීමාවන්ට මුහුණ දෙයි. සීමිත මූල්‍ය ප්‍රතිපාදන, කාර්මික සහාය, සේවා පුළුල් කිරීමට බාධා කරන අතර නැගී එන කර්මාන්ත අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීමට මණ්ඩලයේ හැකියාව සීමා කරයි.

- **කර්මාන්ත සඳහා ඉඩම් අත්පත් කරගැනීමේ සහ යටිතල පහසුකම් ලබාගැනීමේ සීමාවන් පැවතීම.**
  ඉඩම් අත්පත් කර ගැනීමට අදාළව පවතින දැඩි නීතිමය සහ නියාමන රාමු කාර්මික කලාප පිහිටුවීම සහ පුළුල් කිරීම ප්‍රමාද කරයි. නිශ්චිතව ඉඩම් හඳුනාගැනීමේ යාන්ත්‍රණයක් නොමැති වීම හේතුවෙන්, දිස්ත්‍රික් හා කලාපීය මට්ටමින් නව ආයෝජන සහ කාර්මික කලාප තවදුරටත් ව්‍යාප්ත කිරීම සීමා කරයි.

- **මානව ප්‍රාග්ධන සංවර්ධනය සඳහා ප්‍රමාණවත් ආයෝජන නොමැතිකම.**
  මානව සම්පත් සංවර්ධනය සඳහා සීමිත අරමුදල් පැවතීම හේතුවෙන් කර්මාන්ත වර්ධනය සඳහා අවශ්‍ය කුසලතා සහිත තාක්ෂණික, කළමනාකරණ සහ ව්‍යවසායක කුසලතා ලබා ගැනීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් නොමැතිවීම. මෙය දේශීය කර්මාන්ත තුළ ඵලදායිතා වැඩිදියුණු කිරීම, නවෝත්පාදනය සහ තාක්‍ෂණය අවශෝෂණය සීමා කරයි.

**ඉදිරි සැලැසුම්**

- කාර්මික ජනපද පිහිටුවීම සඳහා පවතින ඉඩම් ප්‍රමාණය 2025 දී අක්කර 363 සිට 2030 දී අක්කර 1500 දක්වා ඉහළ නැංවීමට කටයුතු කිරීම.
- 2025 දී 5% ක් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අපනයන පරිමාව 2030 දී 10% දක්වා වැඩි කිරීම.
- 2024 දී මුළු අපනයනවලින් 1.75% ක් වූ ශ්‍රී ලංකාවේ යන්ත්‍රෝපකරණ අපනයන අංශයේ දායකත්වය 2030 වන විට 5% දක්වා වැඩි කිරීම.
- 2030 වන විට නිෂ්පාදන අංශයේ දළ දේශීය නිෂ්පාදිතයට දායකත්වය 16.4% සිට 20% දක්වා වැඩි කිරීම.
- රජයේ වඩාත්ම ඵලදායී හා කාර්යක්ෂම කාර්මික සේවා සපයන නියෝජිතයා වීම.
- හම්බන්තොට දිස්ත්‍රික්කයේ කාර්මික නගර ව්‍යාපෘතිය.
- ඉන්කියුබේටර් 9ක් පිහිටුවීමේ ව්‍යාපෘතිය.
- සියලුම දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි අලෙවි මධ්‍යස්ථාන 25ක් ස්ථාපිත කිරීම.

## 2.9.2 ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA)

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

**1. "උපාධිධාරී ව්‍යවසායකත්ව උදානය" වැඩසටහන**

ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් විශ්වවිද්‍යාල උපාධිධාරීන්ගේ හැකියාවන් වැඩිදියුණු කිරීම සහ ඔවුන් සාර්ථක ව්‍යවසායකයින් ලෙස නිර්මාණය කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරයි. මෙය විශ්වවිද්‍යාලවල වෘත්තීය මාර්ගෝපදේශ ඒකක සමග එක්ව ක්‍රියාත්මක වන අතර, උපාධිධාරී ව්‍යවසායකයින් බිහි කිරීම මෙන්ම නව රැකියා අවස්ථා නිර්මාණය කිරීමටද දායක වේ. 2025 වර්ෂය තුළ උපාධිධාරීන් 400 ක් ව්‍යවසායකත්වය පිළිබඳව පුහුණු කර ඇති අතර තෝරාගත් උපාධිධාරීන් 30 දෙනෙකු සඳහා තම ව්‍යාපාර ආරම්භ කිරීම සහ දියුණු කිරීම සඳහා මූල්‍ය ප්‍රදානයක්ද සිදු කරන ලදී. පෞද්ගලික විශ්වවිද්‍යාල සහ වෘත්තීය පුහුණු ආයතන වෙතද මෙම වැඩසටහන 2026 වර්ෂයේ සිට පුළුල් කිරීමට අප බලාපොරොත්තු වෙමු. මෙහිදී පෞද්ගලික අංශය සහ අනෙකුත් පාර්ශවයන්ගේ සහයෝගයද ලබා ගැනීමට අපේක්ෂා කරමින්, වැඩි පිරිසක් මෙම වැඩසටහන සඳහා සම්බන්ධ කරවීම අපගේ ප්‍රධාන අරමුණයි.

**2. "Made in Sri Lanka" වෙළඳ ප්‍රදර්ශන**

ශ්‍රී ලාංකික දේශීය ව්‍යවසායකයින් සඳහා දෙස් විදෙස් වෙළඳපළ වෙත ප්‍රවේශ වීමේ හැකියාව ලබාදීම සඳහා "Made in Sri Lanka" වෙළඳ ප්‍රදර්ශන වාර්ෂිකව දිවයින පුරා සංවිධානය කෙරේ. එහිදී ප්‍රමිතිගත සහ ගුණාත්මක නිෂ්පාදන සිදුකරනු ලබන ප්‍රාදේශීය මට්ටමේ ව්‍යවසායකයින් ජාතික තලය වෙත රැගෙන යාම මෙහි අරමුණ වේ. එම ව්‍යාපෘතියට නව අගයක් එකතු කරමින් 2024 වර්ෂයේ සිට "Made in Sri Lanka" වෙළඳ ප්‍රදර්ශන විදේශ සංචාරක ආකර්ෂණය දිනාගත් ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් සංවිධානය කිරීමට තීරණය විය. මේ යටතේ 2024 වසරේ "ඇල්ල" නගරය කේන්ද්‍ර කර ගනිමින් "Made in Sri Lanka" වෙළඳ ප්‍රදර්ශනය සාර්ථකව පැවැත්වූ අතර එහි වෙළඳ කුටි 120 පවත්වන ලදී. මේ හරහා දේශීය ව්‍යවසායකයින් විදේශිකයන් වෙත ව්‍යාපාර කටයුතු කිරීමට අවස්ථාව ලැබීමත්, සංචාරක කර්මාන්තය සඳහා දායකත්වය සැපයීමත්, විදෙස් ව්‍යාපාරික අවස්ථා ඇති කර ගැනීමටත් අවස්ථාව උදාවිය.

"Made in Sri Lanka" වෙළඳ ප්‍රදර්ශනය 2025 වර්ෂයේදී දිවයිනේ සංචාරක ආකර්ෂණය දිනාගත් ආරුගම්බේ සහ මිරිස්ස වෙළඳ තීරයන් කේන්ද්‍ර කර ගනිමින් වෙළඳ කුටි 200 කට අධික ප්‍රමාණයකින් යුතුව පවත්වන ලදී. මෙයට අමතරව මෙම වසරේ ප්‍රාදේශීය වශයෙන් නාවින්නාන්වෙලි,ගම්පහ,රිදීමාලියද්ද, කල්මුනේ(උතුර), අඬඩලාච්චෙනෙයි දොඩංගොඩ යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කේන්ද්‍ර කර ගනිමින් වෙළඳකුටි 200 කට අධික ප්‍රමාණයකින් යුතුව "Made in Sri Lanka" වෙළඳ ප්‍රදර්ශන ක්‍රියාත්මක කරන ලදී.

**3. ප්‍රාදේශීය සම්මාන ප්‍රදානෝත්සව**

ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට විශිෂ්ඨ දායකත්වයක් ලබාදුන් ව්‍යවසායන් හඳුනාගැනීම සහ දිරිගැන්වීමේ අරමුණින් ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය මගින් ව්‍යවසායකත්ව සම්මාන උළෙල සංවිධානය කරනු ලබයි. මෙම සම්මාන ප්‍රදානයේ අරමුණ වනුයේ ප්‍රදේශයේ කැපී පෙනෙන ව්‍යවසායකයින් හඳුනාගැනීම හා ඇගයීමට ලක්කිරීමයි. 2025 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර, ඌව, උතුර, නැගෙනහිර සහ මධ්‍යම පළාත්වල පළාත් ව්‍යවසායකත්ව සම්මාන උළෙල පහක් සංවිධානය කල අතර ස්වභාවික ආපදාව හේතුවෙන් බස්නාහිර සහ උතුරු මැද පළාත්වල පමණක් මෙම සම්මාන උළෙලයන් පවත්වනලදී. අනෙකුත් පළාත්වල 2026 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට නියමිතයි.

## 4. "Made in Sri Lanka" ලාංඡනය ප්‍රවර්ධනය සහ පිරිනැමීම

දේශීය නිෂ්පාදිත නිෂ්පාදන සඳහා නිසි පිළිගැනීමක් නොමැතිකම සහ පාරිභෝගිකයින් අතර ආනයනික භාණ්ඩ සඳහා පවතින වැඩි මනාපයට ප්‍රතිචාර වශයෙන්, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් " Made in Sri Lanka " ලාංඡනය හඳුන්වා දෙන ලදී. නිෂ්පාදන සඳහා දේශීයත්වයේ මට්ටම නිරූපණය කිරීම, එමගින් දේශීයව නිෂ්පාදිත භාණ්ඩවල වෙළඳපල පැවැත්ම ප්‍රවර්ධනය කිරීම සහ අලෙවිය ඉහළ නැංවීම මෙහි අරමුණයි. 2025 වර්ෂයේ දී, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය විසින් ව්‍යවසායකයින් 50 දෙනෙකු සහ නිෂ්පාදන 146 ක් සඳහා මේඩ් ඉන් ශ්‍රී ලංකා ලාංඡනය පිරිනමන ලදි.

## 5. ග්‍රාමීය ව්‍යවසායකයින් මාර්ගගත අලෙවිකරණයට යොමු කරවීමේ වැඩසටහන

SME Connect (smeconnect.lk) යනු ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ සහයෝගීතාවයෙන් සහ Deloitte Sri Lanka හි උපදේශන සහාය ඇතිව ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය (NEDA) විසින් මෙහෙයවනු ලබන ඩිජිටල් වේදිකාවකි. 2022 අගභාගයේදී කාන්තා ව්‍යවසායකයින් සඳහා මූලපිරීමක් ලෙසින් දියත් කරන ලද මෙය, කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින් ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍යම ප්‍රමාණයේ ව්‍යවසායන් (MSMEs) නඟා සිටුවීම සඳහා විශේෂයෙන් නිර්මාණය කර ඇත. මෙම වේදිකාව සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම භාවිතා කල හැකි අතර සහ ජංගම-හිතකාමී වේ.

මෙම වේදිකාව මූලික අරමුණු තුනක් කෙරෙහි අවධානය යොමු කරයි. එනම් ඉගෙනීම, මාර්ගෝපදේශනය සහ ජාලකරණය වේ. එහි ඉගෙනුම් කටයුතු හරහා අලෙවිකරණය, මූල්‍ය, මානව සම්පත් සහ මෙහෙයුම් වැනි මාතෘකා ආවරණය වන පුහුණු මොඩියුල, ලිපි සහ වීඩියෝ පිරිනමයි. මේ හරහා ස්වේච්ඡා විශේෂඥයින් සහ පළපුරුදු ව්‍යවසායකයින් සමඟ සම්බන්ධ වීමට ඉඩ සලසන අතර එහි ජාලකරණ විශේෂාංග, සංසද, කතාබස්, බ්ලොග් සහ සිදුවීම් පිළිබඳ තොරතුරු බෙදාගන්නා අතර ව්‍යවසායකයින් සමග සම්බන්ධතා ඇති කර ගැනීමටත් අවස්ථාව සැලසේ.

## 6. B500 සන්නාම සංවර්ධන වැඩසටහන

ග්‍රාමීය ව්‍යවසායකයින් පුළුල් දේශීය හා ජාත්‍යන්තර වෙළඳපොළවල් සමඟ සම්බන්ධ කිරීමෙන් ඔවුන් සවිබල ගැන්වීම සඳහා NEDA මාර්ගගත අලෙවිකරණ මූලපිරීම් ප්‍රවර්ධනය කරයි. ප්‍රධාන අරමුණු වන්නේ ඩිජිටල් සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම, ඊ-වාණිජ්‍ය වේදිකා වෙත ප්‍රවේශය වැඩි දියුණු කිරීම සහ ග්‍රාමීය නිෂ්පාදනවල දෘශ්‍යතාව වැඩි කිරීමයි. ව්‍යවසායකයින්ට තම භාණ්ඩ මාර්ගගතව අලෙවි කිරීමට හැකියාව ලබා දීමෙන්, NEDA ආදායම් උත්පාදනය ඉහළ නැංවීම සහ කලාපීය ආර්ථික විෂමතා අඩු කිරීම අරමුණු කරයි.

මෙම මූලපිරීම නවීන ඩිජිටල් මෙවලම් සහ අලෙවිකරණ උපාය මාර්ග හරහා තිරසාර ව්‍යාපාර වර්ධනයට ද සහාය වේ. පුහුණු ව්‍යවසායකයින් 570 දෙනෙකු සඳහා ඩිජිටල් මෙවලම් සහ අලෙවිකරණ උපාය මාර්ග සම්බන්ධව පුහුණුව 2025 වර්ෂයේ ලබාදී ඇති අතර 180 දෙනකු මේ සඳහා යොමු කර ඇත.

**අභියෝග**

- **සීමිත කාර්ය මණ්ඩලය සහ පුරප්පාඩු පිරවීමේ ප්‍රමාදය**
  අනුමත පුරප්පාඩු පිරවීමේ ප්‍රමාදය සහ ප්‍රමාණවත් මානව සම්පත් නොමැතිවීම හේතුවෙන්, සේවා සැපයීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ MSME ව්‍යාපාරිකයන් වෙත ප්‍රවේශ වීම බාධා වීම සිදුවේ.

- **ව්‍යාපාරිකයන් අතර දුර්වල අවදානම් කළමනාකරණ ක්‍රම**
  බොහෝ ව්‍යාපාරිකයන්ට අවදානම් හඳුනාගැනීම, අවදානම් අඩු කිරීම සහ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් පිළිබඳ අවබෝධය සහ කුසලතා නොමැතිවීම හේතුවෙන්, ව්‍යාපාර අවදානම වැඩිවී ඇත.

- **ව්‍යාපාරිකයන් විසින් ගිණුම් පොත් නිසි ලෙස නඩත්තු නොකිරීම**
  වැදගත් ව්‍යාපාරිකයන් බොහෝ දෙනා නිසි මූල්‍ය වාර්තා පවත්වාගෙන නොයෑම හේතුවෙන්, ණය ලබාගැනීම, බදු අනුකූලතාව සහ දැනුවත් තීරණ ගැනීම සීමා වෙයි.

- **ඩිජිටල් විෂමතාව සහ අඩු ඩිජිටල් භාවිතය**
  සීමිත ඩිජිටල් සාක්ෂරතාව, ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැතිවීම සහ අවබෝධය අඩු වීම හේතුවෙන්, MSME ව්‍යාපාර වලින් සම්භාව්‍ය වශයෙන් සමාජිකව සක්‍රියව ඊ-වෙළඳාම් වේදිකා භාවිතා කරන්නේ සම්පූර්ණයෙන්ම 25% පමණක් වේ.

- **මූල්‍ය සාක්ෂරතාවයේ අඩුව**
  බදු, බලපත්‍ර, ව්‍යාපාර ලියාපදිංචිය සහ නියාමන අනුකූලතාව පිළිබඳ දැනුම නොමැතිවීම හේතුවෙන්, ව්‍යාපාරිකයන්ට මෙහෙයුම් සහ නීතිමය ගැටලු මතුවේ.

- **වෙළඳපොළ බඳු / අපනයන (සීමිත අපනයන දැනුම සහ වෙළඳපොළ ප්‍රවේශය)**
  MSME ව්‍යාපාරිකයන්ට අපනයන ක්‍රියාවලීන්, ප්‍රමිතීන් සහ ජාත්‍යන්තර වෙළඳපොළ පිළිබඳ ප්‍රමාණවත් නිරාවරණය නොමැතිවීම හේතුවෙන්, අපනයන වෙළඳාමට සහභාගී වීම අඩු මට්ටමක පවතී. අපනයන දැනුම සහ අපනයන ජාලවලට ඒකාබද්ධ වීම සීමිත වේ.

- **ප්‍රාදේශීය අසමානතාව සහ අසම ප්‍රවර්ධනය**
  නාගරික මධ්‍යස්ථාන වලින් පිටත ප්‍රදේශවල යටිතල පහසුකම් සහ සේවා හිඟය හේතුවෙන්, ග්‍රාමීය ප්‍රදේශවල ව්‍යාපාර වර්ධනය සහ ආර්ථික අවස්ථා සීමා වෙයි.

**ඉදිරි සැලසුම්**

- **Brain into Business** : විශ්වවිද්‍යාල සහ පුද්ගලික අංශයේ පර්යේෂණ කර්මාන්ත සමඟ සම්බන්ධ කර, දැනුම, කුසලතා සහ අදහස් ජීවිතිය ව්‍යාපාර ලෙස පරිවර්තනය කිරීම මගින් නවෝත්පාදන වාණිජීකරණය ශක්තිමත් කිරීම.
- **Brain into Business:** ජාතික ව්‍යවසායකත්ව සහ SME ප්‍රතිපත්ති සමඟ වෘත්තීය පුහුණු අධිකාරියේ (VTA) වැඩසටහන් සමානුකූල කිරීම.
- “Made in Sri Lanka” ලෙස ජාතිකව පිළිගත් ලාංඡනයක් සංවර්ධනය කර ප්‍රවර්ධනය කිරීමෙන්, නිෂ්පාදන හැඳුනුම්පත, ගුණාත්මකභාවය සහ ජාත්‍යන්තර වෙළඳපොළ පිළිගැනීම වැඩි කිරීම.

- ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ප්‍රදර්ශනය කිරීම, ව්‍යාපාරිකයන් හා ගනුදෙනුකරුවන් සම්බන්ධ කිරීම සහ ආයෝජන ආකර්ෂණය කිරීම සඳහා වාර්ෂික ජාතික සහ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සංවිධානය කිරීම.
- SME සහ ආරම්භක ව්‍යාපාර සඳහා නවෝත්පාදනය, මූල්‍ය සහාය, කුසලතා සංවර්ධනය සහ වෙළඳපොළ ප්‍රවේශය සපයන ඒකාබද්ධ පරිසරයක් ගොඩනැගීම.
- SME ව්‍යාපාරිකයන්ගේ Branding, Logo සහ Trade Fair සම්බන්ධතා ශක්තිමත් කිරීම.
- ග්‍රාමීය සහ නාගරික SME ව්‍යාපාරිකයන් වෙත ඉන්කියුබේෂන් පහසුකම් පහසු කරවීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික ඉන්කියුබේෂන් පහසුකම් ප්‍රවර්ධන ආයතනය (NIFA) ස්ථාපනය කිරීම.

## 2.9.3 ශ්‍රී ලංකා පේෂකර්ම හා ඇඟලුම් ආයතනය (SLITA)

### ප්‍රගතිය/ ජයග්‍රහණ

- සමස්ත ප්‍රගතිය 83-85% අතර මට්ටමක පවතින බව ඇස්තමේන්තු කර ඇත.
- පුහුණු සැපයීම, පරීක්ෂණ සේවා, සහ කර්මාන්ත නියැලීම් යන අංශවල ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කරයි.
- ඩිජිටල් පරිවර්තනය, පර්යේෂණ වාණිජකරණය සහ තිරසාර පද්ධති යන අංශවල මධ්‍යස්ථ ප්‍රගතියක් පවතී.

**කර්මාන්ත නවීකරණය සහ තාක්ෂණික දියුණුව**

**විෂය මාලා සහ කාර්මික 4.0 පෙළගැස්ම**

- නව උපාධි පාඨමාලාවක් සාර්ථක ලෙස ආරම්භ කර ඇත.
- කර්මාන්ත නැඹුරුවට අනුව විෂයමාලා සමාලෝචනය අවසන් කර ඇත.
- සේවා සහ නිශ්පාදන ඇගයීම් ඉලක්ක අභිබවා ඇත.

**තාක්ෂණික යාවත්කාලීන කිරීම්**

- අවශය ව්‍යාපෘති යෝජනා සාර්ථක ලෙස ඉදිරිපත් කර ඇත.
- තාක්ෂණික ව්‍යාපෘති අර්ධ වශයෙන් ක්‍රියාත්මක වේ.

**කර්මාන්ත සහායක වේදිකා**

- කාබන් පිය සටහන් දත්ත සමුදා සංවර්ධනය ක්‍රියාත්මක වෙමින් පවති.(50%)
- සෞඛ්‍ය සහ ආරක්ෂණ සහතික කිරිමේ ඒකකය ස්ථාපිත කර ඇති අතර ක්‍රියාත්මක වෙමින් පවති.

**පරීක්ෂණ සහ සේවා විවිධාංගිකරණය**

- විද්‍යා අමාත්‍යාංශයේ ජාතික ගුණාත්මක යටිතල පහසුකම් වයාපෘතිය හරහා පරීක්ෂණ ධාරිතාව පුලුල් වෙමින් පවතී.
- උසස් පරීක්ෂණ විෂය පථය හරහා වැඩිදියුණු කරන ලද කර්මාන්ත සහාය.

**පර්යේෂණ, නවෝත්පාදන සහ වාණිජකරණය**

- පර්යේෂණ සහ නවෝත්පාදන මධ්‍යස්ථානයේ වැඩකටයුතු අවසන් අදියරේ පවතී. (75%)
- තාක්ෂණ හුවමාරු මුලපිරීම්වල මූලික ප්‍රගතියක් පවතී.
- විශ්ව විද්‍යාල සහ කර්මාන්තය අතර පර්යේෂණ සහයෝගිතාවය තවදුරටත් ශක්තිමත් කළ යුතුව ඇත.

**ශ්‍රම බලකා සංවර්ධනය සහ පුහුණුව**

**පුහුණු වැඩසටහන්:**

- ඉල්ලුමට අනුව සකස් කළ පුහුණු වැඩ සටහන් සැලකිය යුතු ලෙස ඉලක්ක ඉක්මවා ගොස් ඇත.
- නියමිත පුහුණු වැඩසටහන්වල ප්‍රගතියක් පෙන්නුම් කළ ද අවසාන ඉලක්කයට පහතින් පවතී.
- අතත්‍ය (virtual) ඉගෙනුම් ක්‍රමවේදවල ප්‍රගතිය සීමිතය.

**ධාරිතා සහ වෘත්තීය සංවර්ධනය**

- කාර්ය මණ්ඩල ධාරිතා වර්ධන වැඩ සටහන්ත සාර්ථකව නිම කර ඇත.
- ජාත්‍යන්තර හුවමාරු සහයෝගිතා ආරම්භ කර ඇත.(අර්ධ ප්‍රගතිය)

**පූර්ව ඉගෙනුම් පිළිගැනිම**

- සහතික පත්‍ර 1000 ක ඉලක්කයෙන් 704 ක් නිකුත් කර ඇත.
- ශ්‍රම බලකා විධිමත් කිරිමට දායක වන වැඩ සටහන.

**කර්මාන්ත සම්බන්ධතා සහ අංශ ඒකාබද්ධ කිරිම**

- පරික්ෂණ සහ ඇගයීම් සේවා වාර්ෂික ඉලක්කයන් අභිබවා ඇත.
- වෘත්තිය මාර්ගෝපදේශන වැඩසටහන් ඉලක්ක ගත මට්ටමට වඩා ව්‍යාප්ත කර ඇත.
- පේෂකර්ම සහ ඇගලුම් අධ්‍යයන පීඨය සාර්ථකව ස්ථාපිත කර ඇත.
- මධ්‍යස්ථ ප්‍රගතියක් සහිතව සංස්කෘතික සහ ක්‍රීඩා කටයුතු පවත්වා ඇත.

**සුලු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ආධාර සහ සහතික කිරීමේ සේවා**

- සහතික කිරිමේ සේවා පුලුල් කිරිමේ ප්‍රගතිය 25% මට්ටමේ පවති.
- කුඩා සහ මධ්‍ය පරිමාණ වයාපාර අනුකූලතා සහාය ශක්තිමත් කිරිමට අවස්ථාව.

**ආයතනික කාර්යක්ෂමතාව සහ ඩිජිටල් පරිවර්ථනය**

- කාර්ය මණ්ඩල කාර්ය සාධන ඇගයිමේ ක්‍රමය අර්ධ වශයෙන් ක්‍රියාත්මක කර ඇත.
- වෙළඳපල ඉල්ලුම් විශ්ලේෂණය සිදුවෙමින් පවති.
- පාරිභෝගික විමසීම් අධීක්ෂණ ආරම්භ කර ඇත.
- CRM පද්ධති ක්‍රියාත්මක කිරිම මුල් අවධියේ පවති.
- බඳවා ගැනිමේ ඉලක්ක සාර්ථක ලෙස සම්පූර්ණ කර ඇත.

**මූල්‍ය තිරසාරත්වය සහ යටිතල පහසුකම් සංවර්ධනය**

- මෙහෙයුම් පිරිවැය අඩුකිරීම් සාක්ෂාත් කර ඇත.(10%)
- ප්‍රසම්පාදන කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් අඛණ්ඩව සිදු වෙමින් පවතී.
- මායිම් තාප්පය ප්‍රතිසංස්කරණය සම්පූර්ණ කර ඇත.
- රසායනාගාර සහ ශිෂ්‍ය පහසුකම් පුලුල් කිරීම සිදුවෙමින් පවතී.
- තිරසාර බල ශක්ති මුලපිරීම් ප්‍රගතියක් ලබමින් සිටියි.(50%)

**ප්‍රධාන ජයග්‍රහණ**

- නව උපාධි වැඩසටහන දියත් කර ඇත.
  පේෂකර්ම සහ ඇගලුම් අධ්‍යයන පීඨය ස්ථාපිත කර ඇත.
- පරික්ෂණ සේවා කර්මාන්ත ඉල්ලුම අභිබවා ගොස් ඇත.
- කර්මාන්ත කේන්ද්‍ර කරගත් අභිරුචිකරණය (customized)කරන ලද පුහුණුව පුලුල් කර ඇත.
- සෞඛ්‍ය සහ ආරක්ෂාව සඳහා සහතික කිරීමේ ඒකකයක් ස්ථාපිත කර ඇත.
- යටිතල පහසුකම් සහ ආරක්ෂක වැඩි දියුණු කිරීම් අවසන් කර ඇත.
  මෙහෙයුම් පිරිවැය ඉතිරිකිරීම් ළගා කර ඇත.

**අවධානය යොමුකළ යුතු ක්ෂේත්‍ර**

- සම්පූර්ණ කර්මාන්ත 4.0 විෂය මාලා පරිවර්ථනය
- ඩිජිටල් පද්ධති ක්‍රියාත්මක කිරීම වේගවත් කිරීම.
- පර්යේෂණ වාණිජකරණය සහ නවෝත්පාදන ප්‍රතිදානයන් ශක්තිමත් කිරීම.
- අතථ්‍ය (virtual) ඉගෙනීම සහ ජාත්‍යන්තර හවුල් කාරිත්වයන් පුළුල් කිරීම
- RPL සහතික කිරීමේ සම්පූර්ණ කිරීම් වැඩි කිරීම.
- කාබන් පිය සටහන් දත්ත සමුදාය අවසන් කිරීම

**අභියෝග**

- පුහුණුව සහ අධ්‍යාපනය අතර පරතරය - කර්මාන්ත අවශ්‍යතා සමග සමපාත වන පරිදි පුහුණු වැඩසටහන් අඛණ්ඩව යාවත්කාලීන කිරීම අවශ්‍ය වේ.
- ගෝලීය තරඟකාරිත්වය - බංගලාදේශය, ඉන්දියාව වැනි රෙදිපිළි සහ ඇඟලුම් අංශයේ අනෙකුත් අඩු වියදම් නිෂ්පාදන රටවලින් තරඟකාරිත්වය වැඩිවීම.
- ඇමරිකා එක්සත් ජනපදය වැනි සමහර රටවල් විසින් ඇඟලුම් නිෂ්පාදන සඳහා ඉහළ බදු අනුපාත පැනවීම.
- පාසල් නිල ඇඳුම් පරීක්ෂණ ව්‍යාපෘතිය අහිමිවීම.
- ක්ෂේත්‍රයේ සුදුසුකම් ලත් විශේෂඥ කාර්ය මණ්ඩලය රඳවා ගැනීමේ අපහසුතාවය.

**ඉදිරි සැලසුම්**

- තාක්ෂණවේදී උපාධිය (B-Tech) සහ විලාසිතා නිර්මාණකරණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය (Bsc in Fashion Design) යන උපාධි පාඨමාලා තුන ආරම්භ කිරීම.
- සියලුම ඩිප්ලෝමා සහ උසස් ජාතික ඩිප්ලෝමා NVQ ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීම.
- පුස්තකාලය, ශ්‍රවණාගාරය සහ විලාසිතා නිර්මාණ මැදිරිය සඳහා නව ගොඩනැගිලි සංකීර්ණය ප්‍රතිසංස්කරණය කිරීම.
- පුහුණු, උපදේශන, පරීක්ෂණ සහ තාක්ෂණික සේවා ක්ෂේත්‍රවල තරඟකාරී සේවා සැපයීම සඳහා ජාත්‍යන්තරව සහ ආයතනික සහ ආයතනික සම්බන්ධතා සහ ජාලකරණ පහසුකම් වැඩිදියුණු කිරීම.
- විදේශීය අධ්‍යයන ආයතන සමඟ සම්බන්ධතා පැවැත්වීම.
- පර්යේෂණ සංවිධානය කිරීම, ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ පැවැත්වීම වැනි පර්යේෂණ කටයුතු පුළුල් කිරීම.
- යෝජිත රසායනාගාර පහසුකම් පුළුල් කිරීම.
- ළමා ඇඳුම් සඳහා සෞඛ්‍ය සහ ආරක්ෂක සහතිකය.
- නිෂ්පාදන සහ ක්‍රියාවලි සහතික කිරීම ලබා දීම.
- පර්යේෂණ කාර්යාලයක් ස්ථාපිත කිරීම.
- කාබන් පියසටහන් දත්ත පදනමක් ස්ථාපිත කිරීම.
- සුනිත්‍ය බලශක්ති විසඳුමක් ක්‍රියාත්මක කිරීම.
- භෞතික පන්ති කාමරයක් ස්ථාපිත කිරීම.
- පාරිභෝගික සම්බන්ධතා කළමනාකරණ පද්ධතිය (CRM) සහ පාරිභෝගික විමසීම් අධීක්ෂණ පද්ධතියක් ස්ථාපිත කිරීම.
- Self financial ආයතනයක් බවට පත් කිරීම.
- විභාගශාලා දෙකක් ස්ථාපිත කිරීම.
- අන්තර්ජාලගත ක්‍රමයට (Vertual) පාඨමාලා ආරම්භ කිරීම.
- LMS පද්ධතියට පාඨමාලා ඇතුලත් කිරීම.

## 2.9.4 ජාතික ශිල්ප සභාව (NCC)

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

**1. ප්‍රගතිය**

- ලියාපදිංචි කරන ලද හස්ත කර්මාන්ත ශිල්පීන් සංඛ්‍යාව -1009
- නිකුත් කළ හැඳුනුම්පත් සංඛ්‍යාව - 861
- පිහිටුවනු ලැබූ ප්‍රාදේශීය ශිල්ප සමාජ සංඛ්‍යාව - 08
- පිහිටුවනු ලැබූ දිස්ත්‍රික් ශිල්ප සමාජ සංඛ්‍යාව - 25
- පිහිටුවනු ලැබූ පළාත් ශිල්ප සමාජ සංඛ්‍යාව - 09
- ශිල්පීය පුහුණු ව්‍යාපෘතිය මගින් පූර්ණ කාලීනව පුහුණුව ලැබූ ආධුනික සංඛ්‍යාව - 569
- ගුරු ශිල්පී පුහුණු වැඩසටහන යටතේ පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව - 262

- විශේෂ පුහුණු වැඩසටහන් යටතේ පුහුණුව ලැබූ ආධුනිකයින් සංඛ්‍යාව - 448
- පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ නිර්මාණ සංවර්ධන වැඩසටහන් සංඛ්‍යාව - 20
- "ශිල්ප අභිමානී" පලාත් හස්ත කර්මාන්ත තරඟය - ජයග්‍රාහී නිර්මාණ සංඛ්‍යාව - 2540
- "ශිල්ප අභිමානී" ජාතික හස්ත කර්මාන්ත තරඟය - ජයග්‍රාහී නිර්මාණ සංඛ්‍යාව - 540
- අපනයන මට්ටමේ ව්‍යවසායකයින් බවට පත් කිරීම සඳහා තෝරාගනු ලැබූ ශිල්පීන් සංඛ්‍යාව - 24
- ස්වයං රැකියා ආරම්භ කිරීම සඳහා පහසුකම් ලබාදුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 129
- සංවර්ධනය කළ හා උපකරණ ලබා දුන් ශිල්පීය පුහුණු හා නිෂ්පාදන මධ්‍යස්ථාන සංඛ්‍යාව - 08
- මානව සම්පත් සංවර්ධන වැඩසටහන් යටතේ පුහුණුව ලබා දුන් නිලධාරීන් සංඛ්‍යාව - 18
- දේශීය හා විදේශීය අළෙවි ප්‍රවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද පළාත් / දිස්ත්‍රික් අළෙවි ප්‍රවර්ධන වැඩසටහන් සංඛ්‍යාව - දේශීය 19 , විදේශීය 01- මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 517
- පවත්වන ලද ශිල්පීය හුවමාරු වැඩසටහන් සංඛ්‍යාව - 01
- සංවර්ධනය කරන ලද ලක්ශිල්ප අලෙවි මධ්‍යස්ථාන සංඛ්‍යාව - 02
  ( නුවර- පල්ලෙකැලේ, ගාල්ල- සිජ්නාරා)
- අමුද්‍රව්‍ය පහසුකම් ලබාදුන් ශිල්පීන් සංඛ්‍යාව - 115
- සහනදායී ණය පහසුකම් ලබාදුන් ශිල්පීන් සංඛ්‍යාව- 127
- වෙනත් මූල්‍ය නොවන වැඩසටහන් යටතේ පහසුකම් ලබා දුන් ප්‍රතිලාභීන් සංඛ්‍යාව - 305

**අභියෝග**

- හස්ත කර්මාන්ත ආශ්‍රිත අමුද්‍රව්‍ය හිඟකම සහ මිල අධික වීම.
- නවීන තාක්ෂණය උපයෝගී කිරීමට ශිල්පීන් දක්වන අකැමැත්ත හා නව තාක්ෂණය භාවිතය අවම මට්ටමක පැවතීම.
- දේශීය හා විදේශීය වෙළඳපොලට ගැලපෙන නිර්මාණ ඉදිරිපත් කිරීමට ශිල්පීන් අසමත් වීම.
- නූතන පරම්පරාව හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයට පිවිසීමට ඇති අකැමැත්ත.
- හස්ත කර්මාන්ත නිෂ්පාදන අළෙවි කිරීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් නොමැති වීම, මූල්‍ය පහසුකම් ලබා ගැනීමේ අපහසුතා පැවතීම
- විදේශීය රටවල හස්ත කර්මාන්ත නිර්මාණයන්හි මිල සාපේක්ෂව අඩුවීම.
- හස්ත කර්මාන්ත නිර්මාණ අපනයනය කිරීම සඳහා විදේශ වෙළඳපොල සම්බන්ධීකරණය කර ගැනීමට ඇති ගැටළු

**ඉදිරි සැලසුම්**

- වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රයෙන් කරනු ලබන දායකත්වය 50%කින් ඉහළ නැංවීම
- වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත ස්වයං රැකියා 4000 ක් ජනිත කිරීම
- වසර 2030 වන විට හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත තරුණ හා කාන්තා ව්‍යවසායකයින් 400ක් නිර්මාණය කිරීම.
- වසර 2030 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙහි හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය ආශ්‍රිත අපනයන කොටස 50% කින් ඉහළ නැංවීම

## 2.9.5 ජාතික මෝස්තර මධ්‍යස්ථානය (NDC)

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

නව නිර්මාණ, නිෂ්පාදන හා ධාරිතා සංවර්ධනය

- හස්තකර්මාන්ත ක්ෂේත්‍රය සඳහා සිදුකරන ලද නිර්මාණ සැලසුම් සංඛ්‍යාව 431කි. ඉන් 126 හස්තකර්මාන්ත ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.
- සංරක්ෂණය, නව නිර්මාණ සහ ප්‍රදර්ශන සඳහා විශේෂ සාම්ප්‍රදායික ශිල්පීන් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය හැකියාවන් වර්ධනය කිරීම මූලික කොට පහළ හපුවිද හා මවුස්සාගොල්ල ලාක්ෂා ගම්මාන වල ශිල්පීන් 32කට අමුද්‍රව්‍ය පහසුකම් ලබාදෙන ලදි.
- ශිල්පීන් 13 දෙනෙක් සඳහා සංකල්ප, සැලසුම් සහ නව නිර්මාණ 60ක් ලබා දී ඇත.
- 555 දෙනෙක් සඳහා ආයතනය තුළ පොදු පහසුකම් සේවා ලබාදී ඇත.
- ලාක්ෂා කර්මාන්තය හා වෙස්මුණු ආශ්‍රිත වෙළඳපොළ පර්යේෂණ වැඩසටහන් 02ක් පවත්වා ඇත.
- ප්‍රතිලාභීන් 333 දෙනෙක් සඳහා බලපිටිය කොහු ආශ්‍රිත අදියර 02කින් වැඩසටහනක්, මහනුවර සම් ආශ්‍රිත,යාපනය තල්කොළ හා ආභරණ ආශ්‍රිත වැඩසටහන් 02, අම්පාර රෙදිපිළි හා කෑගල්ල උණ ආශ්‍රිත, අනුරාධපුර බතික් වැඩසටහනක්,මොනරාගල වේවැල් හා කළුතර- හොරණ- පොල්කටු හා දැව ආශ්‍රිත පුහුණු වැඩසටහන් 09ක් හා ඉල්ලීම් මත වැඩසටහන් 04ක් පවත්වා ඇත.
- නව සංකල්ප ගොඩනැගීම සඳහා අත්කම් නිර්මාණ පිළිබඳ දැනුවත්භාවය සහ අත්දැකීම් ලබා දීම සඳහා - “We are the Design” / “ හැඩවැඩ සටහන” නමින් බලපිටිය, මහනුවර හා කැකිරාව වැඩසටහන් 04ක් පවත්වා දේශීය, විදේශීය සංචාරකයින් හා පාසල් සිසුන් 447 දෙනෙක් සඳහා දේශීය ශිල්ප හා අත්කම් දැනුම ලබාදෙන ලදි.
- ආයතනයේ වැඩහල තුළ කෙටි කාලීන පාඨමාලා හරහා ප්‍රතිලාභීන් 32 ක් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදී ඇති අතර විශ්ව විද්‍යාල සිසුන් 32 කට ආයතනයේ වැඩහල තුළ නව නිර්මාණ/ තාක්ෂණ දැනුවත්භාවය ලබා දී ඇත.
- හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන 52ක් සඳහා අලෙවිකරණය පිළිබඳ දැනුවත්භාවය ලබාදීම සඳහා වැඩසටහනක් පවත්වන ලදි.

**පර්යේෂණ හා සංවර්ධනය**

- බතික් සඳහා GMP ලබාගැනීමට නිරීක්ෂනයන් සිදු කර කර්මාන්තකරුවන් දෙදෙනෙකුට අවශ්‍ය උපදෙස් ලබාදෙන ලදි.
- තල්කොළ අත්කම් සඳහා යෙදිය හැකි දිලීර නාශක දියරයක් පිළිබඳව ශිල්පීන් 47 දෙනෙකු දැනුවත් කරන ලද අතර, තල්කොළ ඉරීමේ යන්ත්‍රයක් සඳහා සකසන ලද පර්යේෂණ මූලාකෘතිය ශිල්පීන්ට ඉදිරිපත් කරමින් එය සංවර්ධනය සඳහා කෂේත්‍ර අවශ්‍යතා හඳුනාගන්නා ලදි.
- 'ජෛව ප්‍රතිකර්ම භාවිතයෙන් බතික් අපජලය පිරිපහදු කිරීමේ හැකියාව සොයාබැලීම' යටතේ මොරටුව විශ්වවිද්‍යාලය සමඟ පර්යේෂණයක් ආරම්භ කරන ලදි.

- උණ බම්බු ජල බෝතල් ව්‍යාපෘතියේ පර්යේෂණ ප්‍රතිඵල මත පදනම්ව, මෙම නිර්මාණ අවශ්‍යතාවය දිගටම කරගෙන යාම සඳහා විකල්ප ක්‍රමයක් ලෙස NDC වැඩහල මෙහෙයවමින් වීදුරු බෝතල් සඳහා උණ බම්බු පිටත ආවරණ සාම්පල 09 ක් නිර්මාණය කරන ලදී.
- NWS&DB රොන්මැටි මහයාල මැටි පුහුණු මධ්‍යස්ථානයට ලබා දීමට පහසුකම් සලසා එය ශිල්පීන්ගේ භාවිතය සඳහා සකස් කර දෙන ලදි. එහිදී ශිල්පීන් 15 දෙනෙකු සඳහා IDB මගින් ලබාගත් මැටි පහන් සෑදීමේ යන්ත්‍රය හඳුන්වාදෙන ලදි.
- අම්පාර ප්‍රදේශයේ ජල පිරිපහදු ඒකක 02කින් ඉවතලන රොන්මැටි විසිතුරු අත්කම් සඳහා භාවිතා කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම සඳහා අධ්‍යයනයක් සිදු කරමින් උහන මැටි ගම්මානයට එම අමුද්‍රව්‍ය රැගෙන ගොස් අත්හදා බලන ලද අතර ඒ සඳහා ශිල්පීන් 13ක් සම්බන්ධ විය.

**පර්යේෂණ හා සංවර්ධනය :**

ශාකසාර අවශේෂ භාවිතයෙන් ස්වභාවික වර්ණක නිෂ්පාදන ක්‍රියාවලිය හඳුනාගැනීම සහ වානිජකරණය කිරීමේ ව්‍යාපෘතිය

- අමාත්‍යාංශ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කල ශාක සාර අවශේෂ මගින් ස්වභාවික වර්ණක සැකසීම පිලිබඳ පර්යේෂණ ප්‍රතිඵල මත කරාබු නැටි අවශේෂ මගින් වර්ණක නිපදවීමට අදාලව පේටන්ට් බලපත්‍රයකට කර්මාන්ත අමාත්‍යාංශය/ ජා.මෝ.ම. නම් ඇතුලත්ව අයදුම් කරන ලදි.
- ස්වභාවික වර්ණක යොදා බතික් රෙදි සාම්පල 12ක් සකස් කර ප්‍රදර්ශණය කරන ලදි.

**හස්ත කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම**

- වෙළඳපොළට නිරාවරණය කරන ලද නව නිර්මාණ සංඛ්‍යාව 208කි. හස්තකර්මාන්ත ප්‍රවර්ධනය සඳහා සිංහල හින්දු අලුත් අවුරුදු සඳහා නිෂ්පාදන පෙළක් ඉදිරිපත් කිරීම, ලාක්ෂා කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම හා සංරක්ෂණය කිරීමට අදාල වීඩියෝ වැඩසටහන හා හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 06 කට අදාල සාම්පල පුවරු සැකසීම
- දේශීය හා විදේශීය සංචාරකයින් ඉලක්ක කර නව නිර්මාණ ප්‍රවර්ධනය වැඩසටහන් 04ක් හා SLITA Runway-2025 හා සම්බන්ධ වී දේශීය අත්කම් නිර්මාණ සමඟ විලාසිතා දැක්ම පැවැත්වීමට කටයුතු කරන ලදි.
- නව නිර්මාණ 43ක් වෙළඳපළට හඳුන්වා දෙන ලද අතර ශිල්පින් 23ක් වෙළඳපළට සම්බන්ධ කරන ලදි
- සංචාරක ආකර්ෂණය ඉහළ නැංවීම සඳහා නත්තරම්පොත ශාඛා කාර්යාල පරිශ්‍රයේ සිදුකිරීමට සැලසුම් කරන ලද සංවර්ධන කටයුතු සිදුකර කැනඩා විශ්වවිද්‍යාලයක හා දේශීය සමාජ අධ්‍යයනයන්හි නිරත සිසුන් 30 දෙනෙක් ට නත්තරම්පොත වැඩහල නිරීක්ෂණය කිරිමට හා ප්‍රායෝගික ශිල්ප අත්දැකීම් ලබාදීමට කටයුතු කර ඇත.
- බතික්, විසිතුරු ආභරණ, උණ හා වේවැල්, පිත්තල හා සම් ආශ්‍රිත හස්ත කර්මාන්ත ක්ෂේත්‍ර 05 ශිල්පීන් 44 දෙනෙක් සංවර්ධනය කිරීමට කටයුතු කරන ලදි.
- "ලංකාර" නමින් නිර්මාණ ප්‍රදර්ශනය ලාක්ෂා නිර්මාණ මුලකරගෙන මහනුවර කැන්ඩි සිටි සෙන්ටර් හිදී නොවැම්බර් මස 21 සිට දින03ක් පවත්වන ලදි. එහිදි ලාක්ෂා නිර්මාණ 73ක් එළිදැක්වීමට, ලාක්ෂා කර්මාන්තය අළලා සකසන ලද වීඩියෝ පටය මහජනතාවට නිරාවරණය කිරීමට හා හස්ත කර්මාන්ත ශිල්පින් 50 දෙනෙක් සඳහා අලෙවි අවස්ථා ලබාදීමට කටයුතු කරන ලදි.

**නිර්මාණ අංශය සඳහා ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම**

- ජාතික පිරිනිර්මාණ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා සිසුන් 74ක් බඳවා ගන්නා ලදි.
- පෙර වර්ෂයේ පාඨමාලා නිමකල ඩිප්ලෝමාධාරීන් 79 දෙනෙක්ට සහතික ප්‍රදානය 2025.11.10 වන දින BMICH හිදි පවත්වන ලදි.

**නිර්මාණ උපදේශන සේවා**

- මිත්‍ර විභූෂණ සම්මානය නිර්මාණය ඇතුලු නිර්මාණ උපදේශන සේවා 09ක් රාජ්‍ය හා පෞද්ගලික ආයතන වල ඉල්ලීම මත සිදුකරන ලදි.

**ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මෝස්තර වල උරුමය ප්‍රතිපෝෂණය කිරීම**

- ඓතිහාසික වැදගත්කමකින් යුත් නිර්මාණ සහිත ස්ථාන 07ක්, ක්ෂේත්‍ර නිරීක්ෂන කටයුතු සිදුකර අදාල නිර්මාණ වල ඡායාරූප 1475 ක් ලබාගෙන තේරීමේ ක්‍රියාවලියට යොමු කර මෙම වසරේ  නිර්මාණ 25 ක් තෝරාගෙන ඇත.

**අභියෝග**

- කාර්යමණ්ඩල හිඟතාවය හා පුරප්පාඩු පිරවීමට අවස්ථාව නොමැතිවීම

**ඉදිරි සැලසුම්**

- හස්ත කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා නිර්මාණ 165ක් සැලසුම් කිරීම හා පර්යේෂණාත්මක අත්හදා බලමින් සාම්පල 300 නිම කිරීම
- ශිල්පීන් 280 දෙනෙක් සඳහා නව නිර්මාණ/ නව තාක්ෂණික ධාරිතා සංවර්ධන වැඩසටහන් 14ක් පැවැත්වීම
- ආයතනයේ වැඩහල තුළ කෙටි කාලීන පාඨමාලා හරහා ප්‍රතිලාභින් 50 ක් සඳහා ප්‍රායෝගික පුහුණුව ලබාදීමට හා   විශ්ව විද්‍යාල සිසුන් 20 දෙනෙකුට ආයතනයේ වැඩහල තුළ නව නිර්මාණ/ තාක්ෂණ දැනුවත්භාවය ලබා දීම
- තෝරාගත් හස්තකර්මාන්ත ශිල්පීන්  200කට , නිර්මාණකරණයේ අභියෝගවලට මුහුණ දීමට අවශ්‍ය දැනුම වර්ධනය කිරීම සඳහා වැඩසටහන් 04ක් පැවැත්වීම
- පාසල් සිසුන් 50කගේ නිර්මාණකරණයට අදාල ගවේෂණාත්මක චින්තන හැකියාව වැඩිදියුණු කිරීම සඳහා වැඩසටහනක් පැවැත්වීම
- පර්යේෂණ හා සංවර්ධනයට අදාල නව සොයාගැනීම් හා අමුද්‍රව්‍ය/ක්‍රියාවලි/යන්ත්‍ර ආශ්‍රිත සංවර්ධන කිරීම් 02ක් සිදුකිරීම
- ශිල්පීන් සංඛ්‍යාව 150කට නව තාක්ෂණයන්, ක්‍රියාවලි සහ ද්‍රව්‍ය පිළිබඳ දැනුවත්භාවය ලබාදීම
- අලෙවි පර්යේෂන වැඩසටහන් 02ක් සිදුකිරීම
- හස්තකර්මාන්ත ප්‍රවර්ධනය සඳහා ප්‍රවර්ධන වැඩසටහන්  06 ක් සිදුකිරීම
- නව නිර්මාණ 20ක් වෙළඳපළට හඳුන්වාදීම හා  ශිල්පින් 20ක් වෙළඳපළට සම්බන්ධ කිරීම
- නව නිර්මාණ  200ක් වෙළඳපොළට නිරාවරණය කිරීම

- හස්තකර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන 50ක් සඳහා අලෙවිකරණය පිළිබඳ දැනුවත්භාවය ලබාදීම සඳහා වැඩසටහනක් 02ක් පැවැත්වීම
- සමරු නිර්මාණ මූලික කොට නිර්මාණ තරඟාවලියක් පැවැත්වීම හා ඒ හරහා ඉහළ මට්ටමේ නිර්මාණ 50ක් සමාජගත කිරීම
- හණ හා දුම්බර රටා ආශ්‍රිත ශිල්පින් 40 දෙනෙක් සඳහා නිර්මානකරනය පිළිබඳ දැනුම්වත්භාවය ලබාදීම සඳහා සංවාදාත්මක වැඩසටහන් පෙළක් සිදුකිරීම හා එය සමාජගත කිරීම
- හණ හා දුම්බර රටා නිර්මාණ 200ක් එළිදැක්වීම මූලික කොට "ලංකාර" -2026 නිර්මාණ ප්‍රදර්ශණය පැවැත්වීම හා ජයග්‍රාහී සමරු නිර්මාණ පෙළක් එළිදැක්විම
- නිර්මාණ ක්ෂේත්‍ර යේ පාඨමාලා සඳහා සිසුන් 130 දෙනෙක් බඳවා ගැනීම
- උපදේශන සේවා 05ක් සිදුකිරිම

## 2.9.6 මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය (GJRTI)

**ප්‍රගතිය/ ජයග්‍රහණ**

- රජය සතු ඉඩම් වල පවතින මැණික් තැන්පතු සහ ඒවායේ පිහිටීම නවීන විද්‍යාත්මක හා නිරවද්‍ය ක්‍රමවේද හරහා හඳුනාගැනීම පිණිස ත්‍රිමාණරූපී භූ රසායනික හා භූ භෞතික ආකෘතීන් (Three-Dimensional Geochemical and Geophysical models) ගොඩනැංවීම සඳහා කැළණි සහ දැදුරු ඔය ගංගා නිම්න ආශ්‍රිතව අධ්‍යයනයන් සිදුකිරීම
- මේ හරහා මැණික් කැණීම් ප්‍රමාණය වැඩිකිරීම සඳහා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය හා ඒකාබද්ධව ස්ථාපනය කළ කමිටුවෙහි කටයුතු ක්‍රියාත්මක කිරීම
- පළුදු හා වටිනාකමින් අඩු මැණික් සඳහා එකතු කළ අගය වැඩි කිරීම වෙනුවෙන් විකිරණ ප්‍රතිකර්ම ඇතුළුව තාක්ෂණික ප්‍රතිකර්ම තීව්‍ර කිරීම හා ප්‍රතිකර්ම සිදුකරන ලද මැණික් වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේද ඉදිරිපත් කිරීම
- පර්යේෂණ රසායනාගාර ජාත්‍යන්තර වශයෙන් පිළිගැනීමක් ඇති කිරීමට නිසි පරිදි ප්‍රතීතනයට කටයුතු කිරීම.
- අතීතයේ මුතු කර්මාන්තය ශ්‍රී ලංකාව ආශ්‍රිතව ප්‍රචලිතව පැවැති අතර නැවත මෙරට මුතු වගා කිරීම පිළිබඳ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීම.
- ස්වර්ණාභරණ නිෂ්පාදනය සඳහා නැනෝ-වර්ණ රන් මිශ්‍ර ලෝහයක් (Nano colour gold alloy) හඳුන්වාදීම
- ශ්‍රී ලාංකික පාරම්පරික ආභරණ මෝස්තර පිළිබඳ නාමාවලියක් සකස් කිරීම
- මැණික් සහ ස්වර්ණාභරණ තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සම්මත ප්‍රතීතනය (standard accreditation) සඳහා AI ශ්‍රේණිගත කිරීමේ මෙවලම් ස්ථාපිත කිරීම.
- පර්යේෂණ ව්‍යාපෘතින් හරහා හඳුනාගන්නා ලද නව තාක්ෂණය කර්මාන්තගත කිරීම සඳහා 2025 ජාත්‍යන්තර පර්යේෂණ සම්මන්ත්‍රණය පැවැත්වීම සහ ගෙවුඩ තාප පිරියම්කරණය පිළිබඳ පර්යේෂණාත්මක ග්‍රන්ථයක් සකස් කිරීම.

- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාළ නව පාඨමාලා හඳුන්වාදීම සහ පවතින පාඨමාලා සංඛ්‍යාව වර්ධනය කිරීම හරහා රත්න විද්‍යාව විෂයය සඳහා NVQ 4 / 5 ප්‍රතිතන මට්ටම සකස් කිරීම අවසන් කිරීම හා මැණික් කැපීම හා ඔප දැමීම විෂයය සඳහා NVQ Level-5 මට්ටමට පාඨමාලා සංවර්ධනය කිරීමට කටයුතු කිරීම.
- බ්‍රිතාන්‍ය මැණික් විද්‍යා සංගමයේ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුසුකම් සපුරන GEM A පදනම් හා ඩිප්ලෝමා පාඨමාලා ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම හරහා කර්මාන්තයේ ජාත්‍යන්තර සුදුසුකම් සපුරා ගැනීම හරහා වෘත්තීයත්වයට පත් වීමට අවස්ථාව සලසා ගැනීම
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට අදාල මූලික සහතික පත්‍ර හා ඩිප්ලෝමා සුදුසුකම ලබා ගන්නා සිසුන් සඳහා උපාධි මට්ටමේ පාඨමාලා සංවර්ධනය කිරීමේ කටයුතු සබරගමුව, මොරටුව, ඌව වෙල්ලස්ස හා විවෘත විශ්ව විද්‍යාල යන අනෙකුත් විශ්ව විද්‍යාල සමග සහයෝගිතාවයෙන් යුතුව ආරම්භ කිරීම.
- කුඩා මැණික් නිරවද්‍යතාවයෙන් කැපීමේ නව පුහුණු ඒකකය හා පාඨමාලා ආරම්භ කිරීමට කටයුතු කිරීම හරහා මෙරට කුඩා මැණික් කැපීමේ තාක්ෂණය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.
- ශිෂ්‍ය ඉගෙනුම් අධ්‍යයන ක්‍රියාවලියක් Learning Management System (LMS) හඳුන්වා දීම සඳහා මූලික කටයුතු ඉටු කිරීම
- වාර්ෂිකව පුහුණුව ලබාගන්නා සිසුන් සංඛ්‍යාව සැලකිය යුතු ලෙස වැඩිකර ගැනීමට හැකිවීම හරහා පුහුණු ලාභීන් 1383 ක් පාඨමාලා සඳහා බඳවා ගැනීමට කටයුතු කර වර්ෂ අවසාන වන විට අවසන් වී නොමැති පාඨමාලාද ක්‍රියාත්මක වන අතරම සිසුන් 295 ක් සාර්ථකව පාඨමාලා අවසන් කර කර්මාන්තයට හඳුන්වා දීම.
- ක්ෂේත්‍රයේ කර්මාන්ත ආයතන සහ අනෙකුත් පුහුණු ආයතන සමඟ සම්බන්ධතා වර්ධනය කරමින් පුහුණු අවස්ථා පුළුල් කිරීම
- මැණික් හඳුනා ගැනීම, මැණික් කැපීම සහ ඔප දැමීම, ස්වර්ණාභරණ ප්‍රමිතිකරණය, තත්‍යාංකනය, ව්‍යාජ රන් භාණ්ඩ හඳුනා ගැනීම සහ රන් භාණ්ඩ උකස් කිරීමේ ක්‍රමවේදයන් පිළිබඳ පුහුණු වැඩමුළු බැංකු පද්ධතිය කේන්ද්‍ර කරගනිමින් පැවැත්වීමට කටයුතු කිරීම හරහා කර්මාන්තයට නිවරදි දැනුම ලබා දීමට කටයුතු කිරීම.

**අභියෝග**

- විශේෂඥයින්ගේ හිඟය - උසස් පරීක්ෂණ ක්‍රම පිළිබඳව ප්‍රවීණතාවයෙන් යුත් ප්‍රමාණවත් පුහුණුව ලත් මැණික් විද්‍යාඥයින්, පර්යේෂකයින් සහ කාර්මිකයින් නොමැතිකම.
- කාර්ය මණ්ඩල වැටුප් - ඉහළ කුසලතා ඇති මැණික් විද්‍යාඥයින්, පර්යේෂකයින් සහ කාර්මිකයින් සේවයේ යෙදවීම සහ රඳවා ගැනීම මූල්‍යමය වශයෙන් ඉල්ලුමක් ඇති කළ හැකිය.
- පරිභෝජන ද්‍රව්‍ය සහ උපයෝගිතා - රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය, පරීක්ෂණ සඳහා මැණික් ගල් නිතිපතා මිලදී ගැනීම සහ නවීන උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ උපයෝගිතා බිල්පත්.
- පුහුණු පිරිවැය - තාක්ෂණික දියුණුව සමඟ ඉදිරියට යාම සඳහා කාර්ය මණ්ඩලය සඳහා අඛණ්ඩ පුහුණුව සහ කුසලතා සංවර්ධනය වියදම් වලට එකතු වේ.
- උපකරණවල ඉහළ පිරිවැය - වර්ණාවලීක්ෂ, අන්වීක්ෂ සහ ලේසර් පද්ධති වැනි උසස් මැණික් විශ්ලේෂණය සහ පරීක්ෂණ උපකරණ ප්‍රසම්පාදනය සහ නඩත්තු කිරීම මිල අධිකය.

- පර්යේෂණ සහ සංවර්ධන සඳහා සීමිත සම්පත් - නව්‍ය පර්යේෂණ ව්‍යාපෘති සඳහා ප්‍රමාණවත් අරමුදල් සහ පිරිස් වෙන් කිරීමේ දුෂ්කරතාවය.
- තාක්ෂණ වැඩිදියුණු කිරීම් - මැණික් විද්‍යාත්මක පර්යේෂණවල දියුණුව සමඟ ඉදිරියට යාම සඳහා නිතිපතා වැඩිදියුණු කිරීම් මිල අධිකය.
- තාක්ෂණික අභියෝග - මැණික් සම්භවය, ප්‍රතිකාර හෝ නව තාක්ෂණයන් පිළිබඳ පර්යේෂණ කාලය ගතවන සහ සම්පත් දැඩි විය හැකිය.
- පරිභෝජන සහ උපයෝගිතා - රසායනාගාර පරිභෝජන ද්‍රව්‍ය නිතිපතා මිලදී ගැනීම, පරීක්ෂණ සඳහා මැණික් ගල් සහ නවීන උපකරණ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහළ උපයෝගිතා බිල්පත්.
- ක්‍රමාංකනය සහ නඩත්තුව - නිතිපතා ක්‍රමාංකනය, සේවා ගිවිසුම සහ සංවේදී උපකරණ නඩත්තු කිරීම තාක්ෂණික වශයෙන් ඉතා දුෂ්කර කාර්යයකි.
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ නූතන ජාත්‍යන්තර වෙළඳපොළ අවශ්‍යතා අනුව යාවත්කාලීන දැනුම හා තාක්ෂණය පිළිබඳ දැණුම /පුහුණුව අධ්‍යයන කාර්ය මණ්ඩලයට නොමැති වීම.
- විෂය ප්‍රමාණික පළපුරුද්ද හා ප්‍රවීණතාවය සහිත පුහුණුකරුවන් හා අධ්‍යයන කාර්ය මණ්ඩලයක් නොසිටිම.
- Trainers of Trainers (ToT) වැඩසටහන් ප්‍රමාණවත් නොවීම.
- ජාත්‍යන්තර මට්ටමේ පුහුණු ප්‍රතිපත්ති හා සහතික කිරීමේ රාමු පිළිබඳ දැනුම ලබා ගැනිමේ අවස්ථා අවම වීම හේතුවෙන් ඒ සම්බන්ධ දැණුමක් පුහුණුවක් සහිත කාර්ය මණ්ඩලයක් නොසිටිම.
- පුහුණු ඒකක (Workshops) සහ උපකරණ පැරණි වීම හා ප්‍රමාණවත් නොවීම.
- පුහුණු ඒකක සඳහා නවීන ICT පහසුකම් (Smart Classrooms, Simulation Software) හිඟය.
- නවීන තාක්ෂණය කර්මාන්තයට හඳුන්වා දීම සඳහා ප්‍රාග්ධනය ප්‍රමාණවත් නොවීම.
- ග්‍රාමීය හා අඩු ආදායම් පසුබිමෙන් පැමිණෙන පුහුණුලාභීන්ට ආර්ථික බාධා හේතුවෙන් පාඨමාලාවන්හි රැඳී සිටීමේ අපහසුවක් පැවතිම.
- තරුණ පරපුර අතර මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයට ඇති ආකර්ෂණය අඩුවීම හා පාඨමාලා ප්‍රවර්ධනය සඳහා වැඩි අවස්ථා යොමු කල යුතු වුවත් ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- පාඨමාලා අවසන් පසු රැකියා/ව්‍යාපාර අවස්ථා පිළිබඳ ප්‍රමාණවත් මාර්ගෝපදේශ නොලැබීම.
- පුහුණු පාඨමාලා මෙහෙයවන්නන් හා අධ්‍යයන කාර්යය මණ්ඩයේ ප්‍රතිඵල හා ගුණාත්මකභාවය (Employability, Productivity) මැනීම සඳහා ඇගයීම් ක්‍රම (Monitoring & Evaluation System) සීමිත වීම

**ඉදිරි සැලසුම්**

- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළ විධිමත් අධ්‍යාපනයක් ලබාදීම වෙනුවෙන් ප්‍රමිතිගත පාඨමාලා පැවැත්වීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයට අදාළව උපාධි පාඨමාලාවක් සඳහා විෂයමාලා සංවර්ධනය
- පුහුණු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම හා නව පුහුණු මධ්‍යස්ථාන ආරම්භ කිරීම.
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂ්ත්‍රයට අදාලව උපාධි සුදුසුකම පිරිනැම්මට හා FGA සුදුසුකම පිරිනැම්මේ පාඨමාලා ආරම්භ කිරීමට (මෙම පාඨමාලාව 2025 ජනවාරි මස ආරම්භ කරන ලදී)
- මැණික් හා ස්වර්ණාභරණ විෂයය ක්ෂ්ත්‍රයට අදාල තාක්ෂණික වැඩමුළු ක්‍රියාත්මක කිරීම
- 2024 – 2025 අධ්‍යයන වර්ෂය සඳහා සහතිකපත් ප්‍රදානෝත්සවයක් ක්‍රියාත්මක කිරීම.

- නව මැණික් තැන්පතු නවීන විද්‍යාත්මක ක්‍රමවේද හරහා හඳුනාගැනීම තුළින් මැණික් කැණීම් ප්‍රමාණය වැඩිකිරීම
- මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රය සඳහා ජාත්‍යන්තර මට්ටමේ පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීම
- මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා ජාත්‍යන්තරව පිළිගත් වෙළඳපොළක් නිර්මාණය කිරීම
- නවීන තාක්ෂණය හරහා වටිනාකමින් අඩු මැණික් සඳහා අගය එකතු කිරීම.
- ජාත්‍යන්තර මට්ටමේ මැණික් පර්යේෂණාගාරයක් ස්ථාපිත කිරීම
- පතල් හිමියන්ට ජාත්‍යන්තර මැණික් මිල ගණන් සහ ප්‍රමිතීන් පිළිබඳ තොරතුරු ලබා දීමේ ක්‍රියාවලියක්.
- කෙටි කාලීන (Short-term), සවස් හා රාත්‍රී කාලීන (Evening & Weekend) පුහුණු පාඨමාලා පුළුල් කිරීමට අපේක්ෂා කරනු ලබයි.
- Digital / Blended Learning Models (Online + Practical) වැඩි වශයෙන් අන්තර්ගත කර පාඨමාලා හඳුන්වා දීමට කටයුතු කිරීම.
- Self-employment & Micro-enterprise Development වැනි ව්‍යාවසායකත්වයට මුල පිරීම පිළිබඳ පුහුණු මොඩියුල පාඨමාලා සඳහා ඇතුළත් කිරීමට කටයුතු කිරීමට අපේක්ෂා කරයි.
- NVQ හා ජාත්‍යන්තර Training Frameworks සමඟ පුහුණු පාඨමාලා සම්මුතින් සකස් කිරීමේ කටයුතු සඳහා මුල පිරීම
- පුහුණුකරුවන් පුහුණු කිරීමේ (Trainers of Trainers - ToT) වැඩසටහන් වාර්ෂිකව ක්‍රියාත්මක කිරීම
- පුහුණුකරුවන්ට ජාත්‍යන්තර Exposure සහ Industry Attachments ලබා දීම
- විෂයය ප්‍රවීණයන් සහ කර්මාන්තයේ ප්‍රවීණයන් Visiting Trainers ලෙස සම්බන්ධ කර ගැනීම
- පුහුණු ඒකක හා උපකරණ නවීකරණය කිරීම
- Industry Linkage Programmes (Apprenticeships, Internships) ශක්තිමත් කිරීම

## 2.9.7 ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB)

**අපනයන අංශයේ සමස්ත කාර්යසාධනය**

**ප්‍රගතිය**

- ගෝලීය ආර්ථික අභියෝග මධ්‍යයේ වුවද, 2025 වසරේදී ශ්‍රී ලංකාවේ අපනයන අංශය ස්ථාවර වර්ධනයක් සහ ඔරොත්තු දීමේ හැකියාවක් පෙන්නුම් කරන ලදී.
- මුළු අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් මිලියන 17,320.25 ක් වූ අතර, එය 2024 වසරට සාපේක්ෂව 5.97% ක වාර්ෂික වර්ධනයකි.
- භාණ්ඩ අපනයනය ඇමෙරිකානු ඩොලර් මිලියන 13,581.37 ක් දක්වා වර්ධනය වූ අතර (6.34% ක වැඩිවීමක්), එය මෙතෙක් වාර්තා වූ ඉහළම වාර්ෂික අගය වේ.
- සේවා අපනයනය 4.64% කින් වර්ධනය වී ඇමෙරිකානු ඩොලර් මිලියන 3,788.88 ක් දක්වා ළඟා විය.
- තොරතුරු සන්නිවේදන තාක්ෂණය සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණය (ICT/BPM), ඉදිකිරීම්, මූල්‍ය සේවා සහ ප්‍රවාහන හා සැපයුම් සේවා යන අංශ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් දායක වූ සේවා අංශ වේ.
- 2025 වසර සඳහා වන ජාතික අපනයන ඉපැයීම් ඉලක්කයෙන් 95% කට වඩා වැඩි ප්‍රමාණයක් සපුරා ගැනීමට සමත් විය.

- මෙම වර්ධනය සඳහා පොල් සහ පොල් ආශ්‍රිත නිෂ්පාදන ප්‍රබල දායකත්වයක් ලබා දුන් අතර, එම අංශයේ ආදායම ප්‍රථම වරට ඇමෙරිකානු ඩොලර් බිලියනය ඉක්මවා යන ලදී.

**අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩලය (EDCM)**

අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල රැස්වීම් නැවත ආරම්භ කරන ලද අතර, අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ජනාධිපති ලේකම් කාර්යාලයේදී රැස්වීම් දෙකක් පවත්වන ලදී (2025 ජනවාරි 27 සහ අගෝස්තු 12).

පළමු අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ ප්‍රධාන තීරණ

- "Made in Sri Lanka" නිෂ්පාදන මිලදී ගැනීම දිරිමත් කිරීම සඳහා ගුවන් තොටුපළේදී සංචාරකයින් සඳහා වන බදු (VAT) ප්‍රතිපූරණ පද්ධතිය නැවත ස්ථාපිත කිරීම.
- අතින් සිදුකරන පරීක්ෂාවන් වෙනුවට කටුනායක ගුවන් තොටුපළේ අපනයන නිෂ්පාදන පරීක්ෂාව ස්වයංක්‍රීය කිරීමේ වැදගත්කම හඳුනා ගැනීම.
- ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත දුම්රිය එන්ජින් අපනයනය කිරීමට හැකි වන පරිදි ඒවායේ දේශීය පරීක්ෂණ කටයුතු පහසු කිරීම.
- අපනයන අංශයේ පිරිවැය අවම කිරීම සඳහා පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් භාවිතය ප්‍රවර්ධනය කිරීම.
- අපනයන ඉලක්ක සපුරා ගැනීම සඳහා ව්‍යවසායකයින්ට සහ ආයෝජකයින්ට සහාය වීමට සෙස් (CESS) අරමුදලින් ප්‍රතිපාදන වෙන් කිරීම.
- දේශීය හා විදේශීය ආයෝජන දිරිමත් කිරීම සඳහා ආයෝජන පහසුකම් සැලසීමේ කමිටුවක් (Investment Facilitation Committee) පිහිටුවීමේ වැදගත්කම හඳුනා ගැනීම.
- නිවැරදි තක්සේරු ක්‍රමවේදයන් සහිතව මැණික් හා ස්වර්ණාභරණ සඳහා අපනයන දිරිගැන්වීම් ලබා දීම.
- දේශීයව නිෂ්පාදිත ඉලෙක්ට්‍රොනික උපකරණ අපනයනය කරන්නන් සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමේදී රේගු බදු සහන ලබා දීම.
- සේවා අපනයනය දිරිමත් කිරීම සඳහා බැංකු ඇපකර සීමාවන් ඉහළ නැංවීම.
- ඉහළ කාර්යක්ෂමතාවයක් සඳහා අපනයන කර්මාන්තයේ දත්ත පද්ධති ඩිජිටල්කරණය කිරීමට ප්‍රමුඛතාවය ලබා දීම.

දෙවන අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ගනු ලැබූ ප්‍රධාන තීරණ

- අපනයන ඉහළ නැංවීම සඳහා නිදහස් වරාය සේවා මෙහෙයුම් (Free Port Service Operations) සංවර්ධනය කිරීමේ වැදගත්කම හඳුනා ගැනීම සහ පවතින "Hub Regulation Act" සංශෝධනය කිරීමට ආයෝජන මණ්ඩලයට (BOI) උපදෙස් දීම.
- ත්‍රිකුණාමලය වරාය වාණිජ නාවික කේන්ද්‍රස්ථානයක් ලෙස සංවර්ධනය කිරීම.
- අගය එකතු කිරීම සහ නැවත අපනයනය කිරීම සඳහා ඇතැම් අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අවසර දීම සම්බන්ධයෙන් ආයෝජන මණ්ඩලයේ ලියාපදිංචි අනෙකුත් කුළුබඩු අපනයන සමාගම්වල ශක්‍යතාවය සොයා බැලීම.
- කුකුළු නිෂ්පාදන අපනයනයට සාපේක්ෂව ඒවා සඳහා භාවිත කරන අමුද්‍රව්‍යවල ආනයන බදු ඉවත් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම.

- කුඩා තේ වතු හිමියන්ට තේ පැල නැවත වගා කිරීම (infill) සඳහා සහන කාලයක් සහිත අඩු පොලී ණය ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම.

**ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (NEDP) 2025–2029 සම්පාදනය කිරීම**

- 2025 අයවැය මගින් 2025–2029 ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (NEDP) ජාතික ප්‍රමුඛතාවයක් ලෙස හඳුනා ගන්නා ලදී.
- මෙම ජාතික අපනයන සංවර්ධන සැලැස්ම සම්පාදනය කිරීමේ නායකත්වය සහ වගකීම අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) වෙත පවරන ලදී.
- අපනයන තරඟකාරිත්වය ඉහළ නැංවීම සහ අපනයන මත පදනම් වූ ආර්ථික වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම සඳහා, ආසියානු සංවර්ධන බැංකුවේ (ADB) ප්‍රතිපත්ති මත පදනම් වූ ණය දීමේ (PBL) වැඩසටහන යටතේ ලැබෙන තාක්ෂණික සහාය ඇතිව මෙම සැලැස්ම සකස් කරන ලදී.
- රාජ්‍ය ආයතන, පෞද්ගලික අංශය, විද්වතුන් සහ සංවර්ධන හවුල්කරුවන්ගේ සහභාගීත්වයෙන් 2025 ඔක්තෝබර් 2 සිට 10 දක්වා මහනුවර පැවැත් වූ ප්‍රාදේශීය සැසියක් ද ඇතුළුව පුළුල් පාර්ශවකරුවන්ගේ උපදේශන රැස්වීම් පවත්වන ලදී.
- මෙම උපදේශන රැස්වීම්වලදී ප්‍රමුඛතා අංශ, වෙළඳපල සම්බන්ධතා, වෙළඳ බාධක මෙන්ම ප්‍රතිපත්තිමය සහ ආයතනික ප්‍රතිසංස්කරණ පිළිබඳව අවධානය යොමු කරන ලදී.
- තාක්ෂණික කමිටු රැස්වීම්, ද්විපාර්ශ්වික සාකච්ඡා සහ ප්‍රමුඛ ආයතනවලින් ලැබුණු ප්‍රතිපෝෂණ මගින් අතිරේක යෝජනා සහ දත්ත ලබා ගන්නා ලදී.
- 2030 වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 36 ක අපනයන ඉලක්කයක් සපුරා ගැනීම සහ ඔරොත්තු දෙන, ඇතුළත් කරගත් මෙන්ම තිරසාර වර්ධනයක් සහතික කිරීම අරමුණු කරගත් මෙම සැලැස්ම 2026 මුලදී අවසන් කිරීමට නියමිතය.

**අපනයන ප්‍රවර්ධනය, ධාරිතා වර්ධනය සහ වෙළඳපල ප්‍රවේශ මුලපිරීම්**

- 2025 වසරේදී පැවැත් වූ ප්‍රධාන ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශන සඳහා ශ්‍රී ලංකා සමාගම් 142 කට අධික සංඛ්‍යාවකට (සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් 66 කට වැඩි ප්‍රමාණයක් ඇතුළුව) සහභාගී වීමට අපනයන සංවර්ධන මණ්ඩලය පහසුකම් සැලසීය.
- Gulfood, Biofach, IFE (එක්සත් රාජධානිය), Foodex Saudi, Seafood Expo Global, SIAL Canada, Japan IT Week සහ Thaifex Anuga Asia යනාදිය ඒ අතර වූ ප්‍රධාන ගෝලීය වෙළඳ ප්‍රදර්ශන කිහිපයකි.
- මෙම ජාත්‍යන්තර මැදිහත්වීම් හරහා වෙළඳපල ප්‍රවේශය, ගෝලීය දෘශ්‍යතාව සහ අපනයන අවස්ථාවන් පුළුල් විය.
- දේශීය වශයෙන්, Complast Rubber Expo 2025 සහ Footwear & Leather Fair 2025 (බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී) වැනි ප්‍රදර්ශන මගින් අපනයන සංවර්ධන මණ්ඩලය වෙළඳාම ප්‍රවර්ධනය කළේය.
- පාවහන් සහ සම්භාණ්ඩ ප්‍රදර්ශනය (Footwear & Leather Fair) හරහා නව ව්‍යාපාරික සබඳතා 38 ක් ගොඩනැගුණු අතර, රුපියල් මිලියන 1.9 ක අලෙවියක් සහ නරඹන්නන් 26,900 ක ආකර්ෂණයක් දිනා ගැනීමට සමත් විය.

- ධාරිතා වර්ධන මුලපිරීම් යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් සහ කාන්තා ව්‍යවසායිකාවන් සඳහා තායිලන්තය, ජර්මනිය සහ ජපානය වැනි රටවල ජාත්‍යන්තර නිරීක්ෂණ චාරිකා සංවිධානය කරන ලදී.
- නැගෙනහිර පළාත් සංසදය වැනි ප්‍රාදේශීය වැඩසටහන් මගින් ව්‍යවසායකයින් 250 කට අධික සංඛ්‍යාවකගේ අපනයන සූදානම සහ කුසලතා වර්ධනය කිරීමට සහාය විය.
- හස්ත කර්මාන්ත සහ ජීවන රටා අංශ (handicrafts and lifestyle) සඳහා පැවැත් වූ දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් අපනයනය, ඇසුරුම්කරණය, විද්‍යුත් අලෙවිකරණය සහ සැපයුම් පද්ධති පිළිබඳව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් 100 දෙනෙකු දැනුවත් කරන ලදී.
- EDB-JICA සහ ජර්මනියේ ආනයන ප්‍රවර්ධන මධ්‍යස්ථානය (Import Promotion Desk) වැනි උපායමාර්ගික හවුල්කාරිත්වයන් හරහා වෙළඳපල ප්‍රවේශය, පුහුණුව, ව්‍යාපාරික සබඳතා ගොඩනැගීම සහ නවෝත්පාදන සහාය සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින් වෙත ලබා දෙන ලදී.
- අපනයනකරුවන්ට පහසුකම් සැලසීමේ කටයුතු යටතේ ගැටළු 37 කට විසඳුම් ලබා දුන් අපනයනකරුවන්ගේ සංසදය (Exporters' Forum) සහ විශිෂ්ටත්වය අගයමින් පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය ශක්තිමත් කළ 26 වන ජනාධිපති අපනයන සම්මාන උළෙල ප්‍රධාන වේ.

**අභියෝග**

- නවීන ගෝලීය වෙළඳ ගතිකත්වයන්ට අනුකූල නොවන යල් පැන ගිය ආයතනික ව්‍යුහය.
- රජයේ ආයතන අතර පවතින දුර්වල සම්බන්ධීකරණය සහ කාර්යභාරයන් අතිපිහිටීම.
- ප්‍රමාණවත් නොවන මානව සම්පත් ධාරිතාව සහ පවතින කාර්ය මණ්ඩලය මත පවතින අධික වැඩ බර.
- සීමිත ඩිජිටල්කරණය සහ ස්වයංක්‍රීය පද්ධතිවල පවතින හිඟය.
- යාවත්කාලීන කරන ලද අපනයනකරුවන්ගේ දත්ත පද්ධතියක් නොමැතිකම සහ දුර්වල දත්ත කළමනාකරණය.
- වෙළඳපල බුද්ධි තොරතුරු සහ පර්යේෂණ දත්ත සඳහා ප්‍රමාණවත් ප්‍රවේශයක් නොමැතිකම.
- ඉහළ නිෂ්පාදන පිරිවැය සහ අමුද්‍රව්‍ය මිල ඉහළ යාම හේතුවෙන් තරඟකාරිත්වය අඩුවීම.
- නවෝත්පාදන, තාක්ෂණික භාවිතය සහ පර්යේෂණ හා සංවර්ධන (R&D) ආයෝජනවල පවතින අඩු මට්ටම.
- අපනයන නිෂ්පාදනවල අගය එකතු කිරීමේ සීමිත බව.
- ජාත්‍යන්තර ප්‍රමිතීන්, සහතික කිරීම් සහ තිරසාර අවශ්‍යතා සපුරා ගැනීමේ අපහසුව.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ගේ (SME) අඩු අපනයන සූදානම සහ ගෝලීය ඒකාබද්ධතාවය.
- ඩිජිටල් ගෙවීම් වේදිකා සහ විද්‍යුත් වාණිජ (e-commerce) යටිතල පහසුකම් සඳහා පවතින සීමිත ප්‍රවේශය.
- කලාපීය අපනයන රටවල් (උදා: වියට්නාමය, ඉන්දියාව, බංග්ලාදේශය) සමඟ පවතින දැඩි තරඟකාරිත්වය.
- අපනයන ඉල්ලුමට බලපාන ගෝලීය ආර්ථික මන්දගාමිත්වය.
- සැපයුම් දාමයන්ට සහ වෙළඳ ප්‍රවාහයන්ට බාධා පමුණුවන භූ-දේශපාලනික ආතතීන්.
- විනිමය අනුපාතිකයේ අස්ථාවරත්වය සහ අස්ථායී ආර්ථික තත්ත්වයන්.
- කෘෂිකාර්මික සහ ස්වභාවික සම්පත් මත පදනම් වූ අපනයන සඳහා දේශගුණික විපර්යාසවල බලපෑම.
- වෙළඳ පහසුකම් සැලසීමේ පද්ධතිවල පවතින අකාර්යක්ෂමතාවය හේතුවෙන් සිදුවන ප්‍රමාදයන් සහ ඉහළ ගනුදෙනු පිරිවැය.

**අනාගත ඉලක්ක**

- 2030 වර්ෂය වන විට ඇමෙරිකානු ඩොලර් බිලියන 36 ක අපනයන ආදායමක් ලබා ගැනීමේ ජාතික ඉලක්කය සමඟ අපනයන සංවර්ධන මණ්ඩලයේ (EDB) සැලසුම් පෙළගැස්වීම.
- ඇමෙරිකානු ඩොලර් බිලියන 1 ක අපනයන ආදායමක් උත්පාදනය කිරීමේ අරමුණින්, රුපියල් මිලියන 450 ක ආයෝජනයක් සහිතව **"Sri Lanka Expo 2026"** ප්‍රදර්ශනය සංවිධානය කිරීම.
- නිර්මාණාත්මක කර්මාන්තය (Creative Industry) තුළ ගෝලීය මට්ටමේ ශ්‍රී ලාංකික සන්නාම 10 ක් සංවර්ධනය කිරීම සඳහා **"Creative Sri Lanka 2030"** වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- ඇමෙරිකානු ඩොලර් මිලියන 50 ක අපනයන ආදායමක් ඉලක්ක කරගනිමින් "ජාතික අපනයන සන්නාම සංවර්ධන වැඩසටහන" (National Export Brand Development Programme) අඛණ්ඩව පවත්වාගෙන යාම.
- ප්‍රධාන වෙළඳ සහ නවෝත්පාදන තේමාවන් ඔස්සේ සිදුකළ ව්‍යුහගත උපදේශනයන්ගෙන් අනතුරුව, ආසියානු සංවර්ධන බැංකුව (ADB) සමඟ ඒකාබද්ධව 2026 මුල් භාගය වන විට ජාතික අපනයන සංවර්ධන සැලැස්ම (NEDP 2025–2029) අවසන් කිරීම.
- 2026 වසර තුළදී ප්‍රතිපත්තිමය මට්ටමේ රැස්වීම් තුනක් සහිතව අපනයන සංවර්ධන අමාත්‍ය මණ්ඩලය (EDCM) කැඳවීම.
- අපනයනකරුවන්ගේ හැකියාවන් ශක්තිමත් කිරීම සඳහා අපනයනකරුවන් දැනුවත් කිරීමේ සහ ධාරිතා වර්ධන වැඩසටහන් 50 කට වඩා පැවැත්වීම.
- වෙළඳ ප්‍රදර්ශන, ව්‍යාපාරික දූත පිරිස්, B2B සාකච්ඡා සහ ජනාධිපති අපනයන සම්මාන උළෙල අඛණ්ඩව පැවැත්වීම මගින් ගෝලීය වෙළඳපල ප්‍රවේශය පුළුල් කිරීම.
- ශ්‍රී ලාංකික තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමනාකරණ (ICT/BPM) අංශයේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සහ නව ව්‍යාපාර (Startups) සඳහා පුළුල් සහාය ලබා දෙමින් EDB–JICA සහයෝගිතා වැඩසටහන 2026 දක්වා ඉදිරියට ගෙන යාම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ වැඩි සහභාගීත්වයකින් යුතුව ගෝලීය වෙළඳ ප්‍රදර්ශනවලදී ශ්‍රී ලංකාවේ නියෝජනය ශක්තිමත් කිරීම.
- යුරෝපීය වෙළඳපල ප්‍රවේශය තවදුරටත් තහවුරු කරගැනීම සඳහා EDB සහ ජර්මනියේ ආනයන ප්‍රවර්ධන මධ්‍යස්ථානය (IPD) අතර පවතින හවුල්කාරිත්වය ගැඹුරු කිරීම.
- නව භූගෝලීය කලාප සහ නිෂ්පාදන කාණ්ඩ ඔස්සේ වෙළඳපල විවිධාංගීකරණ ප්‍රයත්නයන් පුළුල් කිරීම.
- ඉලක්කගත අපනයන උපදේශන සහ පුහුණු වැඩසටහන් හරහා කාන්තාවන් විසින් මෙහෙයවනු ලබන ව්‍යාපාර වැඩි වශයෙන් සවිබල ගැන්වීම.

## 2.9.8 කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

**ප්‍රගතිය**

ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතට අයත් තරුණ සවිබලගැන්වීමේ වැඩසටහනට 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන යටතේ පුද්ගලයින් 125,650කට සේවාවන් ලබා දී 82%ක භෞතික ප්‍රගතියක් අත්කරගෙන ඇත.

**තරුණ සවිබලගැන්වීම වැඩසටහන යටතේ පහත අංශ ඔස්සේ ලබා ගෙන ඇති ප්‍රගතිය පහත පරිදි වේ.**

- ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන් හා සහාය සේවා ලබාදීම සඳහා පුද්ගලයින් 26,345 දෙනෙකු දැනුවත් කර ඇති අතර, 71% ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.
- ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා පුද්ගලයින් 2, 893 දෙනෙකුට අවශ්‍ය සේවාවන් ලබා දී ඇති අතර ඒ හරහා 73% ප්‍රගතියක් අත්කරගෙන ඇත.
- පුද්ගලයින් 6,135 දෙනෙකුට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදී ඇති අතර එය ප්‍රතිශතයක් වශයෙන් 100% ප්‍රගතියකි.
- අලෙවි සබඳතා සඳහා පහසුකම් සපයා දීම හා අලෙවි සංවර්ධන කටයුතු සඳහා ව්‍යවසායකයින් 7,703 දෙනෙකුට සේවාවන් සපයා ඇති අතර එය 97% ක ප්‍රගතියකි.
- ගිණුම්කරණය, පිරිවැයකරණය හා මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා 6,398 දෙනෙකුට අවශ්‍ය දැනුම ලබාදී ඇති අතර, එය 93 % ක ප්‍රගතියක් අත්කර ගෙන ඇත..
- 3,163 දෙනෙකුගේ ව්‍යාපාර පසුවිපරම් කර ව්‍යාපාර උපදේශන සේවා ලබාදී ඇත. එය 93 % ප්‍රගතියකි.
- "Business Level up" වැඩසටහන යටතේ ව්‍යාපාර සංවර්ධනය සඳහා තෝරාගත් ව්‍යවසායකයින් 3,190 දෙනෙක් ආයතනය මගින් පවත්වා ගෙන යන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක දත්ත පද්ධතියෙහි ලියාපදිංචි කර ඇත.

**මූල්‍ය ප්‍රගතිය**

- 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රාග්ධන ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.221,000ක් වූ අතර 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මි 138.525ක් වන අතර 63%ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.
- 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද පුනරාවර්ථන ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 927.500ක් වූ අතර 2025.12.31 දිනට මූල්‍ය ප්‍රගතිය රු.මි 861.378ක් වන අතර එය 93% ක ප්‍රගතියකි.
- ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතට අයත් තරුණ සවිබල ගැන්වීම වැඩසටහනට 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි.150.00ක් වූ අතර 2025.12.31 දිනට එහි මූල්‍ය ප්‍රගතිය රු.මි 107.549ක් වන අතර 75%ක ප්‍රගතියක් අත්කරගෙන ඇත.
- ව්‍යවසායකත්වය සඳහා පෙළඹවීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රු.මි 3.327ක් වැය කර ඇත.
- ව්‍යවසායකත්ව සංවර්ධන ඒකකය යටතේ පවත්වන ලද වැඩසටහන් හා සේවාවන් සඳහා රු.මි. 26.436 ක් වැය කර ඇත.
- ව්‍යවසායකයින්ට අවශ්‍ය තාක්ෂණික දැනුම ලබාදීම ඇතුළු නිෂ්පාදන සංවර්ධනයට අදාළ සේවාවන් සඳහා රු.මි. 27.128ක් වැය කර ඇත.

- ව්‍යවසායකයින්ට අවශ්‍ය අලෙවි සබඳතා සඳහා පහසුකම් සපයා දීම හා අලෙවි සංවර්ධන කටයුතු සඳහා රු.මි.34.565ක් වැය කර ඇත.
- ව්‍යාපාර සැලසුම් සකස් කිරීම, ගිණුම්කරණය, පිරිවැයකරණය හා මූල්‍ය සාක්ෂරතාවය වර්ධනය කිරීම සඳහා රු.මි. 8.130ක වැය කර ඇත.
- ව්‍යාපාර උපදේශනය සහ පසුවිපරම් කටයුතු සඳහා රු.මි.1.388ක් වැය කර ඇත.

**අභියෝග**

- ව්‍යවසායකත්ව මානසිකත්වය (Entrepreneurship Mindset) පෝෂණය කිරීම සඳහා පාසල්, විශ්ව විද්‍යාල මට්ටමින් ව්‍යවසායකත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුහුණ දීමට සිදු වන අපහසුතා.
- වෙළඳපොළ පහසුකම් ප්‍රවර්ධනය සඳහා දිස්ත්‍රික් මට්ටමින් අලෙවි මධ්‍යස්ථාන පිහිටුවා ගැනීම වඩාත් ප්‍රායෝගික වුවත් සුදුසු ස්ථානයක් නොමැතිවීම, ඒ සඳහා විශාල වියදමක් දැරිය යුතුවීම වැනි ගැටලුකාරී තත්ත්වයන්.
- ව්‍යවසායකයින් සඳහා සහන පොලී සහ ලිහිල් ඇප සුරැකුම් යටතේ විශේෂිත ණය යෝජනා ක්‍රමයක් බැංකු හරහා ක්‍රියාත්මක නොවීම.
- නිෂ්පාදන සඳහා තත්ත්ව සහතික, සාම්පල් හා රසායනාගාර පරීක්ෂා සිදුකිරීම වැනි සේවාවන් සඳහා ව්‍යවසායකයින් විසින් විශාල මුදලක් ගෙවිය යුතුවීම සහ ඒ සඳහා සහනදායී වැඩපිළිවෙලක් නොවීම.
- විශේෂයෙන්ම උතුරු හා නැගෙනහිර පළාත් හි ව්‍යවසායකයින් සඳහා තාක්ෂණික පහසුකම්, පුහුණුවීම් ලබා ගැනීම සඳහා සුදුසු ආයතන හා සම්පත්දායකයින් හිඟය.
- ව්‍යවසායකයින් පසුවිපරම් කරමින් අඛන්ඩ ව්‍යාපාර උපදේශන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් ප්‍රවාහන පහසුකම් නොමැතිකම.
- රාජ්‍ය නොවන සංවිධාන වෙත ලැබෙන ප්‍රදාන හා සම්පත් ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක ආයතනවල වැඩපිළිවෙළ හා ඒකාබද්ධ කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක නොවීම.

**ඉදිරි ඉලක්ක**

- 2025 වසරේ ආරම්භ කළ "Business Level UP" වැඩසටහන අවශ්‍ය සංශෝධන සහිතව 2026 වසර තුළ ක්‍රියාත්මක කිරීම.
- "Business online" වැඩසටහන යටතේ "Business Level UP" වැඩසටහනට සමගාමීව මාර්ගගත වැඩසටහන් පැවැත්වීම.
- ව්‍යවසායකත්ව සංවර්ධනය සඳහා ක්‍රියාත්මක ප්‍රධානතම වැඩසටහන වන ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු පාඨමාලාව ( දින 08 නේවාසික) 2026 වසර තුළ වැඩසටහන් 18 ක් ක්‍රියාත්මක කිරීම.
- නිෂ්පාදනවල තත්ත්වය උසස් කිරීමට අවශ්‍ය සේවාවන් ලබාදීම (සහතිකකරණය, නව තාක්ෂණය ලබාදීම, සාම්පල් පරීක්ෂා, ඇසුරුම්කරණය )
- ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන අලෙවිය සඳහා භෞතික මෙන්ම මාර්ගගත අලෙවි පහසුකම් සංවිධානය කිරීම.
- අපනයන විභවතාවය සහිත ව්‍යාපාර අපනයනය සඳහා සූදානම් කිරීමේ විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපාර ක්ෂේත්‍ර අනුව නිෂ්පාදන සංවර්ධනය, ගැණුම්කරු හමු සංවිධානය කිරීම.

- මූල්‍ය පහසුකම් ලබාදීම සඳහා බැංකු සම්බන්ධීකරණය, ව්‍යවසායකයින් තුළ මූල්‍ය සාක්ෂරතාවය හා විනය ඇතිකිරීම.
- සංවර්ධනය සඳහා තෝරාගත් ව්‍යාපාර සඳහා අඛන්ඩ ව්‍යාපාර උපදේශන සේවාවන් ක්‍රියාත්මක කිරීම.
- ව්‍යාපාරික ගැටලු විසඳීම සඳහා ප්‍රාදේශීය, දිස්ත්‍රික් හා ජාතික මට්ටමේ ව්‍යවසායකත්ව සංවර්ධන කමිටු හා ඒකාබද්ධවීම.
- ව්‍යාපාර සංවර්ධනය සඳහා අදාළ ක්ෂේත්‍රයන්හි නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය කිරීම.
- ආයතනය මගින් ලබාදෙන සේවාවන් නියාමනය හා අධීක්ෂණය.

## 2.9.9 උක් පර්යේෂණ ආයතනය (SRI)

**ප්‍රගතිය**

උක් පර්යේෂණ ආයතනයේ (SRI) 2025 ක්‍රියාකාරී සැලැස්ම යටතේ ප්‍රධාන පර්යේෂණ හා සංවර්ධන ව්‍යාපෘති අටක් යටතේ ක්‍රියාකාරකම් හැට තුනක් (63) සිදු කරන ලද අතර පහත සඳහන් ප්‍රගතිය අත්කර ගන්නා ලදී.

- SL 2007 ශ්‍රේණියේ නව උක් ප්‍රභේද දෙකක් (SL 07 3498 සහ SL 07 3505) වාණිජ වගාව සඳහා නිකුත් කරන ලද අතර, වැඩිදුර ක්‍රියාකාරකම් සඳහා බීජ උක් ගුණ කිරීම ආරම්භ කරන ලදී.
- මාතර සහ ගාල්ල දිස්ත්‍රික්කවල දේශීය ගවේෂණයක් හරහා උක් ප්‍රවේණික ප්‍රවේශ 45 ක් එකතු කරන ලදී. වැඩිදුර ක්‍රියාකාරකම් සඳහා එකතු කරන ලද ප්‍රවේශයන් ගුණ කිරීම ආරම්භ කරන ලදී.
- දෙනියාය, එන්සෙල්වත්තේ උක් අභිජනන ස්ථානයේ උක් ප්‍රවේණික ප්‍රවේශ 1,745 ක සංරක්ෂණය සිදු කරනු ලැබේ. ඊට අමතරව, වාණිජ හා ආසන්න වාණිජ ප්‍රභේද 73 ක් සහිත අභිජනන බීජ උද්‍යානයක් නඩත්තු කරනු ලබන අතර, උඩ වලවේ උක් පර්යේෂණ ආයතනයේ ප්‍රවේණික ප්‍රවේශ 950 ක් සංරක්ෂණය කෙරේ.
- ක්ෂේත්‍ර පහන් කූඩු සහ ද්‍රාවණ (මාකෝට්ටින්) ශිල්පීය ක්‍රම භාවිතා කරමින් මුළු මුහුම් 700 ක් සිදු කරන ලදී. මෙම මුහුම් දිශානුගත වන අතර, සීනි සහ උක් අස්වැන්න වැඩිදියුණු කිරීම මෙන්ම ස්මට්, කොළ පිළිස්සීම සහ සුදු කොළ රෝග වැනි රෝග වලට ප්‍රතිරෝධය ඉලක්ක කර ගනී. සත්‍ය බීජ සැකසීම අවසන් කරන ලද අතර, ඒවා -20°C හි ශීත කළ තත්වයන් යටතේ ගබඩා කරන ලදී.
- SL 2021 සහ SL 2022 ශ්‍රේණිවල තෝරා ගැනීමේ අදියර 1 හි තවාන් ක්‍රියාකාරකම් සම්පූර්ණ කර ස්ථාපනය කරන ලදී
- තෝරා ගැනීමේ වැඩසටහනේ 2 වන අදියර සඳහා උසස් ක්ලෝන තෝරා ගැනීම සඳහා SL 2022 ශ්‍රේණියේ 1 වන අදියරේදී බීජ පැල 42,055 ක් නඩත්තු කරන ලදී.
- SL 2021 ශ්‍රේණියේ 1 වන අදියරෙන් ක්ලෝන 1,515 ක් තෝරාගෙන තෝරා ගැනීමේ වැඩසටහනේ 2 වන අදියරට පිවිසෙන ලදී.
- තෝරා ගැනීමේ වැඩසටහනේ 3 වන අදියරේදී SL 2020 ශ්‍රේණියේ ක්ලෝන 443 ක් සහ SL 2019 ශ්‍රේණියේ ක්ලෝන 300 ක් නඩත්තු කිරීම.
- ප්‍රාථමික අස්වැන්න අත්හදා බැලීම් සඳහා SL 2018 ශ්‍රේණි ක්ලෝන 211 ක් සහ අනුපිටපත් අස්වැන්න අත්හදා බැලීම් සඳහා SL 2016 සහ SL 2015 ශ්‍රේණිවල ක්ලෝන 70 ක් නඩත්තු කරන ලදී.

- අනුරු අස්වැන්න අත්හදා බැලීම් යටතේ SL 2014, SL 2013 සහ SL 2012 ශ්‍රේණිවලට අයත් ක්ලෝන 126ක් නඩත්තු කරන ලදී.
- වාණිජ නිකුතුවට පෙර කර්මාන්ත ස්ථානවල වැඩිදුර ඇගයීම සඳහා උඩවලවේ ඇගයීම් සම්පූර්ණ කරන ලද SL 2010/11, SL 2009, SL 2008, SL 2007, SL 2006 සහ SL 2005 ශ්‍රේණිවලින් ක්ලෝන 120ක ගුණ කිරීමේ බිම් කොටස් නඩත්තු කරන ලදී.
- මහා පරිමාණ ගුණ කිරීමට පෙර විවිධ උක් වගා කරන ප්‍රදේශවල අවසාන අදියර ඇගයීම් අඛණ්ඩව සිදු කරන ලද අතර, 2010/11 ශ්‍රේණියේ ප්‍රභේද 19 ක්, 2009 ශ්‍රේණියේ ප්‍රභේද 22 ක්, SL 2006 ශ්‍රේණියේ ප්‍රභේද 23 ක් සහ SL 2005 ශ්‍රේණියේ ප්‍රභේද 24 ක් ඇතුළත් විය.
- සීනි කර්මාන්ත නිලධාරීන් සමඟ සහයෝගයෙන් කර්මාන්ත ස්ථානවල එක් එක් ශ්‍රේණියේ තෝරාගත් ක්ලෝනවල නිරීක්ෂණ බිම් කොටස් ස්ථාපිත කර නඩත්තු කරන ලදී.
- පසුකාලීන ක්‍රියාකාරකම් පිළිබඳ වැඩිදුර නිරීක්ෂණය සහ තීරණ ගැනීම සඳහා කර්මාන්ත ස්ථානවල ආනයනික ප්‍රභේදවල තෝරාගත් ක්ලෝන නඩත්තු කිරීම.
- උක් ජාන ප්ලාස්මයේ උක් ඇමිණුම් 470 ක් පමණ මෙරික්ලෝනින් කිරීම සහ පිරිසිදු බීජ නිෂ්පාදනය සඳහා පැළ 1600 ක් සංවර්ධනය කිරීම.
- චීන සහ වියට්නාම ආනයනය කරන ලද උක් ප්‍රභේද 52 ක අණුක ලක්ෂණකරණය සම්පූර්ණ කරන ලදී
- ප්‍රභේද පහකින් කැලි ක්ලෝන සංවර්ධනය කිරීම සම්පූර්ණ කරන ලද අතර PEG ප්‍රතිකාර හරහා නියඟ පීඩන ප්‍රතිරෝධය සඳහා ක්ලෝන විශ්ලේෂණය කිරීම සහ තෝරා ගැනීමේ වැඩසටහනේ උසස් ක්ලෝන තෝරා ගැනීම සඳහා පැළ 3,063 ක් නිෂ්පාදනය කරන ලදී.
- සල්ෆෙන්ට්‍රසෝන් 50% SC යන නව වල් නාශකය උක් වගාවේ පූර්ව නිර්ගමන අවදියේදී විශේෂයෙන් පළල් පත්‍ර සහ පන් වර්ග යන වල් පැලෑටි මර්ධනය සඳහා ඵලදායී වල් නාශකයක් බව හඳුනා ගැනීම.
- උක් වගාවේ පූර්ව නිර්ගමන වල් නාශක යෙදීම සඳහා ඩ්‍රෝන යානා භාවිතයේදී අනුගමනය කල යුතු වඩාත් ගැලපෙන පරාමිතීන් හඳුනා ගැනීම.
- සෙවනගල ප්‍රදේශය සඳහා ප්‍රමාද වී අස්වැන්න නෙලීමේ අවස්ථාවලදී SL 96 128 උක් ප්‍රභේදයේ සීනි සංයුතියේ ගුණාත්මක භාවයට සිදුවන බලපෑම හඳුනා ගැනීම.
- ගල්-ඔය වැවිලි පුද්ගලික සමාගමේ වාණිජමය වශයෙන් වගා කරන උක් ප්‍රභේදවල සිටුවීමේ කාලයට සාපේක්ෂව පරිණත වීමේ රටා හඳුනා ගැනීම.
- ද්විත්ව පේළි රෝපණ ක්‍රමය යටතේ SL 96 128 ප්‍රභේදයේ උක් අස්වැන්න පැල වගාවේදී සම්මත රෝපණ ක්‍රමයට සාපේක්ෂව නොවෙනස් අස්වැන්නක් ලබා දෙන බව හඳුනා ගැනීම.
- නිර්දේශිත වගා කළමනාකරණ පිළිවෙත් යටතේ කාබනික උක් වගාවේ උක් අස්වැන්න පැල වගාවේ සිට දෙවන නිරි වගාව දක්වා සැලකිය යුතු ලෙස අඩු නොවන බව හඳුනා ගැනීම
- උක් වගාවේ පසු වර්ධන අවධියේදී පත්‍ර වලට පෝෂක යෙදීම මගින් සීනි තැන්පත්වීම වීම කෙරෙහි වන බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලයේ කෘෂිකර්ම උපාධි අපේක්ෂක ජේ.කේ.එන්. සෙව්වන්දි විසින් සිදුකල ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.
- උක් වගාවේ මූලික වර්ධන අවධිය සඳහා ඩ්‍රෝන යානා පාදකකරගත් වල්නාශක යෙදීමේ ක්‍රමවේදය සංවර්ධනය කිරීම පිළිබඳව, කොළඹ විශ්වවිද්‍යාලයේ කෘෂි තාක්ෂණ හා ග්‍රාමීය විද්‍යා ආයතනයේ උපාධි අපේක්ෂක ආර්.ඒ.එම්. දිල්ෂාන් නදීක විසින් සිදුකල ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.

- සෙවනගල ප්‍රදේශය සඳහා ප්‍රමාද වී අස්වැන්න නෙලීමේ අවස්ථාවලදී SL 96 128 උක් ප්‍රභේදයේ සීනි සංයුතියේ සහ වර්ධන පරාමිතීන්හි ගුණාත්මක භාවයට සිදුවන බලපෑම පිළිබඳව ශ්‍රී ලංකා ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ සත්ව විද්‍යා හා අපනයන කෘෂිකර්ම පීඨයේ උපාධි අපේක්ෂක එන්.එස්. ප්‍රභාත් විසින් සිදුකල ව්‍යාපෘතිය අධීක්ෂණය කිරීම.
- කිලිනොච්චි දිස්ත්‍රික්කයේ අක්කරායන්, මලයාලපුරම්, තිරුවයියාරු සහ සොලෙයිනගර් ප්‍රදේශවලට උක් වගාව ව්‍යාප්ත කිරීම.
- රාජ්‍ය පෞද්ගලික හවුල්කාරීත්ව ව්‍යාපෘතියක් ලෙස ආනවිලුන්දාන් හකුරු ඒකකයේ උක් ආශ්‍රිත නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීම.
- නව ගොවීන්ට නිරෝගී බීජ උක් සැපයීම සඳහා වන්නේරිකුලම් බීජ උක් තවාන ව්‍යාප්ත කර පවත්වාගෙන යාම.
- විශ්වමඩු හි සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවට සහ ආනවිලුන්දාන්හි උක් වගාකරුවන්ගේ සංගමයට උක් වගාව සහ නිෂ්පාදන සැකසීම සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම
- පර්යේෂණ අත්හදා බැලීම් ස්ථාපිත කිරීම සඳහා අක්කර 43 ක බිම් සකස් කිරීම.
- සෙවනගල, ලංකා සීනි (පුද්ගලික) සමාගමේ කර්මාන්තශාලාවට සහ අනෙකුත් ගැනුම්කරුවන් සඳහා උක් මෙට්‍රික් ටොන් 308 ක් සැපයීම.
- පර්යේෂණ වගාවන්ට සහ අනෙකුත් බෝග වලට ජලය සැපයීම සඳහා පර්යේෂණ ගොවිපලෙහි අඟල් 3 PVC වාරිමාර්ග පද්ධතිය මීටර් 335 කින් ව්‍යාප්ත කිරීම.
- නිර්දේශිත කළමනාකරණ පිළිවෙත් යටතේ පැල බෝගයේ සිට දෙවන නිරි බෝගය දක්වා කාබනික උක් වගාවේ උක් අස්වැන්න සැලකිය යුතු ලෙස අඩු නොවන බව හඳුනා ගැනීම
- ඒකාබද්ධ පාංශු සමීක්ෂණය, විශ්ලේෂණය, අස්වැන්න තක්සේරුව සහ ඩිජිටල් සිතියම්ගත කිරීම හරහා සෙවනගල තවාන් ප්‍රදේශය සඳහා GIS මත පදනම් වූ පස් සහ තවාන් කළමනාකරණ පද්ධතියක් සංවර්ධනය කරන ලදී.
- වාණිජ උක් වගාව සඳහා සුදුසු කාබනික පාදක ශාක පෝෂණ අධ්‍යයනය යටතේ 3 වන රැටූන් බෝගය සඳහා ක්ෂේත්‍ර මංපෙත් නඩත්තු කිරීම, දත්ත රැස් කිරීම සහ විශ්ලේෂණය.
- SL 96 128 සහ Co 0775 යන උක් ප්‍රභේදවලට දිගුකාලීන පොහොර බලපෑම ක්ෂේත්‍ර මංපෙත් නඩත්තු කිරීම සහ අස්වනු නෙලීම.
- පෝෂක මුදා හැරීමේ විශ්ලේෂණය, පොහොර නිෂ්පාදනය, අත්හදා බැලීම් ස්ථාපිත කිරීම, නඩත්තු කිරීම සහ කොළ සාම්පල ලබා ගැනීම ඇතුළුව උක් බොයිලර් අළු වලින් සංවර්ධනය කරන ලද නයිට්‍රජන්-පොහොසත් කාබන් පොහොරක බඳුන් සහ ක්ෂේත්‍ර මට්ටමේ ඇගයීම් සිදු කරන ලදී.
- පස සංශෝධනයක් ලෙස උක් බැගස් මත පදනම් වූ බොයිලර් අළු යෙදීම පිළිබඳ බෝග පෝෂණ උපදේශන චක්‍රලේඛයක් නිෂ්පාදනය කිරීම.
- ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය පොහොර වන සින්ක් සල්ෆේට් ($ZnSO_4$) යෙදීම පිළිබඳ බෝග පෝෂණ උපදේශන චක්‍රලේඛයක් නිෂ්පාදනය කිරීම
- ඇතිමලේ වැවිලි සමාගමේ වත්තේගම ප්‍රදේශය සඳහා පාංශු රසායනික විශ්ලේෂණය සම්පූර්ණ කර ඩිජිටල් පාංශු සිතියම් සංවර්ධනය කරන ලද අතර, එමඟින් තවාන් සහ වාණිජ උක් වගාව සඳහා අන්තර්කාලීන පාංශු පෝෂක තක්සේරු කිරීම් සහ පොහොර නිර්දේශ ලබා ගැනීමට හැකි විය.
- හිඟුරාණ - බටහිර කලාපය, දීඝවාපිය කලාපය, ගල්මඩුව කලාපය සහ වරිපතංචේන සහ ගල්ඔය වතුයායේ නීත්ත කලාපයේ කොටසක ක්ෂේත්‍ර මට්ටමේ පාංශු සමීක්ෂණය සම්පූර්ණ කිරීම.

- උක් අන්තරාසර්ග විදිනයා (INB) (Chilo sacchariphagus indicus; Lepidoptera: Crambidae) කළමනාකරණය සඳහා Erianthus (වල් උක්) භාවිතය පිළිබඳ විමර්ශනයේදී Erianthus accession IND 8180 උක් අන්තරාසර්ග විදිනයාට බෙහෙවින් ගොදුරු විය හැකි බවත් එබැවින් එය විභව උගුල් බෝගයක් ලෙස නිර්දේශ කර ඇති බවත් Erianthus accession MOL 4503 උක් අන්තරාසර්ග විදිනයාට බෙහෙවින් ප්‍රතිරෝධී වන බවත්, අන්තරාසර්ග විදිනයාට වැඩි ප්‍රතිරෝධයක් සහිත උක් ප්‍රභේද අභිජනනය සඳහා මාපිය රේඛාවක් ලෙස නිර්දේශ කර ඇති බවත් අනාවරණය විය.
- උක් වගාවේ වර්ධනය, අස්වැන්න සහ යුෂ වල ගුණාත්මක පරාමිතීන් කෙරෙහි අන්තරාසර්ග විදිනයාට (INB) හානියේ බලපෑම් පිළිබඳ අධ්‍යයනයකින් හෙළි වූයේ INB ආසාදනය සමස්ත ශාක වර්ධනය සහ උක් වගාවේ යුෂ වල ගුණාත්මකභාවය සැලකිය යුතු ලෙස අඩු කළ බවයි.
- INB සහ WLD විලෝපිකය කළමනාකරණය කිරීම සඳහා එන්ටොමොපොතජනික් දිලීර B. bassiana සාර්ථක උපාය මාර්ගයක් ලෙස තහවුරු කරන ලදී.
- වේයන් සහ WLD විලෝපිකය, රෝස පිටි දෝෂය කළමනාකරණය කිරීම සඳහා එන්ටොමොපොතජනික් දිලීර Metarizium සාර්ථක උපාය මාර්ගයක් ලෙස තහවුරු කරන ලදී.
- උක් වගාවේ සිටුවීමේදී පළිබෝධනාශක ශාක පත්‍ර භාවිතයෙන් පෙති නිෂ්පාදනයක් කිරීමක් සංවර්ධනය කිරීම සාර්ථක බව හඳුනා ගන්නා ලදී.
- සැකසුම් තාක්ෂණ අංශය සමඟ සහයෝගයෙන් ලෙමන්ග්‍රාස් සහ බැගස් භාවිතා කරමින් මදුරු විකර්ෂක සුවඳ දුම් දණ්ඩක් සාර්ථකව සංවර්ධනය කිරීම.
- උක් වගාවේ මුල් අවධියේදී සලබ බෝර කළමනාකරණයේදී ඵලදායී විලෝපිකයා ලෙස යුබොරාලියා විශේෂය ක්ෂේත්‍ර මට්ටමින් තහවුරු කිරීම
- උක් පළිබෝධ කළමනාකරණය සඳහා රසායනික නොවන උපාය මාර්ග සංවර්ධනය කිරීම, එනම් පැසුණු කොළ සහ බීජ දුම්කොළ සාරය ජලජ සාරයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස ඉහළ කාර්යක්ෂමතාවයකින් උක් ලොම් කුඩිත්තන් ඵලදායී ලෙස කළමනාකරණය කිරීමේදී ඵලදායී වේ
- වාණිජ උක් ප්‍රභේද 21 අතර සුදු කොළ රෝගයට (WLD) ප්‍රතිචාර දැක්වීමේදී විවිධ විචලනය හඳුනා ගැනීම. WLD ආසාදනය යටතේ SL 04 624 ප්‍රභේදය ඉහළ විචල්‍යතාවයක් පෙන්නුම් කළ අතර SL 00 603 සහ SLI 121 ප්‍රභේද අඩු විචල්‍යතාවයක් පෙන්නුම් කළේය.
- 2015 සහ 2016 ශ්‍රේණිවල උක් ප්‍රභේදවල ස්මට් (Smut) සහ කොළ පිලිස්සුම් රෝගය (LSD) සඳහා, 2012, 2013 සහ 2014 ශ්‍රේණිවල උක් ප්‍රභේදවල සුදු කොළ රෝගය (WLD) සඳහා ප්‍රතිරෝධක මට්ටම හඳුනා ගන්නා ලදී.
- සම්මත ප්‍රභේදවල රෝග වර්ධනය අධ්‍යයනය කිරීමේදී SL 00 652, SL96 128, SL 7103, SL 89 1673 සහ SL 954033 හි WLD හි ඉහළ සංවේදීතාවයක් (20% ට වඩා වැඩි) නිරීක්ෂණය කරන ලදී, SL98 2524, SL 906237, SL8306 සහ SLI 121 ප්‍රභේදවල මධ්‍යස්ථ WLD රෝග සංවේදීතාවයක් නිරීක්ෂණය කරන ලදී. SL 0095, SL86 13, SL 92 4997, SL 95 4430, SL 00 603, SL 925588, SL 7130, SL 96 328, SL 88 116, SL 00 354, SL 04 624 සහ SL 95 4443 WLD රෝග සිදුවීම් කිසිවක් වාර්තා වී නොමැත.
- උක් යුෂ පදනම් කරගත් වයින් සඳහා වට්ටෝරුවක් සංවර්ධනය කිරීම
- යීස්ට් වර්ග විසි දෙකක් වෙන් කර ගුණාත්මක මධ්‍යසාර නිෂ්පාදනය සඳහා ඇගයීමට ලක් කරන ලදී; ඒ අතරින්, වාර්තා වූ ඉහළම මධ්‍යසාර අස්වැන්න 7.37 ± 0.06% කි.
- උක් යුෂ සඳහා කල් තබා ගැනීමේ ශිල්පීය ක්‍රම හඳුනා ගැනීම
- මින්ට් රසැති උක් හකුරු සංවර්ධනය කිරීම සහ එහි භෞතික රසායනික ලක්ෂණ විශ්ලේෂණය කිරීම

- බේකරි නිෂ්පාදන සඳහා උක් බැගස් ඇතුළත් පිටි සකස් කිරීම සංවර්ධනය කිරීම සඳහා මූලික අධ්‍යයනයන් සිදු කිරීම.
- උසස් තත්ත්වයේ උක් හකුරු නිෂ්පාදනයට කාබනික වගාවේ බලපෑම අධ්‍යයනය කිරීම සඳහා ක්ෂේත්‍ර අත්හදා බැලීමක් ස්ථාපිත කර පවත්වාගෙන යාම
- උක් හකුරු නිෂ්පාදනය සඳහා උක් ක්ෂේත්‍රයක් ස්ථාපිත කර පවත්වාගෙන යාම
- සෙවනගල උක් වගා කරන ලද ක්ෂේත්‍රවලින් එකතු කරන ලද පස සහ මුල් සාම්පලයෙන් නයිට්‍රජන් තිර කරන සහ පොස්පරස් ද්‍රාව්‍ය බැක්ටීරියා හුදකලා කර ජෛව රසායනික ලක්ෂණකරණය.
- SL 96 128, SL 03 983, සහ SL 03 354 යන උක් ප්‍රභේදවල අස්වනු නෙලීමෙන් පසු පිරිහීම පිළිබඳව මූලික අධ්‍යයනයක් සිදු කරන ලදී.
- SL 96 128 උක් ප්‍රභේදයේ විවිධ උක් දඬු කොටස්වල සම්පූර්ණ ද්‍රාව්‍ය ඝන ද්‍රව්‍ය (බ්‍රික්ස්) වල පසු අස්වනු වෙනස්කම් පිළිබඳව අධ්‍යයනය කරන ලදී.
- ගල්-ඔය පුද්ගලික සමාගම සඳහා සාදන ලද කාබනික පෙති (Pellets) සඳහා රෝද හතරේ ට්‍රැක්ටරයක සවිකර ඇති පෙති පොහොර යොදන යන්ත්‍රයේ ක්ෂේත්‍ර ඇගයීම් සිදු කරන ලදී.
- ලංකා සීනි සමාගමේ පැල්වත්ත සහ සෙවනගල උණු වතුර පිරිපහදු (HWT) ඒකකයේ නිරවද්‍යතාවය සහ නිසි ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා තාක්ෂණික සහාය සහ මග පෙන්වීම ලබා දෙන ලදී.
- 2025 වර්ෂයේ මිල ගණන් මත පදනම්ව උක් වගාවේ පිරිවැය සහ ප්‍රතිලාභ යාවත්කාලීන කරන ලදී. ඒ අනුව සෙවනගල ජලය සපයන සහ වැසි පෝෂිත අංශ, පැල්වත්ත, හිඟුරාන සහ ඇතිමලේ සඳහා වගා කරන ලද උක් හෙක්ටයාරයකට සාමාන්‍ය පිරිවැය පිළිවෙලින් රු. 777,463, රු. 600,455, රු. 435,466, රු. 568,673 සහ රු. 388,303 විය. සෙවනගල වසරකට උක් හෙක්ටයාරයකින් සාමාන්‍ය ශුද්ධ ආදායම ජලය සපයන (වාරිමාර්ග) සහ වැසි පෝෂිත යටතේ පිළිවෙලින් රු. 230,037 සහ 107,045 විය. පැල්වත්තේ වැසි පෝෂිත සහ හිඟුරාන වාරිමාර්ග යටතේ, ශුද්ධ ආදායම පිළිවෙලින් හෙක්ටයාරයකට රු. 94,534 සහ 171,327 වූ අතර ඇතිමලේ හි වර්ෂා පෝෂිත හෙක්ටයාරයකට රු. 111,697 විය.
- 2024 වර්ෂය තුළ සෙවනගල, පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ සීනි කර්මාන්තවල උක් ටොන් එකක වාණිජ වටිනාකම පිළිවෙලින් රු. 41,189, රු. 39,682, රු. 36,553 සහ රු. 40,617 ලෙස ඇස්තමේන්තු කර ඇත. ඒ අනුව, 2024 දී සෙවනගල වාරිමාර්ග අංශයේ, පැල්වත්ත, ගල්ඔය සහ ඇතිමලේ වැසි පෝෂිත අංශයේ ඉඩම් හෙක්ටයාරයකින් නිෂ්පාදනය කරන ලද උක් වල වාණිජ වටිනාකම පිළිවෙලින් රු. මිලියන 4.1, මිලියන 1.9, මිලියන 1.9 සහ 2.03 ක් වූ අතර එය තරඟකාරී භෝගවල ආදායමට වඩා බෙහෙවින් වැඩි විය.
- 2024 වර්ෂය තුළ සීනි ආනයන ප්‍රමාණය සහ වටිනාකම ඇස්තමේන්තු කිරීම පිළිවෙලින් ටොන් 583,000 ක් සහ රුපියල් බිලියන 117 කි.
- 2024 දී උක් කර්මාන්තයේ මුළු වටිනාකම රුපියල් බිලියන 31 ක් ලෙස ඇස්තමේන්තු කර ඇති අතර එය දළ දේශීය නිෂ්පාදිතයෙන් 0.12% කට ආසන්න විය.
- 2025 වර්ෂයේදී, තාක්ෂණ හුවමාරු සහ සංවර්ධන අංශය, පර්යේෂණ අංශවල සහාය ඇතිව, ගොවීන් සහ සීනි කර්මාන්ත නිලධාරීන් සඳහා උක් වගාව, සැකසීම සහ අදාළ විෂය ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් 13ක් පවත්වන ලදී. මේ සඳහා පුද්ගලයින් 573 දෙනෙකු සහභාගී වී ඇත. ඊට අමතරව, SRI හි විවිධ පාර්ශවකරුවන්ගේ ඉල්ලීම පරිදි, පර්යේෂණ අංශ සමඟ සහයෝගයෙන් පුහුණු, ප්‍රදර්ශන සහ දැනුවත් කිරීමේ වැඩසටහන් 23ක් පවත්වන ලදී. සමස්තයක් වශයෙන් පුද්ගලයින් 666 දෙනෙකු (සිසුන්, ව්‍යවසායකයින් ආදිය) සහභාගී වී ඇත.

- උක් අංශයේ පර්යේෂකයින්, ව්‍යාප්ති නිලධාරීන් සහ ගොවීන් අතර ව්‍යාප්ති පණිවිඩ හුවමාරු කිරීම සඳහා SRI TTD eSMS සේවාව අඛණ්ඩව පවත්වාගෙන යාම. SRI FB පිටුව, YouTube නාලිකාව හරහා සීනි කර්මාන්ත තොරතුරු බෙදා ගැනීම සහ SRI වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම අඛණ්ඩව සිදු කිරීම. ඊට අමතරව, SRI පුවත් පත්‍රිකාවේ (පුවත් හසුන) 14 වන වෙළුම ප්‍රකාශයට පත් කරන ලදී.
- ගොවීන්ගේ ක්ෂේත්‍ර චාරිකා 231ක් සිදු කරන ලදී (58 – පැල්වත්ත/මොනරාගල, 61 සියඹලාණ්ඩුව/ඇතිමලේ, 69 හිඟුරාන, සහ 43 සෙවණගල).

**අභියෝග**

- කාර්ය මණ්ඩල හිඟය
- අසංවිධානාත්මක කර්මාන්තය
- සීනි කර්මාන්තයේ සංවර්ධන ඉලක්කය සපුරා ගැනීම සඳහා ප්‍රතිපත්ති රාමුව සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක නොකිරීම.
- අනෙකුත් භෝග වලින් තරඟකාරිත්වය
- උක් පිළිබඳ වැරදි වැටහීම්
- ඉහළ ප්‍රාග්ධන අවශ්‍යතාවයක්
- උක් පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන්හි සැපයුම සහ ඉල්ලුම අතර නොගැලපීම
- SRI අධ්‍යයන සේවකයින් සඳහා ආකර්ශනීය බාහිර රැකියා අපේක්ෂාවන්
- මහජනතාව සහ ගොවීන් අතර SRI පිළිබඳ දැනුවත්භාවය නොමැතිකම
- විවිධ රජයේ පාලන තන්ත්‍ර යටතේ ප්‍රතිපත්තිවල නොගැලපීම්

**ඉදිරි ඉලක්ක**

- අදාළ පාර්ශවකරුවන් සමඟ සහයෝගයෙන් ඵලදායිතාව සහ ලාභදායීතාවය වැඩි දියුණු කරන උක් වගාව සහ ඇඹරීම සඳහා හොඳම පිළිවෙත් සංවර්ධනය කර බෙදා හැරීම.
- උක් කර්මාන්තයට බලපාන දේශගුණය, පාරිසරික සහ ජෛව ආරක්ෂණ අවදානම් නිරීක්ෂණය කිරීම සහ අවම කිරීම.
- පාරිසරික තිරසාරභාවය සහ සම්පත් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා නිරවද්‍ය ගොවිතැන, පුනර්ජනනීය බලශක්තිය සහ චක්‍රීය ආර්ථික මූලධර්ම වැනි උක් කර්මාන්තයේ තිරසාර නිෂ්පාදන සහ සම්පත්-භාවිත පිළිවෙත් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරීම.
- හඳුනාගත් උපායමාර්ගික දිශාවන් සහ වෙළඳපල ඉල්ලීම් මත පදනම්ව කොටස්කරුවන් සමඟ සහයෝගයෙන් උක් කර්මාන්තයේ විවිධාංගීකරණය ප්‍රවර්ධනය කිරීම.
- වෙනස්වන වෙළඳපල සහ තාක්ෂණික තත්වයන්ට අනුවර්තනය වීමට සහ නවෝත්පාදන හා ව්‍යවසායකත්වයේ සංස්කෘතියක් පෝෂණය කිරීමට අවශ්‍ය කුසලතා සහ දැනුමෙන් උක් කර්මාන්තය සහ පර්යේෂණ ප්‍රජාව සන්නද්ධ කරන අධ්‍යාපන හා පුහුණු වැඩසටහන් සංවර්ධනය කර ලබා දීම.
- උක් කර්මාන්තයේ පාරිසරික, ආර්ථික සහ සමාජීය බලපෑම නිරීක්ෂණය කිරීම සහ ඇගයීම සහ අනාගත පර්යේෂණ සහ ප්‍රතිපත්ති තීරණ සඳහා දැනුම් දීම සඳහා මෙම දත්ත භාවිතා කිරීම.

## 2.9.10 ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය (NPS)

**ප්‍රගතිය**

- 2025/26 ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය රාජ්‍ය, පාසැල්, සේවා හා නිෂ්පාදන යන ක්ෂේත්‍රයන් සඳහා ක්‍රියාත්මක වන අතර, මූලික අයදුම්පත් 6000ක් මේ සඳහා ලැබී ඇත. මෙම තරඟාවලිය සඳහා විනිශ්චයකරුවන් 750ක් 2025 වසර තුළදී පුහුණු කර ඇත. ජාතික ඵලදායිතා සම්මාන ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය ප්‍රචාරණ වැඩසටහන් 2025 වසර තුලදී පවත්වන ලදී.

- ප්‍රජා ඵලදායිතා වැඩසටහන යටතේ, සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම පවුල් 50කින් යුත් එක් ගම්මානයක් ප්‍රජා ඵලදායිතා ආදර්ශ ගම්මානයක් ලෙස සංවර්ධනය කෙරෙන අතර, මේ සඳහා ගම්මාන 312ක් තෝරා ගෙන ඇත.

- තරුණ ව්‍යවසායකයන් 1000ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහනෙහි පළමුවන අදියර දිස්ත්‍රික්ක 17ක ක්‍රියාත්මක වන අතර, ව්‍යවසායකයන් 504 මේ වනවිට තෝරාගෙන ඔවුන් සඳහා උපදේශන පැය 1576ක් ලබා දී ඇති අතර ඔවුන් සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් පුහුණු වැඩසටහන් 10ක් පවත්වා ඇත.

- රාජ්‍ය අංශය සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ ජාතික වැඩසටහන කෑගල්ල, කළුතර සහ රත්නපුර යන දිස්ත්‍රික්ක තුනෙහි පැවැත්වූ අතර, ඒ අතරින් ජාතික තලයට ගැලපෙන ලෙස වැඩිදියුණු කරන ලද ක්‍රියාවලි 08ක් ඇතුළත් සම්මන්ත්‍රණය 2025.11.11 දින අදාළ ආයතන ප්‍රධානීන් සහ අනෙකුත් පාර්ශවයන්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලදී.

- ආසියානු ඵලදායිතා සංවිධානය විසින් ලබාදෙන ලද නියමිත මාර්ගෝපදේශයන් හා ක්‍රමවේද අනුගමනය කිරීමෙන් අනතුරුව, ඵලදායිතා විශේෂඥයින් සඳහා වන ප්‍රතීතන සහතිකය (Certification for Productivity Specialists ) ආසියානු ඵලදායිතා සංවිධානය විසින් 2025. 11. 20 දින ශ්‍රී ලංකාව වෙත පිරිනමන ලදී.

- ආසියානු ඵලදායිතා සංවිධානය සහ කොරියානු සංවර්ධන ආයතනයේ සත්කාරකත්වය තුළින් “ශ්‍රී ලංකාව සඳහා වන ඵලදායිතාව පිළිබඳ ඉදිරි සැලැස්ම” (National Productivity Master Plan) ආසියානු ඵලදායිතා සංවිධානයේ මහලේකම් විසින් 2025. 11. 20 දින ගරු අග්‍රාමාත්‍යතුමිය වෙත පිළිගන්වන ලදී.

- ආසියානු ඵලදායිතා සංවිධානයේ සත්කාරකත්වය මත හා විදේශීය සම්පත් දායකත්වය තුළින් පුහුණු වැඩසටහන් 05ක් පවත්වා ඇති අතර, මේ තුළින් 165 දෙනෙක් පුහුණුව ලබා ඇත.

- ආසියානු ඵලදායිතා සංවිධානයේ සත්කාරකත්වය මත APO Vision 2025 සම්මන්ත්‍රණය 2025. 11. 14 දින පවත්වන ලදී. මේ යටතේ තරුණ නව නිපැයුම්කරුවන් දිරිගැන්වීම සඳහා කෘත්‍රිම බුද්ධිය ආශ්‍රිතව සැකසුණු වීඩියෝ සහ නව්‍යකරණ යෝජනා තරඟාවලියක් පවත්වන ලද අතර, මේ තරඟාවලිය යටතේ ජයග්‍රහණය කරන ලද 08 දෙනෙකුගේ නිර්මාණ මෙදින ඉදිරිපත් කරන ලදී. මෙයට අමතරව, නව්‍යකරණය පදනම් කරගත් වීඩියෝ පට 06ක් එළිදැක්වීම, කුඩා හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ආශ්‍රිතව නිපදවන ලද වීඩියෝ පට 08ක් එළිදැක්වීම සහ රිදීගම සංචාරක ගමනාන්තයේ පාරිසරික ව්‍යවසායකයින් පාදක කර ගනිමින් නිර්මාණය කරන ලද වීඩියෝ පටය එළිදැක්වීම ද මෙදින සිදුකරන ලදී.

- 2025. 09. 23 දින National Productivity Symposium පවත්වන ලද අතර,
  - ආයතනික විශිෂ්ටත්වය සහ ව්‍යවසායකත්වය,
  - හරිත ඵලදායිතාවය හා තිරසාර නවෝත්පාදනය,
  - ඩිජිටල් පරිවර්තනය, සුපරික්ෂිත තාක්ෂණය, (Smart Technology) සහ දත්ත මත පදනම් වූ රාජ්‍ය පාලනය (Data Driven Governance)

  යන තේමාවන් 3ක් යටතේ පර්යේෂණ පත්‍රිකා 24ක් ඉදිරිපත් කරන ලද අතර, ඵලදායිතා විෂය පිළිබඳ ශාස්ත්‍රීය සංවාදයක් ද ඇතිවිය.

- කාර්යක්ෂම මහජන සේවයක් උදෙසා ප්‍රාදේශීය පරිපාලනය ශක්තිමත් කිරීමේ අරමුණින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල කේන්ද්‍ර කර ගනිමින් ඵලදායිතා හා ගුණාත්මක දර්ශක සැකසීමේ වැඩසටහනක් වන Citizen Mirror වැඩසටහන ක්‍රියාත්මක වන අතර, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 285ක් මෙම වැඩසටහන සමග සම්බන්ධ වී ඇත.

- මානව ප්‍රාග්ධනය හා ආයතනික විශිෂ්ටත්වය සංවර්ධනය කරලීමේ අරමුණින්, රාජ්‍ය, පෞද්ගලික හා ප්‍රජා යන ක්ෂේත්‍ර කේන්ද්‍ර කර ගනිමින් පුහුණු හා උපදේශන සේවා වැඩසටහන් පවත්වා ඇත. ප්‍රධාන වැඩසටහන් 08ක් යටතේ ආංශික වැඩසටහන් 68ක් දිස්ත්‍රික්ක මට්ටමින් පවත්වා ඇත.

- විවිධ ආයතන වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව 5S සහතිකකරණ වැඩසටහන පවත්වන ලද අතර, 2025 වසර තුළදී එලෙස ඉල්ලීම් ලද ආයතන වෙනුවෙන් විගණන කටයුතු 68ක් පවත්වා ඇත.

### අභියෝග

- 2025/26 ජාතික ඵලදායිතා සම්මාන තරඟාවලිය සඳහා රාජ්‍ය, පාසැල් සහ නිෂ්පාදන හා සේවා යන අංශ වලට අදාළව ආයතන 6000 ක් ලියාපදිංචි වී ඇති අතර, අදාල අයදුම්පත් නියමිත කාලය තුලදී ගෙන්වා ගැනීම යම් තරමක අභියෝගයක් වී ඇත.

- ඇතැම් ක්ෂේත්‍රයන් සඳහා මානව සම්පත ප්‍රමාණවත් නොවීම

### ඉදිරි ඉලක්ක

ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය විසින් ඉදිරි පස් වසර තුලදී පහත සඳහන් අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

1. වසර 2030 වනවිට තෝරාගත් කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හරහා නිෂ්පාදන අංශයේ පිරිවැටුම 10% කින් ඉහළ නැංවීමට සහාය වීම
2. ආයතනික විශිෂ්ටතාවය උදෙසා රාජ්‍ය, පාසැල්, නිෂ්පාදන හා සේවා යන අංශවල ආංශික ඵලදායිතාවය වර්ධනය කිරීම
3. වසර 2030 වනවිට ප්‍රජා ඵලදායිතාවය තුළින් දකුණු ආසියාවේ විශිෂ්ටතමයා බවට ශ්‍රී ලංකාව පත්වීම
4. වසර 2030 වනවිට රාජ්‍ය අංශයේ ආයතනවල සේවා කාර්යක්ෂමතාව වර්ධනය උදෙසා ජාතික මට්ටමේ ප්‍රමිතීන් ස්ථාපිත කිරීම
5. ISO 17024 ට අනුකූලව ආසියානු ඵලදායිතා සංවිධානයේ සාර්ථකම ඵලදායිතා විශේෂඥයින් සහතික කිරීමේ ආයතනය බවට ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය පත්වීම

ඒ අනුව 2026 වසර තුළදී පහත සඳහන් ඉලක්ක ඉටුකර ගැනීමට අපේක්ෂිත වේ.

- ජාතික ඵලදායිතා සම්මාන ප්‍රදානෝත්සවය 2026 වසරේ අග භාගයේදී පැවැත්වීම සහ ජයග්‍රාහකයින් ඇගයීම සිදුකෙරෙන අතර, පළාත් මට්ටමින් පළාත් සම්මාන උළෙලවල් පැවැත්වෙනු ඇත. එයට අමතරව, විශිෂ්ට අත්දැකීම් හුවමාරු වැඩසටහන්, පූර්ව සූදානම් තුළින් අනාගත ජයග්‍රාහකයින්ගේ වැඩසටහන (Future Winners Program) සහ සම්මාන සඳහා සූදානම් වීමේ ස්වයං ඇගයීමේ වැඩසටහන (Award readiness self-evaluation program) වැනි දෑ පැවැත්වීමට නියමිතය.
- ප්‍රජා ඵලදායිතා වැඩසටහන යටතේ ආදර්ශ ගම්මාන 320 ක් ස්ථාපිත කිරීම සිදුවනු ඇත.
- තරුණ ව්‍යවසායකයන් 1000ක් සංවර්ධනය කිරීමේ ජාතික වැඩසටහන යටතේ පළමු වටයට තෝරා නොගත් ඉතිරි දිස්ත්‍රික්ක 08 ආවරණය කරමින් තවත් ව්‍යවසායකයන් 500ක් සංවර්ධනය කිරීම හා ව්‍යවසායකයන් අපනයන වෙළෙඳපොලට යොමු කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.
- රාජ්‍ය අංශය සඳහා ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ ජාතික වැඩසටහන මගින් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම සහ එමගින් රාජ්‍ය අංශයේ නිලධාරීන් 40 දෙනෙක් පුහුණු කිරීම සිදුවන අතර සෑම රාජ්‍ය ආයතනයක් වෙතම ක්‍රියාවලි වැඩිදියුණු කිරීමේ ජාතික වැඩසටහන හඳුන්වා දීමට නියමිතය.
- ජාතික ඵලදායිතා ප්‍රතිපත්තිය සඳහා කෙටුම්පතක් සකස් කිරීම
- මානව සම්පත් සංවර්ධනය සහ ආයතනික විශිෂ්ටතාවය උදෙසා පහත සඳහන් පුහුණු හා උපදේශන වැඩසටහන් 15ක් ක්‍රියාත්මක කිරීම
    - ඵලදායිතාව පිළිබඳ ජාතික ඩිප්ලෝමා පාඨමාලා - 01
    - රාජ්‍ය අංශයේ ඵලදායිතා වර්ධනය උදෙසා උසස් සහතික පත්‍ර පාඨමාලා - 01
    - ඵලදායිතාව ආශ්‍රිත සහතික පත්‍ර පාඨමාලා - 05
    - සහතිකලත් ඵලදායිතා වෘත්තිකයන් බිහිකිරීමේ ධාරිතා සංවර්ධන වැඩසටහන් - 01
    - පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් - 02
    - ඵලදායිතා සංකල්ප ආශ්‍රිත වෙනත් පුහුණු වැඩසටහන් හා වැඩමුළු - 05
- ආසියානු ඵලදායිතා සංවිධානයේ සහයෝගිතාවය මත ධාරිතා සංවර්ධනය හා පුහුණු වැඩසටහන් 04ක් පැවැත්වීම
- ඵලදායිතා විෂය ක්ෂේත්‍රයේ නියුතු වූවන් වෘත්තිකයන් ලෙස සංවර්ධනය සඳහා ප්‍රතීතනය කිරීමට පවත්වනු ලබන සහතිකකරණ වැඩසටහන තුළින් සහතිකලත් ඵලදායිතා විශේෂඥයින් 10 දෙනෙකු බිහිකිරීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල 250ක් සඳහා "Citizen Mirror" වැඩසටහන යටතේ ඵලදායිතා හා ගුණාත්මක දර්ශක සැකසීම
- රාජ්‍ය, පෞද්ගලික, අධ්‍යාපන සහ ප්‍රජා අංශ කේන්ද්‍ර කර ගනිමින් 5S සහතිකකරණ වැඩසටහන යටතේ විගණන 46ක් සම්පූර්ණ කිරීම

## 2.9.11 පේෂකර්මාන්ත දෙපාර්තමේන්තුව (DTI)

**ප්‍රගතිය**

- පේෂ කර්මාන්තයේ නියැලෙන ශිල්පීන්, ව්‍යවසායකයින් හා පේෂ කර්මාන්ත උපදේශකවරුන් ඉලක්ක කර ගනිමින් පේෂ කර්මාන්තයේ ගුණාත්මක සංවර්ධනය සඳහා විවීම්/ මෝස්තර/ නිෂ්පාදන සංවර්ධන පුහුණු වැඩසටහන් හා වැඩමුළු පැවැත්වීම යටතේ සියළු පළාත් ආවරණය වන පරිදි කර්මාන්තයේ නියැලෙන්නන් 486ක් පුහුණු කිරීම සිදු කරන ලදි.

- පේෂ කර්මාන්ත දෙපාර්තමේන්තුව යටතේ ක්‍රියාත්මක වන පේෂ කර්මාන්ත පුහුණු ආයතන 14 ක් මඟින් පවත්වන පූර්ණකාලීන පාඨමාලා වන පේෂ කර්මාන්තය පිළිබඳ සය මාසික මූලික පුහුණු පාඨමාලාව හා මාස 13ක අවසාන සහතිකපත්‍ර පාඨමාලාව තුළින් අදාළ පුහුණුව ලබා දෙයි. මෙමගින් සිංහල සහ දෙමළ මාධ්‍ය ඔස්සේ අත් යන්ත්‍ර පේෂ කර්මාන්තය පිළිබඳව පුළුල් න්‍යායාත්මක සහ ප්‍රායෝගික පුහුණුවක් ලබා දෙන අතර 2025 වර්ෂයේ දී මෙරට අත්යන්ත්‍ර ක්ෂේත්‍රය සඳහා තාක්ෂණික දැනුම සහිත නව පුහුණුලාභීන් 95ක් පුහුණු කරන ලදි.

- 2025 වර්ෂයේ දී මොරටුව විශ්ව විද්‍යාලයේ විලාසිතා නිර්මාණකරණය පිළිබඳ උපාධි පාඨමාලාව හදාරන සිසුන් හට විවීම පිළිබඳ ප්‍රායෝගික පුහුණු මොඩියුල සඳහා අවශ්‍ය සම්පත්දායකත්වය ලබා දෙමින් වැඩසටහන් පැවැත්වීම ආරම්භ කරන ලදි. ඒ අනුව, සිසුන් 70ක් සඳහා මාස 06ක ප්‍රායෝගික පුහුණුව ලබාදෙන ලද අතර උපාධිධාරීන්, අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ රඳවා ගනිමින් ව්‍යවසායකත්ව ප්‍රවර්ධනය මෙමගින් අපේක්ෂිතය.

- අත්යන්ත්‍ර පේෂ කර්මාන්ත ක්ෂේත්‍රයේ නියැලෙන්නන් සඳහා අලෙවි අවස්ථා සහ ව්‍යාපාර සම්බන්ධීකරණ අවස්ථා සලසා දීමේ අරමුණින් 2025 වර්ෂයේදී අප්‍රේල් සහ දෙසැම්බර් මාසවල දී අලෙවි සල්පිල් පැවැත්වීමට කටයුතු කරන ලදි. අලෙවිකරුවන් 86ක් සඳහා පහසුකම් සපයා දෙන ලද අතර ඔවුන් ලද සමස්ත ආදායම රු.මි.20.5කි. එමගින් නව ව්‍යාපාර සම්බන්ධතා නිර්මාණය වීම ද පසු ඇණවුම් ලැබීම ද සිදුව ඇත.

- 2025 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද ග්‍රාමීය අත්යන්ත්‍ර ස්වයං රැකියා කණ්ඩායම් ව්‍යාපෘති මගින් ස්වයං රැකියාලාභීන් 39ක් කර්මාන්තගත කර ඇත.

- අත්යන්ත්‍ර පේෂ කර්මාන්තය සතු සාම්ප්‍රදායික විවීම් ක්‍රමවේද සහ ආවේණික මෝස්තර රාශියක් පවතින අතර දෙපාර්තමේන්තුව විසින් එම ක්‍රමවේද අත්හදා බැලීම, හඳුන්වා දීම සහ ලේඛණගත සංරක්ෂණය සිදු කරනු ලබයි. එකිනෙකට වෙනස් වූ සාම්ප්‍රදායික විවීම් ක්‍රමවේද සාම්පල 70ක් පමණ සිදු කර ක්ෂේත්‍රයේ නියුතු පුද්ගලයන්ට පරිහරණය කළ හැකි අත්පොතක් නිර්මාණය කරන ලදි.

# පරිච්ඡේදය 03

## වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය

# 3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ- ඒෆ්

## 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

| සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2025 රු. | | සටහන | තත්‍ය 2025 රු. | 2,024 රු. | |
|---|---|---|---|---|---|
| - | **ආදායම් ලැබීම්** | | - | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | - | - | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | - | - | |
| - | **ආදායම් නොවන ලැබීම්** | | - | - | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 6,012,680,817 | 5,522,882,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 24,698,302 | 15,577,235 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම් | | 114,047,859 | 44,425,198 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **6,151,426,978** | **5,582,884,433** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **6,151,426,978** | **5,582,884,433** | |
| | **භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)** | | 43,379,665 | 115,045,632 | |
| | **ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)** | | **6,108,047,313** | **5,467,838,801** | |
| | **අඩු කළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | - | - | |
| 2,219,919,498 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 2,175,779,183 | 1,169,567,136 | ඒසීඒ-2(ii) |
| 439,765,465 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 367,726,081 | 292,704,941 | |
| 1,921,335,159 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 1,748,195,838 | 1,319,382,208 | |
| - | පොළී ගෙවීම් | 8 | - | - | |
| 100,000 | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | 74,883 | 28,956 | |
| 4,581,120,122 | **මුළු පුනරාවර්තන වියදම් (ඊ)** | | **4,291,775,984** | **2,781,683,241** | |
| | **මූලධන වියදම්** | | | | |
| 66,300,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 35,276,618 | 30,770,026 | ඒසීඒ-2(ii) |
| 67,100,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 32,899,111 | 13,123,502 | |
| 2,231,000,000 | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | 1,356,967,525 | 624,372,792 | |
| 5,484,000,000 | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම | 13 | 2,543,977,000 | 3,353,910,762 | |
| 8,500,000 | හැකියා වර්ධනය | 14 | 4,755,328 | 1,839,219 | |
| 2,214,500,000 | වෙනත් මූලධන වියදම් | 15 | 974,927,872 | 742,831,509 | |
| 10,071,400,000 | **මුළු මූලධන වියදම් (උ)** | | **4,948,803,455** | **4,766,847,810** | |
| | තැන්පතු ගෙවීම් | | 10,324,576 | 14,150,900 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 322,173,244 | 68,192,706 | ඒසීඒ-5 |
| | වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම් | | - | - | |
| | **ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)** | | **332,497,820** | **82,343,606** | |
| | **මුළු වියදම් එ = (ඊ+උ+ඌ)** | | 9,573,077,259 | 7,630,874,656 | |
| - | **දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)** | | **(3,465,029,945)** | **(2,163,035,855)** | |
| | **අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය** | | (3,465,204,691) | (2,164,369,172) | ඒසීඒ-7 |
| | **දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය** | | 174,746 | 1,333,317 | ඒසීඒ-3 |
| | | | **(3,465,029,945)** | **(2,163,035,855)** | |

# 3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2025 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය**

| | සටහන | සත්‍ය 2025 රු. | 2,024 රු. |
|---|---|---|---|
| **<u>මූල්‍ය නොවන වත්කම්</u>** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,774,270,077 | 2,022,445,400 |
| **<u>මූල්‍ය වත්කම්</u>** | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 308,809,585 | 100,684,200 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | 174,746 | 1,333,317 |
| මුළු වත්කම | | 3,083,254,408 | 2,124,462,918 |
| **<u>ශුද්ධ වත්කම / ස්කන්ධය</u>** | | | |
| භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම | | 234,895,417 | 41,393,965 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,774,270,077 | 2,022,445,400 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| **<u>ජංගම වගකීම්</u>** | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 73,914,167 | 59,290,235 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | 174,746 | 1,333,317 |
| මුළු වගකීම් | | 3,083,254,408 | 2,124,462,918 |

පිටු අංක..........සිට ......... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක .......... සිට .......... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි **150** හා **151** සහ **2025.12.17** දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක **02/2025** විධිවිධානයන්ට අනුකූලව සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ප්‍රධාන ගණන්දීමේ නිලධාරී | ගණන්දීමේ නිලධාරී | ප්‍රධාන මූල්‍ය නිලධාරී/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්) |
| නම : | නම : | නම : |
| තනතුර : | තනතුර : | |
| දිනය : 2026/02/24 | දිනය : 2026/2/24 | දිනය : 2026/02/25 |
| ජේ.එම්. තිලකා ජයසුන්දර<br>ලේකම්<br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br>73/1, ගාලු පාර, කොළඹ 03. | ජේ.එම්. තිලකා ජයසුන්දර<br>ලේකම්<br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br>73/1, ගාලු පාර, කොළඹ 03. | කේ.ඒ. බන්දුල තුරුප්පු<br>ප්‍රධාන මූල්‍ය නිලධාරී (වැ.බ.)<br>කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය<br>73/1, ගාලු පාර, කොළඹ 03. |

# 3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

**2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා**

**මුදල් ප්‍රවාහ ප්‍රකාශනය**

| | තත්‍ය 2025 රු. | සංශෝධිත 2024 රු. |
|---|---|---|
| **<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | - |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | - | - |
| වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම් | 133,995,502 | 200,763,153 |
| අග්‍රිම ලැබීම් | 6,012,680,817 | 5,522,882,000 |
| අත්තිකාරම් අයකර ගැනීම් | 194,133,671 | 69,169,180 |
| තැන්පතු ලැබීම් | 24,775,913 | 18,007,352 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)** | **6,365,585,902** | **5,810,821,685** |
| **<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 2,146,024,155 | 1,406,439,718 |
| සහනාධාර සහ මාරුකිරීම් | 153,516,474 | 27,349,077 |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම් | 1,027,087,468 | 28,956 |
| වෙනත් පුනරාවර්තන වියදම් | 74,883 | |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 85,359,024 | 2,283,185 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 43,379,665 | 115,045,632 |
| අත්තිකාරම් ගෙවීම් | 333,198,744 | 68,192,731 |
| තැන්පතු ගෙවීම් | 10,402,187 | 16,581,067 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)** | **3,799,042,599** | **1,635,920,366** |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ)** | **2,566,543,304** | **4,174,901,319** |
| **<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උපණය අයකර ගැනීම් | - | - |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)** | **-** | **-** |

| | | |
|---|---|---|
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම් | 2,567,701,873 | 4,173,568,002 |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)** | **2,567,701,873** | **4,173,568,002** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඇ)-(ඉ)** | **(2,567,701,873)** | **4,173,568,002)** |
| **මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ)** | **(1,158,570)** | **1,333,317** |
| <u>**මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්**</u> | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | - | - |
| ප්‍රදානයන් ලැබීම් | | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)** | **-** | **-** |
| <u>අඩුකළා : මුදල් වැය කිරීම්</u> | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)** | **-** | **-** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)** | **-** | **-** |
| **මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)** | **(1,158,570)** | **1,333,317** |
| **ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය** | **1,333,317** | **-** |
| **දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය** | **174,747** | **1,333,317** |

*** 2025 වර්ෂය තුල මුළු අග්‍රිම ලැබීම් රු. 6,012,680,816.83 වන අතර විදේශ ප්‍රදානයන්ට අදාල ලැබීම් වන රු. 36,667,781 ක් ද එහි ඇතුලත් වේ.**

ඒපිඒ -2

# 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වියදම් ශීර්ෂ අංකය : 149

අමාත්‍යාංශයේ නම : කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමේහි නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම් (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම්) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 1,392,700,000 | - | (66,650,000) | 1,326,050,000 | 1,284,582,126 | 41,467,874 |
| | (2) ප්‍රාග්ධන | 143,800,000 | - | 1,100,000 | 144,900,000 | 103,080,068 | 41,819,932 |
| | උප එකතුව | 1,536,500,000 | - | (65,550,000) | 1,470,950,000 | 1,387,662,193 | 83,287,807 |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | 3,069,000,000 | 120,520,122 | 65,550,000 | 3,255,070,122 | 3,007,193,859 | 247,876,263 |
| | (2) ප්‍රාග්ධන | 8,926,500,000 | 1,000,000,000 | - | 9,926,500,000 | 4,845,723,387 | 5,080,776,613 |
| | උප එකතුව | 11,995,500,000 | 1,120,520,122 | 65,550,000 | 13,181,570,122 | 7,852,917,246 | 5,328,652,876 |
| | මුළු එකතුව | 13,532,000,000 | 1,120,520,122 | - | 14,652,520,122 | 9,240,579,439 | 5,411,940,683 |

.........................................................

ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/ අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)

දිනය : 2026/02/25

කේ.ඒ. බන්දුල
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව
අමාත්‍යාංශය
73/1, ගාලු පාර, කොළඹ 03.

## 3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

### වාර්තා කිරීමේ පදනම

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනා ගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේ දී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අදාළ නොවේ | - | - |
| 1.6 | වෙනත් | අදාළ නොවේ | - | - |
| **2** | **පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)** | | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | - |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙලකර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | - | - |
| **3** | **මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | - | - |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | - | - |
| 3.3 | සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම | අනුකූල වේ | - | - |
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | - | - |
| **4** | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | - | - |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | - | - |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **5** | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| **6** | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම | අනුකූල වේ | | |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **7** | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම. | රැස්වීම් 4ක් පවත්වා තිබේ. අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **8** | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල නොවේ | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කර ඇති නමුත් ඔවුන් තවමත් එම වාර්තා ඉදිරිපත් කර නැත. | එම වාර්තා ලද වහාම මෙම කාර්යය නිම කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 8.4 | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල නොවේ | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තා තවමත් ඉදිරිපත් කර නැත. | එම වාර්තා ලද පසු අදාළ කාර්යය නිම කිරීමට කටයුතු කරනු ලැබේ. |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම | අනුකූල වේ | | |
| **9** | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම | අනුකූල වේ | | |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම | අනුකූල වේ | | |
| **10** | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| **11** | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **12** | **රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන්ට වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල නොවේ | අදාළ නිලධාරීන්ගේ සහ ඇප කරුවන්ගේ නියමිත පරිදි අය කර ගැනීමට කටයුතු කිරීම. | අදාළ නිලධාරීන්ගේ සහ ඇප කරුවන්ගේ නියමිත පරිදි අය කර ගැනීමට කටයුතු කිරීම. |
| **13** | **පොදු තැන්පත් ගිණුම** | | | |
| 13.1 | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම. | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| **14** | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |
| 14.2 | මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | අදාල නොවේ | | |
| 15.1 | අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | | | |
| 15.2 | රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | | | |
| 15.3 | මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීනකර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කර ගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 18.2 | එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල වේ | | |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල වේ | - | - |
| 19.3 | ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම | - | - | - |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම | අනුකූල වේ | - | - |
| **20** | **විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |

# Annexture

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/E/MOI/2025/FS
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2025 ජුලි 14 දින

කර්මාන්ත අමාත්‍යාංශය 15 JUL 2026 පාලන අංශය

කර්මාන්ත අමාත්‍යාංශය 16 JUL 2026 398 ලේකම් අංශය

ලේකම්
කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

**ශීර්ෂය - 149, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

යථෝක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ මුල් පිටපත් (සිංහල,ඉංග්‍රීසි,දෙමළ) මේ සමඟ එවා ඇත.

එම්.ඩී.සුදර්ශනී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පිටපත: - අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව    இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை.    No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34    +94 11 2 88 72 23    ag@auditorgeneral.gov.lk    www.naosl.gov.lk

# ජාතික විගණන කාර්යාලය
## தேசிய கணக்காய்வு அலுவலகம்
## NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } IMT/E/MOI/2025/FS   ඔබේ අංකය / உமது இல. / Your No. }   දිනය / திகதி / Date } 2026 ජූලි 14 දින

ප්‍රධාන ගණන්දීමේ නිලධාරී,
කර්මාන්ත සහ ව්‍යයසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය.

**ශීර්ෂය 149 - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.**

---

**1.** මූල්‍ය ප්‍රකාශන

**1.1** තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 149 - කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ(සංශෝධිත) 11(2) වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථාකාලයේදී නිකුත්කරණු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව   இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.   No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34   +94 11 2 88 72 23   ag@auditorgeneral.gov.lk   www.naosl.gov.lk

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් **1** කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මාගේ වාර්තාව කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය විකරණය කරනු නොලැබේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ආදායම් නොවන ලැබීම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වලට අනුව තැන්පතු ලැබීම් හා අත්තිකාරම් ලැබීම් පිළිවෙළින් රු.24,673,538ක් හා රු.117,084,153ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් නොවන ලැබීම් යටතේ එම ශේෂයන් පිළිවෙළින් රු.24,698,302 ක් හා රු.114,047,859ක් ලෙස දැක්වීම

හේතුවෙන් තැන්පතු ලැබීම් ශේෂය රු.24,764ක් වැඩියෙන් හා අත්තිකාරම් ලැබීම් ශේෂය රු.3,036,294ක් අඩුවෙන් දක්වා තිබීම නිසා ශුද්ධ ආදායම් ලැබීම් රු.3,011,530ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.2 තැන්පතු ගෙවීම් සහ අත්තිකාරම් ගෙවීම්

භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතවලට අනුව තැන්පතු ගෙවීම් හා අත්තිකාරම් ගෙවීම් පිළිවෙළින් රු.10,049,554ක් හා රු.325,209,537ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ එම ශේෂයන් පිළිවෙළින් රු.10,324,574ක් හා රු.322,173,244ක් ලෙස දැක්වීම හේතුවෙන් තැන්පතු ගෙවීම් ශේෂය රු.275,020ක් වැඩියෙන් ද අත්තිකාරම් ගෙවීම් ශේෂය රු.3,036,293ක් අඩුවෙන්ද දක්වා තිබීම නිසා වියදම් රු.2,761,273ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.6.3 මූල්‍ය නොවන වත්කම්

(අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් යටතේ මිලදී ගැනීම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ රු.23,793,873ක්වූ භාණ්ඩාගාර CIGAS සටහන අනුව අගය හා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.32,899,111ක මූලධන වත්කම් අත්පත් කර ගැනීම් වැය විෂයයන් හි එකතු වටිනාකම සමඟ සැසඳීමේදී රු.9,105,238ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශයට අයත් වාහනයක් රු.11,027,000කට අපහරණය කර තිබුණද එය මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ (SA 82 ) වත්කම් ඉවත් කිරීම් තුල ඇතුළත් කර නොතිබීම නිසා වත්කම් අගය එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) 2024 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය මගින් සිදු කළ නිර්දේශ පරිදි භාණ්ඩ අයිතම 52ක් 2025 වර්ෂය තුළ අපහරණයකර තිබුණද එම භාණ්ඩවල පිරිවැය වටිනාකම හඳුනාගෙන ගිණුම්වලින් ඉවත්කර නොතිබුණි.

(ඈ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 82) අනුව අමාත්‍යාංශය සතුව එකතු වටිනාකම රු.5,513,319ක් වූ යතුරු පැදි 34ක් පවතින බව දක්වා තිබුණද අමාත්‍යාංශය සතුව යතුරු පැදි 02ක් පමණක් පැවතුණි.

(ඉ) ප්‍රවාහන අංශය සතු වාහන උපලේඛනය අනුව අමාත්‍යාංශයට අයත් වාහන 26 ක් පැවතුනද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයට අනුව (SA 82) එම වාහන වටිනාකම් තත්සේරුකර වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) එකතු වටිනාකම රු.52,200,000ක්වූ රථවාහන 12ක අයිතිය අමාත්‍යාංශයට පවරාගෙන නොතිබුණද භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයට අනුව (SA 82 )වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

4

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

(උ) 2025 ජුනි 19 දින අපහරණය කරන ලද මෝටර් වාහනයක් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,700,000ක් වටිනා තවදුරටත් පවතින වත්කමක් ලෙස භාණ්ඩාගාර පරිගණක මුද්‍රිතයට අනුව (SA 82 ) දක්වා තිබුණි.

(ඌ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත (SA 82) අනුව හා මූල්‍ය නොවන වත්කම් යටතේ වාහන වටිනාකම රු.825,173,643ක් ලෙස දක්වා තිබුණද විගණනයට ඉදිරිපත්කරන ලද සිගාස් වැඩසටහන අනුව රථවාහන වටිනාකම රු.693,225,381ක් ලෙස රු.131,948,262ක් අඩුවෙන් දක්වා තිබුණි.

**2.** **වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ පහත නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ කළමනාකරණ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශ | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.2.1(**v**) | සිගාස් වැඩසටහන යටතේ අමාත්‍යාංශය සතුව එකතු වටිනාකම රු.5,513,319ක් වූ යතුරු පැදි 34ක් පවතින බව දක්වා තිබුණද අමාත්‍යාංශය සතුව යතුරුපැදි 2ක් පමණක් පැවතීම හේතුවෙන් සිගාස් තොරතුරු පද්ධතියෙහි වූ තොරතුරු නිවැරදි කරගතයුතු බවට වූ නිර්දේශය. | 1.6.3(ඈ) |
| 1.2.1(vi) | අමාත්‍යාංශයට අයත් වාහන 26ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වත්කම් නිසි පරිදි ගිණුම්ගත කළ යුතු බවට වූ නිර්දේශය. | 1.6.3(ඉ) |

5

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 වියදම් කළමනාකරණය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 50(ii) ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුතුව වාර්ෂික ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව හා සම්පූර්ණයෙන් පිළියෙල කළ යුතුවේ.

(i) වැය විෂයයන් 3ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින් රු.1,120,520,122ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදන සංශෝධනය කිරීම හේතුවෙන් 2025 වර්ෂයේ මූලික ඇස්තමේන්තු නිවැරදි ලෙස පිළියෙල කර නොමැති බව නිරීක්ෂණය විය.

(ii) තාර්කික පදනමකින් ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන වෙන් කර නොගැනීම නිසා පුනරාවර්තන වැය විෂයයන් 22කට හා මූලධන වැය විෂයයන් 21කට අදාළව උපයෝජනය කළ පසු ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙළින් සියයට 40 සිට සියයට 99 අතර පරාසයක ප්‍රතිශතයකින් ඉතිරිවීම් පැවතුණි. තවද පුනරාවර්තන වැය විෂයයන් පහකට හා මූලධන වැය විෂයයන් හයකට වෙන් කර තිබූ රු.10,982,776ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### 3.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය සහ එම අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවසායකත්ව සංවර්ධන, ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලය සහ කුඩා ව්‍යාපාර සංවර්ධන යන අංශයන්හි 2025 දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු.12,111,050ක්වූ පුනරාවර්තන වැය විෂයයන් 40කට හා මූලධන වැය විෂයයන් 05කට අදාළ බැරකම්, බැරකම් ලේඛනයට සහ මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලයිස්තුවට ඇතුළත් කර නොතිබුණි.

### 3.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(අ) විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවන් තුළ සියලුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදු වන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.5 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් 05කට පිළිතුරු ලබා දී නොතිබුණි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

## 3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| | (i) මුදල් රෙගුලාසි 109 | 2023 හා 2025 අතර කාලය තුළ සිදුවූ වාහන අනතුරු 08ක් හේතුවෙන් එම වාහන අලුත්වැඩියාවන් සඳහා වැය වූ මුදල් කිසිදු පාර්ශවයකගෙන් අයකර ගැනීමට නොහැකි වීම මත අමාත්‍යාංශය විසින් දරන ලද වියදම වූ රු.1,233,854 සඳහා පොතෙන් අස්කිරීමේ නියෝග ලබා ගත යුතු වුවත් 2026 මැයි වන විටත් එම කටයුතු අවසන්ව නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 756 | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණය සිදුකර වාර්තා ඉදිරිපත්කර නොතිබුණි. |
| | (iii) මුදල් රෙගුලාසි 880 | ඇප අඬා පනතට අනුකූලව ඇප තැබිය යුතු නිලධාරීන්ගෙන් ඇප අයකර ගත යුතු වුවත් ව්‍යවසාය සංවර්ධන අංශයට අදාළ නිලධාරීන්ගෙන් එසේ ඇප ලබාගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2024 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 ඡේදය | ප්‍රසම්පාදන කළමනාකරණ අංශයක් (PMD) පිහිටුවිය යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි |
| (ඇ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | සෑම ඉන්ධන පරීක්ෂාවක් සිදුකර මාස 12ක කාලසීමාවකින් පසුව හෝ කිලෝ මීටර් 25,000 ක දුර ප්‍රමාණයක් ධාවනය කිරීමෙන් පසුව හෝ එන්ජිම සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතුරින් මුලින් යෙදෙන අවස්ථාවට පසුව නැවත ඉන්ධන පරීක්ෂාවක් කළ යුතු වුවද ජාතික එලදායිතා ලේකම් කාර්යාලයේ භාවිතා කරනු ලබන වාහන 08 සඳහා ඉන්ධන දහන පරීක්ෂාව කර නොතිබුණි. |

### 3.4 තැන්පතු

2017 වර්ෂයේ තරාපුරම් වැව ඉදිකිරීම සහ සමුපකාර සහ ගම්මාන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතීන්ට අදාළව රඳවා ගන්නා ලද රු.7,847,306ක මුදල අමාත්‍යාංශයේ තැම්පතු ගිණුමෙහි වසර අටකට වඩා වැඩිකාලයක සිට පැවති අතර සමාලෝචිත වර්ෂයේදීද එය නිරවුල් කරගැනීමට කටයුතු කර නොතිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

2025 මාර්තු 25 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමප/25/0288/802/005 අනුව අමාත්‍යාංශය යටතේ ඇති ප්‍රතිව්‍යුහගත කිරීමට නියමිත ආයතන වූ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය හා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය ඒකාබද්ධකර එක් ආයතනයක් පිහිටුවීමේ කාර්යය, ජාතික ශිල්ප සභාව, ජාතික නිර්මාණ මධ්‍යස්ථානය හා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) කාර්යක්ෂම තනි ආයතනයක් ලෙස ඒකාබද්ධ කිරීමේ කාර්යය, මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා පුහුණු ආයතනය, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ පර්යේෂණ ශාඛාව ලෙස ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ සිදු කිරීමේ කාර්යය, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය 2030 වර්ෂය වන විට රටේ අපනයන ආදායම ඇමරිකානු ඩොලර් බිලියන 45 දක්වා ළඟා වීමේදී ඇමරිකානු ඩොලර් බිලියන 28ක වෙළඳ භාණ්ඩ අපනයනය හරහා එම ඉලක්ක සපුරා ගැනීම සඳහා උපායමාර්ගික සැලසුම් සකස් කිරීම යන කාර්යයන් අවසන් කර නොතිබුණි.

#### 4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) කර්මාන්තපුර සංවර්ධනය යටතේ රජයේ ඉඩම් අක්කර 281.399ක් භාවිතා කර ක්‍රියාත්මක කිරීමට යෝජනා කරන ලද කර්මාන්තපුර 09 ක් සඳහා රජය විසින් රු.මිලියන 1,542 ක පිරිවැයක් දරා ඇතත් ඒවායේ කිසිදු කර්මාන්තයක් ආරම්භ කර නොතිබුණි.

(ආ) ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරියේ Made in Sri Lanka වෙළඳ ද්වාරය ස්ථාපිත කිරීම සඳහා 2022 හා 2023 වර්ෂවල රු.1,513,000ක් වැයකර තිබූ අතර එම වර්ෂයන්හි සැපයුම්කරුවන් 1,133ක් මෙම මෘදුකාංගය ඔස්සේ ලියාපදිංචි වී තිබුණද තාක්ෂණය යල් පැන යාම හේතුවෙන් 2026 වර්ෂය වන විට මෘදුකාංගය භාවිතා නොකරන තත්වයක් පැවතුණි.

#### 4.1.3 ව්‍යාපෘති නිම නොකර අත්හැරදැමීම

(අ) ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමින් සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත කලාප පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ ගිරාදුරුකෝට්ටේ, දිඹුලාගල, දික්වැල්ල හා ත්‍රිකුණාමලය අදියර III

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

යන කර්මාන්තපුර 4ක ඉඩම් මැනුම් කරවා ගැනීම, එළිපෙහෙළි කිරීම හා ඉඩම් කට්ටි කැඩීමේ සැලැස්ම පිළියෙල කිරීම වැනි කටයුතු සඳහා රු.3,266,558ක් 2022 වර්ෂයේ වියදම් කර තිබුණද සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘතිවල කටයුතු අත්හිටුවා තිබීම හේතුවෙන් ඒ වෙනුවෙන් දරන ලද වියදම් නිෂ්කාර්යවී තිබුණි.

(ආ) 2023 වර්ෂයේදී රු.8,383,056ක් වැයකර වැල්ලවාය කර්මාන්තපුරය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර තිබුණද 2024 හා 2025 වර්ෂයන්හී ක්‍රියාකාරී සැලසුම්වල මීට අදාළ කටයුතු ඇතුළත් කරමින් ප්‍රතිපාදන වෙන්කරගෙන නොතිබීම නිසා මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රගතියක් අත්කර ගෙන නොතිබුණි.

### 4.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

(අ) 2022, 2023 හා 2024 වර්ෂයන්හි ව්‍යාපෘතීන්හි ප්‍රගති වාර්තා පරීක්ෂා කිරීමේදී කළුතර රයිගම්පුර කර්මාන්ත පුරයෙහි ජල සැපයුම, විදුලි සැපයුම සහ ග්‍රෑන්ට්‍රිය ඉදිකිරීම සඳහා රු.472,171,865ක් වැයකර තිබුණද 2026 මාර්තු 13 දින දක්වා එම කර්මාන්ත පුරයෙහි ජල සහ විදුලි සැපයුමට අදාළ කටයුතු හා ග්‍රෑන්ට්ය ඉදිකිරීම අවසන්කර නොතිබුණි.

(ආ) රඹෑව සඳමල්ගම කර්මාන්ත පුරයෙහි ජල සහ විදුලි සැපයුම හා ප්‍රවේශ මාර්ග ඉදිකිරීම සඳහා 2025 වර්ෂයේදී රු.31,412,890ක් වැය කර තිබුණද ජල හා විදුලි සැපයුම් ලබාගෙන නොතිබූ අතර ප්‍රවේශ මාර්ගය ඉදිකිරීමද අවසන්කර නොතිබුණි. තවද කරන්දෙණිය කර්මාන්තපුරයේ මාර්ගය අළුත්වැඩියාකිරීමේ කටයුතු සඳහා 2024 වර්ෂයේ දී රු.65,987,917ක් වැය කර තිබුණද 2026 මැයි වන විටත් කාර්යය අවසන් කර නොතිබුණි.

(ඇ) අක්කර 200ක භූමි ප්‍රමාණයක් තුළ පිහිටුවීමට අපේක්ෂා කර තිබූ රයිගම කර්මාන්තපුරය සඳහා 2026 වර්ෂය වන විට ආයෝජකයන් තෝරාගෙන අක්කර 24ක පමණක් සංවර්ධන කාර්යයන් සිදුකර තිබූ අතර තවත් අක්කර 24ක් සංවර්ධනය කිරීමට තීරණය කර තිබුණි. 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා රු.මිලියන 905ක වියදම් දරා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කිසිදු ආයෝජකයෙකු කර්මාන්ත ආරම්භ කිරීමට ඉදිරිපත් නොවීම නිසා එම කර්මාන්තපුරය ආරම්භකිරීමට නොහැකිව තිබුණි.

(ඈ) 2017 වර්ෂයේ කළුතර රයිගම කර්මාන්ත හා තාක්ෂණ සංවර්ධන අධිකලාපය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුව පැවරි තිබූ සමාගම අදාල භූමියේ ගස් ඉවත් නොකිරීම, වැව්ලි සමාගම්හී විරෝධතා හා ජලමාර්ග පද්ධතිය සම්පූර්ණ නොකිරීම යන හේතු මත 2026 අප්‍රේල් වන විටත් ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කර නොතිබුණි.

9

**4.1.5 මුදල් නිදහස් කර තිබූ නමුත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

(අ) කටුනායක කර්මාන්තපුරයට අදාළව මූලික පරිසර අධ්‍යන වාර්තාවක් සැකසීමට කාර්මික තාක්ෂණ ආයතනයට 2023 වර්ෂයේදි රු.2,725,729ක්ද කර්මාන්තපුර භූමිය සම්බන්ධයෙන් ගංවතුර ව්‍යාපෘතිය පිළිබඳව අධ්‍යනයක් සිදුකිරීමට ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට 2025 වර්ෂයේදී රු.2,565,743ක මුදලක්ද ගෙවා තිබුණද 2026 මාර්තු 31 දින වන විටත් එම වාර්තා අමාත්‍යාංශයට ලැබී නොතිබුණි.

(ආ) 2025 වර්ෂයේ ව්‍යාපෘති 13ක් සඳහා රු.මිලියන 1,641.2ක් වෙන්කර එයින් රු.මිලියන 516.6ක් වියදම් කර තිබුණද, අදාළ ව්‍යාපෘතිවල කිසිදු භෞතික ප්‍රගතියක් නිරීක්ෂණය නොවුණි. තවද ව්‍යාපෘති 43ක් සඳහා රු.මිලියන 525.8ක් වෙන්කර එයින් රු. මිලියන 343.2ක් වියදම් කර තිබුණද එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ ප්‍රතිශතය සියයට 1ත් සියයට 80ත් අතර පරාසයක පැවතුණි.

(ඇ) සාම්ප්‍රදායික හා ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන වැඩසටහන යටතේ අමාත්‍යාංශය යටතට ගැනෙන ජාතික ශිල්ප සභාව විසින් 2021 වර්ෂයේ සිට 2025 දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිත ග්‍රාමීය කර්මාන්ත සඳහා අමුද්‍රව්‍ය වගා කිරීමේ වැඩසටහන වෙනුවෙන් රු.මිලියන 144.52ක් වැයකර තිබුණද අමුද්‍රව්‍ය වගා කල ස්ථාන 76න් ස්ථාන 04ක පැලවීමේ ප්‍රගතිය වාර්තා කර නොතිබීම, අමුද්‍රව්‍ය පැලවීමේ ප්‍රගතිය සියයට 0 ක් වූ ස්ථාන 18ක් පැවතීම පැලවීමේ ප්‍රගතිය ප්‍රගතිය 10ට වඩා අඩු ස්ථාන 08ක් හා පැලවීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු ස්ථාන 32ක් පැවතිම,යටියන්තොට පැලැල්ලේගම ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ ප්‍රවාහන මාධ්‍යක් භාවිතා කළ නොහැකි ස්ථානයක වේවැල් පැල 1,050ක් වගා කර පැවතීම ආදිය හේතුවෙන් ව්‍යාපෘතිය අසාර්ථකවී තිබූ අතර 2025 වර්ෂයේදී මෙම ව්‍යාපෘතිය අත්හිටුවා තිබුණි.තවද, බෙරුවල හිරිගල්ගොල්ල පුහුණු මධ්‍යස්ථානය අවට ප්‍රදේශයේ ඇති දුනුකෙයියා වගාව නඩත්තු නොකිරීම හේතුවෙන් අසාර්ථක වී තිබුණි.

(ඈ) මිල්ලෑව කර්මාන්තපුරයෙහි වැසි ජල කාණු පද්ධතිය ඉදිකිරීමේදී පෞද්ගලික ඉඩමකින් අවසන් වීම කාණු පද්ධතිය හේතුවෙන් පෞද්ගලික ඉඩම් හිමියා කාණුව අවහිර කිරීම මත මේ සඳහා දරන ලද රු.මිලියන 30ක වියදම නිෂ්කාර්ය වී තිබුණි.

(ඉ) බටඅත, ත්‍රිකුණාමලය, බුත්තල, අම්පාර, ඇඹිලිපිටිය සහ රයිගම කර්මාන්තපුරයන්හි පරිපාලන ගොඩනැගිලි 3ක් සහ නිලධාරි නිවස්නයන් 3ක් නිශ්කාර්යව පැවතීම නිසා එම ගොඩනැගිලි වෙනුවෙන් වැය කරන ලද රු.මිලියන 164.9ක් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

**4.1.6 වාර්ෂික කාර්යසාධන වාර්තා**

2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 61(4) උප වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 180ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතු අතර 2018

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතු වේ. එසේ වුවද අමාත්‍යාංශය යටතේ ඇති ලංකා සිමෙන්ති සමාගමේ සහ සී/ස හිඟුරාන සීනි කර්මාන්ත සමාගමේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ තොරතුරු විගනණයට ඉදිරිපත් නොවූ අතර ආයතන 9ක් 2022 වර්ෂයේද ආයතන 14ක් 2023 වර්ෂයේද සහ ආයතන 24ක් 2024 වර්ෂයේ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදනයන්**

2025 හා 2026 වර්ෂ සඳහා නව ආරක්ෂක සේවාවක් ලබා ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශ මත ලංසු ඇගයීමෙන් පසු අවම වාර්ෂික මිල වූ පිළිවෙළින් රු.17,604,000ක හා රු.18,836,280ක මිල ගණන් ඉදිරිපත් කර තිබූ සමාගමක් වෙත ප්‍රසම්පාදනය පිරිනැමීමට ප්‍රසම්පාදන කමිටුව විසින් අනුමත කර තිබුණද අමාත්‍යාංශයේ වපසරිය වෙනස්වීමට ඉඩ ඇති බව සඳහන් කරමින් එම ප්‍රසම්පාදන තීරණය ක්‍රියාත්මක කර නොතිබුණි. අනතුරුව මිල ගණන් ඉදිරිපත් කර නොතිබූ, 2024 වර්ෂයේදී අමාත්‍යාංශය සඳහා ආරක්ෂණ සේවාව සපයන ලද පෞද්ගලික ආයතනය වෙතින් නැවත මිල ගණන් ලබාගෙන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියකින් තොරව 2024 දෙසැම්බර් 30 දින රු.15,249,600ක වැට් රහිත වාර්ෂික වටිනාකමකට කොන්ත්‍රාත්තුව එම පෞද්ගලික ආයතනයට පිරිනමා තිබුණි. එහිදී 2025 ජනවාරි 01 දින සිට 2025 දෙසැම්බර් 31 දින දක්වා ගිවිසුම් ගතවීමකින් තොරව හා කාර්යසාධන සුරක්ෂණයක් ලබාගැනීමකින් තොරව ආරක්ෂක සේවාව ලබාගෙන තිබුණි. ආරක්ෂක සේවාව සඳහා 2024 වර්ෂයේ එළඹි ගිවිසුම අනුව සතියේ දිනයන්හි දහවල් වරුවේ ආරක්ෂක නිලධාරින් හත් දෙනෙකු සේවයේ යෙදවිය යුතු බව දක්වා තිබුණද ඊට අඩු ආරක්ෂක නිලධාරින් සංඛ්‍යාවක් සේවයේ යොදවා තිබුණ ද ඒ සම්බන්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**4.3 වත්කම් කළමනාකරණය**

(අ) කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන , අහෝසි වී ගිය අමාත්‍යාංශ කිහිපයකට හා වෙනත් ආයතන කිහිපයකට අයත් රු.මිලියන 665.4ක් වටිනා වාහන 69ක් හා රාජ්‍ය කලමනාකරණ ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති දීර්ඝ කාලයක සිට ජාතික එලදායිතා ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලබන වාහන 02ක සහ නගර සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති වසර 05ක සිට ව්‍යවසාය සංවර්ධන අංශය විසින් භාවිතා කරනු ලබන වාහනයක අයිතිය 2025 දෙසැම්බර් 31 දින වන විටත් අමාත්‍යාංශය වෙත පවරා ගෙන නොතිබුණි.

(ආ) අමාත්‍යාංශය සතු වාහනයක් අනතුරක් හේතුවෙන් 2023 ජූනි 06 දින අළුත්වැඩියා සඳහා ගරාජය වෙත යොමු කර මාස 32ක් ගත වී තිබූ නමුත් අදාළ අළුත්වැඩියා කටයුතු අවසන් කර අමාත්‍යාංශය වෙත ලබා ගෙන නොතිබුණි.

(ඇ) එකතු වටිනාකම රු.183,100,000ක් වූ අමාත්‍යාංශයට අයත් වාහන 12ක් හා වෙනත් ආයතනවලට අයත් වාහන 10ක් 2015-2025 අතර කාලය තුළ අමාත්‍යාංශය යටතේ

පවතින වෙනත් ආයතනවලට ලබාදී තිබුණද ඒවායේ අයිතිය පවරා දීමට කටයුතු නොකිරීම නිසා එම වාහන 22 සඳහාම සමාලෝචිත වර්ෂයේ රක්ෂණ වියදම් ලෙස රු.579,648ක් අමාත්‍යාංශයට දැරීමට සිදුවී තිබුණු අතර එම මුදල වාහන භාවිතා කරන ආයතනවලින් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි.

**4.4 පාඩු හා හානි**

(අ) ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයේ 2022 හා 2024 වර්ෂවල සිදුවූ වැටුප් වංචාවකට සහ ලැප්ටොප් පරිගණකය අස්ථානගතවීමකට අදාළව වූ හානි හා පාඩු සඳහා රු.1,884,177ක මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2025 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් පාඩු හා අත්හැරීම් පිළිබඳ ප්‍රකාශනය තුළ මු.රෙ. 106 හා මු.රෙ. 113 යටතේ වන පාඩු පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂය තුළ අලාභ අය කර ගැනීම/කපාහැරීම/ අත්හැරීම පිළිබඳ ප්‍රකාශනය යටතේ රු.25,000ට අඩු සිද්ධි 1ක් සඳහා රු.20,134ක වටිනාකමක් සඳහන් කර තිබූ නමුත් පාඩු හා අත්හැරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු ප්‍රකාරව එම ශේෂය සිද්ධි 3ක් සඳහා එකතුව රු.42,134ක් වීම නිසා රු.22,000ක වෙනසක් පැවතුණි. තව ද රු.25,000ට වැඩි සිද්ධි 5 ක් සඳහා රු.832,541ක් සඳහන් කර තිබූ නමුත් පාඩු හා අත්හැරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු ප්‍රකාරව එම ශේෂය සිද්ධි 11 සඳහා රු.1,917,026ක් වීම නිසා රු.1,084,485ක වෙනසක් පැවතුණි.

(ඇ) උක්ත ප්‍රකාශනයේ තවදුරටත් අය කර ගැනීමට හෝ කපා හැරීමට හෝ අත්හැරීමට ඇති පාඩු පිළිබඳ ප්‍රකාශනය යටතේ රු.25,000ට වැඩි සිද්ධි 6 ක් සඳහා එකතුව රු.1,973,729ක් සඳහන් කර තිබූ නමුත් පාඩු හා අත්හැරීම් පිළිබඳව විගණනයට ඉදිරිපත් කර තිබූ තොරතුරු ප්‍රකාරව එම වටිනාකම සිද්ධි 6ක් සඳහා රු.2,284,229ක් වීම නිසා රු.310,500ක වෙනසක් පැවතුණි.

(ඈ) අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ මු.රෙ.110 ප්‍රකාරව පවත්වාගෙන යා යුතු පාඩු හා අලාභ හානි ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

**4.5 විගණන විමසුම්වලට පිළිතුරු ලබා නොදීම**

2025 මූල්‍ය වර්ෂයට අදාළව අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ පහත සඳහන් විගණන විමසුම් සඳහා 2026 ජුනි 30 වන විටත් පිළිතුරු ලබාදී නොතිබුණි.

| විගණන විමසුම් අංකය | නිකුත් කල දිනය |
|---|---|
| IMT/E/MOI/C/2025/13 | 2025.12.19 |
| IMT/E/MOI(NPS)/2/C/2025/17 | 2026.02.13 |
| IMT/E/MOI/02/A/2025/20 | 2026.03.30 |
| IMT/E/MOI/02/B/2025/22 | 2026.04.08 |
| IMT/E/MOI/02/D/2025/25 | 2026.05.14 |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

### 4.6 කළමනාකරණ දුර්වලතා

(අ) ජාතික එළදායිතා ලේකම් කාර්යාලය විසින් 2015 වර්ෂයේ රු.1,465,200ක වියදමක් දරා මිලදී ගෙන තිබූ ebreeze පරිගණක මෘදුකාංගයෙහි පාරිභෝජන ද්‍රව්‍ය ලේඛණය පරිගණක මෘදුකාංගයක් මගින් පවත්වා ගැනීමට පහසුකම් සලසා තිබුණද එම මෘදුකාංගය භාවිතා කර නොතිබුණි.

(ආ) "ක්‍රියාකාරී මට්ටමේ නොමැති රාජ්‍ය ව්‍යවසායන් වසා දැමීම සඳහා ඈවරකරුවන් පත්කිරීම" සම්බන්ධයෙන්වූ 2025 සැප්තැම්බර් 03 දිනැති අංක අමප/25/1570/804/185 අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව අමාත්‍යාංශය යටතේ පවතින ලංකා සිමෙන්ති සමාගම, සීමාසහිත හිඟුරාන සිනී කර්මාන්ත සමාගම, කන්තලේ සීනී කර්මාන්තායතනය, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය ප්‍රාග්ධන සමාගම, කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසාය අධිකාරිය, දැව ආශ්‍රිත නිර්මාණ මධ්‍යස්ථානය, සීමාසහිත කහගොල්ල ඉංජිනියරින් සර්විස් සමාගම, ලංකා ටෙක්ස්ටයිල් මිල්ස් එම්පෝරියම් ලිමිටඩ් හා ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව යන ආයතන ඈවර කිරීමට කටයුතු කළයුතු වුවත් 2026 මැයි 31 දින වන විටත් ඒ සඳහා පියවර ගෙන නොතිබුණි.

(ඇ) 1994 වර්ෂයේදී කන්තලේ සීනී කර්මාන්ත ආයතනයේ මෙහෙයුම් කටයුතු අවසන් කර ඇති අතර වර්තමානයේ එහි රැඳී සිටින අනිවාර්ය විශ්‍රාමයාම් වයස වන අවුරුදු 60 ඉක්මවූ සේවකයින් 32ක් වෙත වැටුප් හා දීමනා ගෙවීම ඇතුළු අනෙකුත් පරිපාලන හා පොදුකාර්ය වියදම් වශයෙන් මාසිකව රු.මිලියන 1.7ක නිෂ්කාර්ය වියදමක් දරමින් වසර 30 කට අධික කාලයක් පවත්වාගෙනගොස් තිබූ අතර ආයතනය ඈවර කිරීමට 2026 මැයි 31 දින වන තෙක් කටයුතු කර නොතිබුණි.

(ඈ) අමාත්‍යාංශ ගොඩනැඟිල්ලට යාබද මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමේදී කොන්ත්‍රාත්කරුගේ දෝෂයන් හේතුවෙන් 2024 අප්‍රේල් 09 දින අමාත්‍යාංශයේ කාණු පද්ධතිය අවහිර වී අමාත්‍යාංශයේ ප්‍රතිව්‍යුහගතකරණ අංශය ජලයෙන් යටවී තිබුණු අතර මේ හේතුවෙන් සිදුවූ අලාභය රු.821,286 ක් බවට සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) විසින් තක්සේරු කර තිබුණි. මෙම අලාභය ගෙවීමට මාර්ගය ඉදිකිරීම් ආයතනය එකඟවී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

.(ඉ) කර්මාන්තකරුවන් වෙත කර්මාන්තපුර ඉඩම් වෙන්කිරීමේදී නිකුත් කරනු ලබන ඉඩම් වෙන්කිරීම් ලිපියට අනුව ඉඩම් වෙන්කිරීමෙන් පසුව අවුරුදු 35ක කාලයකට බදු ගිවිසුමක් අත්සන් කළයුතු වුවද කර්මාන්තපුර 30ක කර්මාන්තකරුවන් 301ක් සමඟ බදු ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ඊ) දිට්වා සුළිකුණාටුව හේතුවෙන් ආපදාවට ලක්වූ කර්මාන්තකරුවන් 34,501ක් අතුරෙන් අමාත්‍යාංශය යටතේ ඇති කිසිදු ආයතනයක හෝ අංශයක ලියාපදිංචි වී නොතිබූ දිස්ත්‍රික් මට්ටමින් තෝරාගත් කර්මාන්තකරුවන්ගෙන් 8,752කට ගෙවීම් කිරීමට නිර්දේශ වී 7,924 දෙනෙකු තෝරාගෙන තිබුණි. ඒ අතුරින්, 2026 මාර්තු 31 දින වන විටත් කර්මාන්තකරුවන් 4,207කට පමණක් ගෙවීම්කර තිබුණි.

(උ) ගොඩනැගිලි ඉදිකර වසර 05කට අධික කාලයක් ගත වුවද කර්මාන්තපුර 08ක කර්මාන්තකරුවන් 15 දෙනෙකු සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් නිෂ්පාදන කටයුතු ආරම්භ කර නොතිබුණි. තවද, 2025 දෙසැම්බර් 31 දින වන විට කර්මාන්තපුර 17ක කර්මාන්තකරුවන් 77කගෙන් හිඟ බදු මුදල් ලෙස රු.156,704,970ක වටිනාකමක් අයවීමට පැවතුණි.

(ඌ) වැලිඔය, මන්නාරම සහ කප්පල්තුරෙයි කර්මාන්තපුරයන්හි වාර්ෂික තක්සේරු කුලිය රු.25,536,000ක් වූ කර්මාන්තශාලා ගොඩනැගිලි සකස් කර කර්මාන්තකරුවන් වෙත ලබාදී තිබුණු අතර එම ගොඩනැගිලිවල අදාළ කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(එ) විදේශ සම්පත් දෙපාර්තමේන්තුව හරහා ලැබෙන විදේශ පුහුණු හා සංචාරයන් සඳහා එම දෙපාර්තමේන්තුව විසින් නියම කර තිබූ වයස් සීමාව ඉක්මවූ නිලධාරීන් 12ක් 2024 සහ 2025 වර්ෂවල සහභාගී කරවා තිබුණි.

(ඒ) ඒකල කාර්මික ජනපදයේ හානිවූ පැති බැම්ම ඉදිකිරීම සඳහා 2022 වර්ෂයේදී රු.මිලියන 6.6ක් වැයකර තිබුණද එම කාර්ය අවසන්කර ඇති බවට විගණනයට තහවුරු නොවීය.

(ඔ) කර්මාන්තපුර 23ක ඉඩම් අක්කර 96 යි රූඩ් 15යි පර්චර්ස් 594.86ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිෂ්කාර්යව පැවතුණි.

එම්.ඩී.සුදර්ශණී අමරතුංග
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.